## 2026.01.13 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ.
## සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව.

මෙදින පෙ.ව 9.30 ට සාමාන්‍ය මහා රැස්වීම ආරම්භ වු අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.

| අනු අංක | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා | ගරු සභාපති |
| 02. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 03. | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 08. | ගරු මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සභික |
| 09. | ගරු මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 10. | ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා | සභික |
| 11 | ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 12 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 13 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සභික |
| 14 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභික |
| 15 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය | සභික |
| 16 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා | සභික |
| 17 | ගරු මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 18 | ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා | සභික |
| 19 | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 20 | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 21 | ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 22 | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 23 | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 24 | ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 25 | ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා | සභික |
| 26 | ගරු මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 27 | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සභික |
| 28 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 29 | ගරු මන්ත්‍රී පී.මාලින්ද  මුදන්නායක් මැතිතුමා | සභික |
| 30 | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 31 | ගරු මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |
| 32 | ගරු මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා | සභික |
| 33 | ගරු මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා | සභික |
| 34 | ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා | සභික |
| 35 | ගරු මන්ත්‍රිනී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය | සභික |
| 36 | ගරු මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා | සභික |

01.ඩී.බී.මනොජ් තිවංක මයා සභාවේ ලේකම් ලෙස සහභාගී විය.

**සභාපතිතුමා :-**
සියලු ම දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් 2026 වර්ෂය සියලුම මන්ත්‍රීතුමන්ලාට හා මන්ත්‍රීවරියන්ට, ඒ වගේ ම මේ ස්ථානයේ ඉන්නලේකම්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයට, ඒ වගේ ම අපේ මාධ්‍යවේදී සහෝදර හිතවතුන් සියලු දෙනාටම ලැබුවා වූ නව වසර ඉතාමත් ම සාර්ථක නිදුක් නිරෝගී සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.ඒ වගේ ම අපේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ අප සියලුදෙනාටම ලොකු වගකීමක් තිබෙනවා 2026 වසරේ සිදු කිරීමට.මේකෙ මුහුකුරා ගිය අය ඉන්නේ. මේක අපි හරි තැනකට ගන්න ඕන අපේ අත්දැකීම් එක්ක,අපි පහුගිය මාස 06 තුළත්, ඇත්තට ම මේ වැඩ සඳහා ඔවුන් නන් අයුරින් උදව් උපකාර කළා.වැරදි දේවල් පෙන්වලා දෙන්න ඕන.ඒකට තමා විපක්ෂයක් ඉන්නේ.ඒකටත් බොහොමත් ම ස්තුතියි.අපේ මන්ත්‍රී කණ්ඩායමටත් බොහොමත් ම ස්තුතියි.අපිට තීරණාත්මක වර්ෂයක් එන්නේ. එහිදී අපි බලාපොරොත්තු වෙනවා ලොකු සංවර්ධනයක් ඇහැලියගොඩ.ආණ්ඩු පක්ෂයද නැද්ද කියලා ප්‍රශ්නයක් නැහැ.සභාව දියුණු වෙනවා නම්,නගරය දියුණු වෙනවා නම්,අපේ කලාපය දියුණු වෙනවා නම් අපි සියලු දෙනාටම එහි ගෞරවය හිමි වෙනවා.මේ වන විටත් අපි අවුරුදු ගාණක් කරපු අය.මංමාවත් ඒගොල්ලො හදල තිබුණ ඒවනේ.අපි ම හදපුව නෙමේනේ.අපි ඒව වැඩි දියුණු කිරීමක් තමයි සිදු කරන්නේ.අපෙන් පස්සේත්, අපි කරන හොඳ දේවල්, අපි හදන මං මාවත් අපි කරන සංවර්ධනය ඊළඟ අයටත් ඒක දිගටම කර ගෙන යන්න රුකුලක් වෙනවා.ඒ සඳහාත් සහභාගී වෙන්න.සහයෝගය දක්වන්න කියා ඉල්ලා සිටිමන්.අපි සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීමටයි සූදානම් වන්නේ.

**සභාපතිතුමා :-**
අද දින අපගේ මහ සභාවේ න්‍යාය පත්‍රයට යන්න කලින් අපේ මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් සිටගෙන ඉන්නවා. එම නිසා, අපි මේව සම්බන්ධව දන්න අය ඉන්නවා. 1987 අංක 15 දරණ පනත අනුව, රීතිවලට අනුව තමයි අපි මෙම වැඩ කටයුතු සිදුකරගෙන යනු ලබන්නේ.එම නිසා ක්‍රම දෙකයි තිබෙන්නේ.හොඳට අහගන්න. එකක් තමයි අපි මාස හයක් මෙම වැඩ කටයුතු සිදු කලානේ.ගිය මාසෙ හැරුණු විට ඊට කලින් මාස වල තිබුණ විදිහට මන්ත්‍රීතුමන්ලා වාඩි වෙලා මෙම වැඩ කටයුතු සිදුකරගෙන යන්න පුළුවන්.එහෙම නැත්නම්, දෙවනි එක රීතිවල තියෙනවා.ගැසට් පත්‍රයේ තියෙනවා.ඒ අනුව ජ්‍යෙෂ්ඨත්වය සහ ගැසට් පත්‍රයේ තියෙන පිළිවෙලට අපි වාඩි කරවනවා. එමනිසා මේ දෙක තීරණය කළ යුතුයි. ඒ නිසා මහා සභාව කාරක සභාවක් බවට පත් කරමු ද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට මා යෝජනා කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට පත්විය.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීමට මා යෝජනා කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රිවරුනි, මන්ත්‍රිවරියනි මේ මහා සභාව පෙ.ව.10.30 දක්වා පැය භාගයක් කල් තැබීමට මා යෝජනා කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
සභාව කල් දැමීමෙන් පසු නැවත මහා සභාවේ වැඩ කටයුතු පෙ.ව.10.30 ට ආරම්භ කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සියලු දෙනාටම සුභ නව වසරක් ප්‍රාර්ථනා කරනවා.මෙම ගැටලුව දුරදිග ගෙනි යන්න අවශ්‍ය නැහැ.අපි දෙපාර්ශවයම ඇහැලියගොඩ ප්‍රදේශයේ ජනතාවට යම් සේවයක් සිදුකිරීමටයි ඇවිත් ඉන්නේ.ඒවා කරගෙන යනකොට යම් යම් ගැටළු මතු වෙනවා. ඒ ගැටළු වලට අපි ඒ ඒ අවස්ථාවල තමා යම් යම් තීන්දු තීරණ ගන්න වෙන්නේ.දේශපාලනයේ හැටි එහෙම තමයි. ගරු සභාපතිතුමනි, අපි විපක්ෂයක් ලෙස තීන්දුවක් ගත්තා. අනෙක් කරුණ තමයි,අපි ඒ තීන්දුව ගත්තට පස්සේ අපි ඒ තීන්දුවේ ඉන්නවා.ඒකෙ වෙනසක් කරන්න බැහැ.අපි කණ්ඩායමක් ලෙස තමයි අපි ඒ තීන්දුව ගත්තේ.සභාවේ ඔබතුමා පළමුව ආසන පනවපු විදිහට ඒ දෙන්නගෙ ගැටලු විසදලා, එකඟයි. කිසිම ප්‍රශ්නයක් නැහැ.අපේ අදහස තමයි.අපේ ලේකම්තුමා කිව්වා වගේ,මේ රීතිවල 06වන පිටුවෙහි තියෙනවනේ "ප්‍රාදේශිය සභාවේ සභිකයින්ගේ ජ්‍යෙෂ්ඨත්වය පළමුව සභාපතිවරයාද, දෙවනුව උප සභාපතිවරයාද,නැවත තෝරා පත් කර ගනු ලැබූ හිටපු සභිකයින් සම්බන්ධයෙන් වනවිට සභාවේ ඔවුන්ගේ අඛණ්ඩ සාමාජිකත්වය අනුපිළිවෙළ අනුව ද, ඊළඟට සභිකයින් ඔවුන්ගේ නම් තෝරා පත් කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිසේග් ප්‍රකාශයෙහි ඇති ප්‍රමුඛත්වය අනුපිළිවෙළද සැලකිල්ලට ගත යුතුය" කියලා තියෙනවනේ.ඒතකොට ඒ කාරණාව මත, ඒක

ලේකම්තුමත් අවශ්‍ය නම් පැහැදිලි කරන්න කාරක සභාවක් බවට පත්කරගෙන.අපි සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ප්‍රශ්නය මෙතනින් ඉවර කරමු.එතකොට අපි මේ 36 දෙනාගෙන් ගත්තහම මම තමයි මෙතන ඉන්න 2011 වසරේ සිට පත්වී සිටින සභිකයා.ඊ ළඟට 2018 වසරේ අපේ ගරු උප සභාපතිතුමයි,දිලීන් මන්ත්‍රීතුමයි පත්ව සිටිනවා.ඊළඟට අපේ රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමත් 2018 වසරේ පත්වෙලා මන්ත්‍රීවරයෙක් ලෙස වසර 1 ½ක් 2ක් මේ ගරු සභාවේ දේශපාලන කටයුතු සිදු කළා. එවිට මම ඔබතුමාගෙන් සරල කාරණාවක් ඉල්ලන්නේ. අපි ඔබතුමාටත් එකඟයි.උපසභාපතිතුමාටත් එකඟයි.සියලු දෙනා එක්ක ප්‍රශ්න ඇති කර ගන්නෙ නෑ.එතකොට ඒ රීති අංක 06 අනුව අපේ අදහස තමා, අපේ විපක්ෂය ගත්තු තීන්දුව තමයි මම මෙම පුටුවේ වාඩි වෙනවා. දිලීන් මන්ත්‍රීතුමා ඊලඟ පුටුවේ වාඩි වෙනවා.ඊළඟ සභාවේ හතර වෙනියා තමා රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා.ඒකට මං හිතන්නේ කට්ටිය ම එකඟ වෙයි. රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා 03වන පුටුව දීල අනිත් දෙන්නගේ, ගරු සභාපතිතුමා තීන්දුවක් ගන්න.ඒකට අපි සභාපතිතුමාගේ තීන්දුවට එකඟයි .අපිට ඒ 03වන පුටුව අවශ්‍යයි රංජිත් වික්‍රමසිංහ මැතිතුමාට.ඒක තමා අපේ යෝජනාව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, 06 වන පිටුවේ තිබෙනවා ප්‍රමුඛස්ථ අනුපිළිවෙල ඒ අනුව "ප්‍රාදේශිය සභාවේ සභිකයින්ගේ ජ්‍යෙෂ්ඨත්වය පළමුව සභාපතිවරයාද, දෙවනුව උපසභාපතිවරයාද,නැවත තෝරා පත් කර ගනු ලැබූ හිටපු සභිකයින් සම්බන්ධයෙන් වනවිට සභාවේ ඔවුන්ගේ අඛණ්ඩ සාමාජිකත්වය අනුපිළිවෙළ අනුව ද" ආයෙත් කියන්නම් "සභාවේ ඔවුන්ගේ අඛණ්ඩ සාමාජිකත්වය අනුපිළිවෙළ අනුව ද ඊළඟට සභිකයින් ඔවුන්ගේ නම් තෝරා පත් කර ගැනීම පිළිබඳව මැතිවරණ කොමසාරිසේග් ප්‍රකාශයෙහි ඇති ප්‍රමුඛත්වය අනුපිළිවෙල ද සැලකිල්ලට ගත යුතුය" රජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමාව ඉතාම අවාසනාවන්ත ලෙස පක්ෂයෙන් එතුමාව අයින් කරනවා ගියපාර .එවිට එතුමාගේ අඛණ්ඩ සාමාජිකත්වය පිළිබඳව ප්‍රශ්නයක් එන්නේ.නැත්තන් අපි අනිවාර්යයෙන් ම එතුමාගේ ඉල්ලීමක් තිබුණා, එතුමාගේ කණ්ඩායම නම් කරපුවහ ම පස්සේ, මාසයක් දෙකක් පහු වෙලා.එතුමාගේ තදබල ඉල්ලීමක් තිබුණා එතුමාට මේ පුටුව ලබාදෙන්න කියලා.අපි ඊට පස්සේ කොමසාරිස්තුමත් එක්කත් කථා කළා. අපිට ඒක එතුමට දෙන්න බැහැ.ඇත්තට ම මම ඒකට මැදිහත් වුණා.ඔබතුමා ඒක දන්නවා හොඳාකාරවම.මම ලේකම්තුමා එක්ක කතා කළා, කොමසාරිස්තුමා එක්ක කතා කළා.කෙසේ වෙතත් නීතිය නම් නීතිය.ඒ නිසා දැන් එතුමා පත් වෙලා තියෙන්නේ නවක මන්ත්‍රීවරයෙක් විදිහට.කරන්න දෙයක් නැහැ.එතුමන්ලාගේ පක්ෂයේ තීන්දුව, මාසෙකට කලින් නම් කරලා තිබුණා නම් මුලින් එන්නේ රංජිත් මන්ත්‍රීතුමා ඊට පස්සේ ඒ අනුව අනෙකුත් මන්ත්‍රීතුමන්ලා පිළිවෙල හැදෙන්නේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි ඒක පිළිගන්නවා.අඛණ්ඩ කියලා තියෙනවානේ. අපි මේ තිස් හය දෙනාගෙන් මමයි දිලීන් මන්ත්‍රීතුමයි,උපසභාපතිතුමයි අයින් වුණා ම, අපේ ඉන්න අනිත් සහෝදර මන්ත්‍රීතුමන්ලාගෙනුත් ඊළගට ඉන්නේ රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමානේ.අඛණ්ඩ සාමාජිකත්වය පැත්තනිකින් තියන්කෝ.(ඝෝෂාව)

**සභාපතිතුමා :-**
මම කියන්නේ මේක නීත්‍යානුකූලව කරන්න වෙනවා. මෙහෙම කරන්න බැහැ.මං පටන් ගන්නකොට ම කිවුවනේ, ක්‍රම දෙකයි තියෙන්නේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
මම බොහොම සාධාරණ කථාවක් කරන්නේ මේ. (ඝෝෂාව) එවිට දැන් සභාපතිතුමා කිවුව පරිදි මමයි දිලීන් මන්ත්‍රීතුමයි එනවා මේ පුටුවට.අපිදෙවෙනි පුටුවයයි තුන්වෙනි පුටුවයි පාවිච්චි කරනවා.එවිට හතරවෙනි පුටුව දෙන්න ඕනි රංජිත් වික්‍රමසිංහ මන්ත්‍රීතුමාට (ඝෝෂාව)

**සභාපතිතුමා :-**
සුජීව මන්ත්‍රීතුමා ඔබතුමා නීති හොඳට දන්න මන්ත්‍රී කෙනෙක්නේ.ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්නේ.අඛණ්ඩ සාමාජිකත්වය කියලා මෙතන තියෙනවනේ. (ඝෝෂාව) ඒකට අපි එකඟ වෙන් නෑ.නීතිය අර විදිහ ම තමා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
අපි මේ ප්‍රශ්නයට උත්තරයක්නේ හොයන්නනේ.

**සභාපතිතුමා :-**
ප්‍රශ්නයට උත්තරයක් එන්නෑ ඔහොම ගරු මන්ත්‍රීතුමා.ඒකනේ මම උදේ ම කිවුවේ, ක්‍රම දෙකයි තියෙන්නේ. (ඝෝෂාව)

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සද්භාවයෙන් කතා කරනව නම් විපක්ෂයේ ඔය ඉස්සරහ පුටුවක් කලින් රංජිත් මන්ත්‍රීතුමාට දෙන්න තිබුණනේ. (ඝෝෂාව)

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සුජීව මන්ත්‍රීතුමා, ඔබතුමා ජ්‍යෙෂ්ඨ ම මන්ත්‍රීතුමානේ මේකේ.මමත් මන්ත්‍රීවරයෙක් මන්ත්‍රීතුමා.ඔබතුමා තව කෙනෙක් එක්ක මාව මාරු කරන එක කැතයි කියලා හිතෙන් නැද්ද

මන්ත්‍රීතුමා.(සෝෂාව) මමත් පක්ෂයේ මන්ත්‍රීවරයෙක්.ඔබතුමත් පක්ෂයේ මන්ත්‍රීවරයෙක්.මමත් ඇවිත් ඔබතුමාට වෙන තැනකට යන්න කිවුවොත් ඒක කොච්චර කුමන්ත්‍රණයක්ද?පරණ විදිහට නම් ඒක එහෙම.නැත්තම් නීතියක් තියෙනවනේ , ඒ විදිහට ක්‍රියාත්මක කරමු.අපි මේ ඇහැලියගොඩ මිනිස්සු, උදේ සවස හමුවෙන මිනිස්සු.(සෝෂාව)

**සභාපතිතුමා :-**
මේ වෙලාවේ මම උපසභාපතිතුමාට බලය පවරනව, මේ වැඩේ කරන්න.මන්ත්‍රීතුමන්ලා උපසභාපතිතුමාට උදව් කරන්න මේ වැඩේ කරන්න. (සෝෂාව)

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සුජීව මන්ත්‍රීතුමා, මේක සද්භාවයෙන් කරන යෝජනාවක්.ඔයගොල්ලෝ කියනවනේ ඔය දෙන්නා ළඟට ජොෂ්ඨ රංජිත් මන්ත්‍රීතුමා කියලා.අර දෙන්නත් පක්ෂ දෙකක නායකයෝ දෙන්නෙක්නේ.ඒ දෙන්නා තියලා ඔයගොල්ලන්ගේ තුන්වැනි පුටුවට දාගන්න රංජිත් මන්ත්‍රීතුමා. (සෝෂාව)

**සභාපතිතුමා :-**
පෙ.ව 10.45 වෙලාව, ඉක්මනට උදවු කරන්න.ඔයාල අපෙන් ඉල්ලුවා පැය භාගයක්, අපි පැය භාගයක් දුන්නා. (සෝෂාව) සුමිත් මන්ත්‍රීතුමා, අජන්ත මන්ත්‍රීතුමා එන්න ඉඳගන්න. (සෝෂාව) අපි මුලින් හිටපු විදිහට ඉඳගන්න එහෙනම්. (සෝෂාව)

**සභාපතිතුමා :-**
ගරු සභාවෙන් අවසරයි.දැන් වෙලාව පෙ.ව 10.52 යි. (සෝෂාව) සියලුම මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. සියලු දෙනාටම බොහොමත්ම ස්තුතියි.අද අපිට ප්‍රමාද වෙලා තමයි පටන් ගන්න සිදු වුණේ. අපි මුලින් ම මහා සභාව කාරක සභාවක් බවට පත් කරලා. සාකච්ඡාවක් තියලා .පසුව නැවත වතාවක් සභාව කල් දාල ඊට පස්සේ අපි නැවත වතාවක් මහ සභාවක් බවට පත්කරලා සියලු දෙනාගේ ඒකමතික තීරණයක් අරන් තියෙනවා, සම්මුතියකින් දැන් සියලු දෙනා ම මේ විදිහට කැමතියිනේ.ඒ නිසා දැන් මෙතැන් සිට සභාවේ කටයතු ආරම්භ වෙනවා. ඒ වගේ ම මම නැවත වතාවක් සියලුම දෙනාට ස්තුතිවන්ත වෙමින් දැන් සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීමටයි සූදානම් වෙන්නේ.මම කලින් කිවුවා වගේ සියලු දෙනාටම උදාවූ නව වසර සුභ නව වසරක් වේවා කියමින් ප්‍රාර්ථනා කරමින්,අපි සභාවේ වැඩ කටයුතු ආර්මභ කරමු.මේ පොඩි ගැටලුවට සියලු දෙනාම අවසානයේ ඒකමතිකව තීරණයක් ගත්තා. සියලුම දෙනාට මම ස්තුති වන්ත වෙනවා.අපෙන් පස්සෙත් මේ සභාව තියෙන්න ඕනේ.මේ සංවර්ධනය වෙන්න ඕනේ.ආණ්ඩු පක්ෂය විපක්ෂයට එනවා.විපක්ෂය ආණ්ඩු පක්ෂයට එනවා.ඒ නිසා පක්ෂ විපක්ෂයකින් තොරව සංවර්ධන යෝජනා වලට සාධාරණ යෝජනාවලට කවුරුත් ඒකමතිකව අපට උදව් වෙනවා. අනිත් ඒවට තමන්ගේ අනන්‍ය දේශපාලන මතයක් තියෙනවා.ඒ අනුව තමන්ගේ අදහස් ප්‍රකාශ කරනවා. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ.ඒකට ගරු කරනවා .හැබැයි තම තමන්ගේ පුද්ගලික චරිත වලින් අපි වැළකිලා, අපි දේශපාලනය කරමු. කියමින් අපි අලුත් අවුරුද්දේ වැඩ පටන් ගනිමු.

**සභාපතිතුමා :-**
ප්‍රථමයෙන් ම තිබෙන්නේ පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

**01.පසුගිය සභා වාර්තා සම්මත කිරීම.**
**01.01.**2025-12-09 වනදිනපැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සභා සම්මත කිරීමටයෝජනා කරමි**.**

**සභාපතිතුමා :-**
සංශෝධන තිබෙනවා නම් මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025-12-09 වන දින සාමාන්‍ය මහා සභා වාර්තාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව2025-12-09 වනදිනපැවති සාමාන්‍ය මහා සභා වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**02. සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**
පළාත් පාලන ආයතන සතු වෙළඳපොල, සතිපොළ,දිනපතා පොළ,කඩ කාමර, විවිධ කඩ කාමර බදු දීම හෝ කුලියට දීම.

පළාත් පළාන කොමසාරිස්ගේ CLG/LG-5/3/1 – (IV වෙළුම) දරණ 2026.01.01 ලිපිය මෙහිදී සභාවට ඉදිරිපත් කරන්නට යෙදුණි.

**සභාපතිතුමා :-**
**03. මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා ඇති ලිපි සභාගත කිරීම.**
කිසිවක් ලැබී නැත.සියලු දෙනා ම අද පැමිණ සිටිනවා.

**සභාපතිතුමා :-**
**04.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**05.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**

**06. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**සභාපතිතුමා :-**

06.01.සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**

**06.01.ඇහැලියගොඩ හිඳුරංගල හරහා කිරිඇල්ල දක්වා දිවෙන මාර්ගයේ 14/3 බෝක්කු අසලින් පහළට ගමන් කරන කාණුව සැකසීම සඳහා අවශ්‍ය භූමිය අත්පත් කර ගැනීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

මෙය වසර 06ක පමණ සිට තිබෙන ගැටළුවක්.මෙතන සිටින ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලා දන්නවා ප්‍රධාන පාරේ ඇහැලියගොඩ සිට ඉඩංගොඩ දක්වා යද්දි 14/3 බෝක්කුව කියන්නේ ඉතාම ළඟ. යකුදාගොඩ ඒ අසල තියෙන බෝක්කුව.ඔවුන් කාණුව වහල තමයි පාර හදල තියෙන්නේ.නමුත් එතන කාණුවක් තිබිල තියෙනවා.විශේෂයෙන් ම එතන තියෙන තනි ගෙදරකට කාණුව තිබුණ එකක්.අනිත් අය ඉඩම අල්ලල තාප්ප ගහල.වහින වෙලාවට අර කාණුව ඉතුරුවහම කෙලින්ම අර ගෙදරට එන්නේ.ඉතින් මේක දිගින් දිගට ඇවිල්ලා,අපි ප්‍රාදේශීය සම්බන්ධීකරණ සභාවෙදිත් කථා කරලා, අවසානයේදී විසඳුමක් ලෙස මේක ගරු ආණ්ඩුකාරතුමියට යවල,ජනාධිපතිවරයාට පවා යවල,අන්තිමට අපිට මේක ආවේ මෙය ප්‍රාදේශීය සභාවෙන් තමා මේ වැඩේ කරන්න ඕනි කියල.එම නිසා මෙය අපිට තියෙන්නේ නීත්‍යානුකූලව.කාර්මික නිලධාරී, මම සහ උපසභාපතිතුමා, මන්ත්‍රීවරු ගොඩාක් අය ගිහිල්ලා මේක සාමදානව, ඒ කාණුව දිගටම පවත්වා ගන්න ඒ අය එක්ක සාකච්ඡා කළා. නමුත් කිසි කෙනෙක් එකඟ වෙන්නේ නැහැ.ඉතින් අන්තිමට තියෙන්නේ අපි මෙය සභාවෙන් කළ යුතු දෙයක්.අපිට මෙය මගහරින්න බැහැ. අපිට තියෙන්නේ සභාවේ නීතිවලට අනුව, මේ ඉඩම අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය.ඒ ගැන තමයි මම ඔබතුමන්ලාට ප්‍රකාශ කළේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.01 යෝජනාව,ඇහැලියගොඩ හිඳුරංගල හරහා කිරිඇල්ල දක්වා දිවෙන මාර්ගයේ 14/3 බෝක්කු අසලින් පහළට ගමන් කරන කාණුව සැකසීම සඳහා අවශ්‍ය භූමිය අත්පත් කර ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

06.02.සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**

**06.02.ඇහැලියගොඩ පොළ භූමියේ පොදු වැසිකිලියේ විදුලිය හා ජලය සඳහා වෙන ම මනු සවි කිරීමට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

අපි මුදල් කමිටුවේ සිටින මන්ත්‍රීතුමන්ලා සහ ඩිල්ෂාන් මන්ත්‍රීතුමා පවා අපි සාකච්ඡා කළා. මෙහි අසමාන්‍ය විදිහට ජල බිලක් එනවා. අපිට මේක එන්නේ කොහෙන්ද කියල හරියටම නියාමනය කර ගන්න බැහැ.ඒ නිසා අපි වෙනම මීටරයක් සවිකල කළොත් සොයාගන්න පුළුවන් කොහෙන්ද විදුලිය සහ ජලය වැඩිපුර යන්නේ කියල .ඒකට තමයි මෙම යෝජනාව ඉදිරිපත් කළේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.02 යෝජනාව,ඇහැලියගොඩ පොළ භූමියේ පොදු වැසිකිලියේ විදුලිය හා ජලය සඳහා වෙන ම මනු සවි කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

06.03. සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**

**06.03.දම්මුල්ල ශ්‍රවනාගාරයේ සෑම ඉරිදා දිනක ම ප.ව. 1.00 සිට ප.ව 8.00 දක්වා නර්ථන පංතියක් පවත්වාගෙන යනු ලබන අතර, 2026 වර්ෂය සඳහා ද එම නර්ථන පංතිය පවත්වාගෙන යෑම සඳහා දම්මුල්ල ශ්‍රවනාගාරය ලබා දීමට යෝජනා කරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න ගම්ලත් මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**

මෙය අද ඊයේ ඉඳන් නෙමේ වසර ගණනාවක සිට සිදුවන ක්‍රියාවලියක්.නමුත් එහි ගිය වසරේ ගිවිසුමක් අහෝසි වුණ නිසා, අපි නැවත ගිවිසුමක් කරනවා.මෙහිදී අපි දවසකට රුපියල් 1000.00ක මුදලක් සභාවට ලැබෙනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, විනාඩියක් සමාවෙලා .මට පොඩි වෙලාවෙක් ඕනි.ඇත්තටම අපි මේ සම්බන්ධයෙන් ගැටළුවක් මතු වුණා.එම ගැටළුව මතු වූ වෙලාවේ අපේ සුමිත් මන්ත්‍රීතුමයි,අජන්ත මන්ත්‍රීතුමයි ඒ තීන්දුවත් එක්ක යම් යම් ප්‍රශ්නයක් මතු වෙලා අපි කණ්ඩායමක් විදිහට තමයි තීන්දු ගන්නේ.එවිට අපි ඔබතුමාගේ යෝජනාවට එකඟ වුණා.කණ්ඩායමක් විදිහට බලනකොට සභාපතිතුමා ඔබතුමාටත් කවදහරි තේරෙයි,විපක්ෂයේ ඉන්නකොට ගැටලු මතු වෙනවා.කණ්ඩායමක් විදිහට ගත්තාම හරිද වැරදිද කියලා නැහැ, අපි ඒ තීරණයේ තීන්දුවේ ඉන්නවා. ඒ තමයි අපේ ප්‍රතිපත්තිය.ඒක හරිද වැරදිද සමහර වෙලාවට වෙනස් වෙන්න පුළුවන්.එතකොට සභාපතිතුමා අපි මෙතෙන්දි ඔබතුමාගේ කීමට අපි පොඩි කාලයක් අරගෙන සාකච්ඡා කරලා සහෝදර මන්ත්‍රීතුමන්ලාගේ එකඟාවය මත තමයි අපි මේ තීන්දුව ගත්තේ.එවිට අපි සභාවක් විදිහට දිලීන් මන්ත්‍රීතුමා කිවුවා වගේ, අපි සෑම අවස්ථාවකදීම ඔබතුමාට ඔබතුමාගේ කණ්ඩායමට සහයෝගය ලබාදීල තියෙනවා.අපි කිසිම අයුරකින් විරුද්ධ වෙලා නැහැ.අය වැය ගත්තාම අයවැයේ සාම්ප්‍රධානුකූව යන ක්‍රමයක් තියෙනවානේ.අපි ඒ විදිහට කරලා තියෙනවා. ඒනිසා නැත්තන් වැරදි මතයක් යන්න පුළුවන්, අපි මොකක්ද මේ ගත්තේ, මොක්කද මේ කළේ කියලා. අපි ඒ තීන්දුව ගත්තා.ඒ නිසා අපි ඒ තීන්දුවෙදී ඊට පස්සේ, අපි ඒ අවස්ථාව ලබා දුන්නා. එතන කිසිම ප්‍රශ්නයක් නැහැ.ඒ මන්ත්‍රීවරුන් දෙදෙනා, මම හිතන්නේ සුමිත් මන්ත්‍රීතුමාඅපිත් එක්ක කටයුතු කරන කොට ඒ එකඟතාවල්වල යම් යම් තීරණ එක්ක තමයි, අපි ඊට පස්සේ තමයි මේ තීන්දුව ගත්තේ.අපිට කාටවත් පුද්ගලික ප්‍රශ්නයක් අපිට එහෙම ප්‍රශ්න නැහැ.ඒ නිසා අපි සභාවට,ඔබතුමාට දෙන සහයෝගයක් ලෙස කණ්ඩායමක් ලෙස අපි තීන්දුවක් අරගෙන අපි ඒ ගත්ත තීන්දුව තමයි ප්‍රකාශ කළේ.අපි යම් තීන්දුවක් ගන්නකොට අපේ කණ්ඩායමේ ප්‍රතිපත්තියක් සහ විෂය කරුණු ටිකත් ඒකාබද්ධව යනකොට ඒකෙන් පරිභාහිරව යනකොට යම් යම් තීන්දු තීරණ ගන්න වෙනවා. ඒ තමයි ස්වභාවය.ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට ඒක දැනෙනවා අඩුයි.අපි 16 දෙනාම ඒ ගේ තීන්දුවකට ඇවිල්ල තමා ඒ තීන්දුව ප්‍රකාශ කළේ.අපි ඒ ගත්ත තීන්දුව අපි විපක්ෂයක් විදිහට අපි නිවරදි අපි බොහොම කල්පනා කරලා විචක්ෂණශීලීව අපි හැමෝගෙ ම අදහස් අරගෙන බොහොම අවබෝධයෙන් තමා අපි ඒ තීන්දුව ගත්තේ, කියලා ප්‍රකාශ කරන්න ඕනේ ගරු සභාපතිතුමා.

**සභික එ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමා,එම පංති පැවැත්වීම සම්බන්ධයෙන් විරෝධතාවයක් නැහැ.විශේෂ අවස්ථාවක් වුණොත් ගන්න ක්‍රමවේදයක් තියේද .ඉරිදා දිනයේදී පෙර පාසල් උත්සවයක් තියෙනවා.නැත්තන් වෙනත් රැස්වීමක් තියෙනවා.ඒ වගේ විශේෂ අවස්ථාවකදී ගන්න බැරිද?

**සභාපතිතුමා :-**
පුළුවන් .එහෙම කරන්න පුළුවන්.මේක මේ ගමේ කට්ටියක් කරන්නේ.ඇත්තට ම අපි විශේෂ අවස්ථාවල ඒ අයට කියලා ඒ අවස්ථාව අරන් දීලා තියෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.03 යෝජනාව,දම්මුල්ල ශ්‍රවනාගාරයේ සෑම ඉරිදා දිනක ම ප.ව. 1.00 සිට ප.ව 8.00 දක්වා නර්තන පංතියක් පවත්වාගෙන යනු ලබන අතර, 2026 වර්ෂය සඳහා ද එම නර්තන පංතිය පවත්වාගෙන යෑම සඳහා දම්මුල්ල ශ්‍රවනාගාරය ලබා දීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :- සභාපතිතුමා :-**
06.04.සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා:-**
**06.04.දෙහිගහපිටිය වෙලන්ගල්ල මාර්ගය භාවිත කිරීම වෙනුවෙන් ගිවිසගත් ගිවිසුම 2026.01.06 දිනෙන් අවසන් වන බැවින් 2025.12.29 දින පැවති මුදල් කමිටු ආවරණ අනුමැතිය මත මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු 2026.01.07 දින සිට වසර 5 ක් සඳහා ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව හා මාස්ටර් හෝල්ඩින් ආයතන සමඟ ගිවිසුමට එළඹීමට මම යෝජනා කරමි.**

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ පසුගිය 2018 ප්‍රාදේශිය සභාව තිබුණ කාලයේ මාස්ටර් හෝල්ඩින්ස් එකත් එක්ක අපේ ප්‍රාදේශිය සභාව ගිවිස ගත්තා. අවුරුදු 05ක්ද 03ක්ද කියලා මට මතක නැහැ.අවුරුද් 03 දක්වා අඩුකරන්න බැරිද?.මමත් මේ පැත්තේ හිටියට මමත් මිනිස්සු වෙනුවෙන් පෙනී සිටියා.ප්‍රදේශ වාසීන්ගෙන් ලොකු ගැටළු වගයක් තිබ්බා.ඇත්තටම එම ගල් කුඩු අදිනකොට එම ගෙවල්වලට ඉන්නම බැහැ.ඇත්තම කථා කරන්නේ. ඒ ගෙවල් වලට ගිහිල්ලා නිරීක්ෂණය කරලා. ඒ ගෙවල් ඇතුළේ ඉන්නම බැරි තත්වයක් තිබ්බා. හැබැයි ඒ සමාගමයි ප්‍රදේශවාසීනුයි එකතු වෙලා යම්කිසි එකඟතාවයකට ඇවිල්ලා තිබුණා. ප්‍රාදේශිය සභාවටත් ඒ ප්‍රශ්නය ආවා.මට මතක විදිහට ඒ ගිවිසුම හදන ඊළඟ සැරේ හදන කොට අවුරුදු 03 කට වගේ කතාවක් එහෙන් මෙහෙන් සාකච්ඡා වුණා. එතන තව ප්‍රශ්නයක් ආවා පෝය දවසෙත්, යෝජනාව තිබ්බට ගිවිසුම තාම අපි දැක්කේ නැහැ. ගිවිසුමේ තියෙනව ද පෝය දවසෙත් නිවාඩු දවස් වලටත් ද්‍රව්‍ය ගෙනියන්න පුළුවන් ද කියලා.ගිවිසුම ගැන සාකච්ඡා කරනවනම් හොඳයි.ප්‍රදේශවාසීන්ගෙන් ගැටළුවක් එන්න ඉඩ තියෙනවා. අපිට තියෙන ප්‍රධාන ගැටළුව තමයි එයාල කලින් පෝය දවසෙත් ඇරලා. ප්‍රදේශවාසීන් කිවුවා පෝය දවසෙවත් අපිට නිවී සැනසිල්ලේ ඉන්න දෙන්න කියලා. ලොකු වාහන යනකොට ඉන්න අමාරුයි.පෝය දවසේ පුළුවන් නම් කරන්න එපා කිවුවා.ඉරිද දවසෙත් පුළුවන්නම්. ඒ ගිවිසුමේ තියෙනව නම්, හොඳයි.නැත්නම් ප්‍රදේශවාසීන්ගේ ගිවිසුම පිළිබඳව අර්බුදයක් එන්න ඉඩ තියෙනවා.

**සභාපතිතුමා :-**

ගරු මන්ත්‍රීතුමා දැන් මං ළඟ තියෙනවා ඒකට දාපු පසුගිය වසර 05 තමයි ගිවිසුම.එහි ඔබතුමා කියපු ඒක සම්බන්ධ කරලා නැහැ.තවම ගිවිසුමක් අත්සන් කරලා නැහැ.මහ සභාවට දානවා. අපිට ඒක අවශ්‍යනම් ගිවිසුමට දාන්න පුළුවන්. අපි ඒක මුදල් කමිටුවේදී කලේ ආවරණ අනුමැතියත් ඇතිව.මෙය මහ සභාවට ඉදිරිපත් කරලා මේක ඉදිරිපත් කරමු කියලා තමයි දැම්මේ.එතකොට අපිට ඔබතුමාගේ ඉල්ලීම කියන්න පුළුවන්. ඊට අමතරව . අපි මේක අවුරුදු 2015.01.01 රු 5000.00ක් තමයි අවුරුදු 05ට දාල තියෙන්නේ.මාසිකව. 2021 නැවත අලුත් කරලා තියෙනවා එවිට රු. 10000.00ක් ඔවුන් මාස් පතා ගෙවලා තියෙනවා. මේ පාර අලුත් එකේදී අපි රු.15000.00ක් වැඩි කරන්න තමයි ගිවිසුම්ගත වීමට බලාපොරොත්තු වෙන්නේ. ඊට අමතරව ඔබතුමා කිව්වා වගේ සමහර විට ඔවුන් ඉරිදා පෝය වගේ මම දන්න විදිහට වැඩ කරන්නේ නැහැ. අපිට එහෙම කරනව නම් අපිට අපි ගිවිසුම්ගත වෙනකොට අපිට ඒ යෝජනාව ඇතුළත් කරන්න පුළුවන්. හැබැයි පරණ එක එහෙම ලගු කරලා නැහැ. අලුත් එක තමයි අපි මේ සම්බන්ධව විරෝධතා තියෙන කිහිප දෙනෙක් සභාවට කැඳවලා අපි ඔවුන් සමඟ සාකච්ඡා කරලා තමයි ගිවිසුම්ගත වීමට අදහස් කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒ අනුව ගරු සභාපතිතුමනි 6.4 යෝජනාවට අපි තවදුරටත් ඉදිරියට සාකච්ඡා කිරීමේ අරමුණ ඇතිව තමයි අපි මේ යෝජනාවට එකඟ වෙන්නේ. ගිවිසුම අපි දකිනවද අත්සන් කරන්න කලින් .

**සභාපතිතුමා :-**
අපිට කාලය ගැටළුවක් තියෙනවා. එය දාන්න ඕනි නම් යෝජනාව දාමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මෙන්නමේ පිළිබඳව සැලකිලිමත් වෙන්න, ගිවිසුම හදනකොට.පෝය දිනය සහ ඉරිදා දිනවල ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමක් තිබ්බා ඒ පාරේ නිදහසේ ගමන් කිරීමට අවස්ථාව දෙන්න කියලා.ගිවිසුමට දාන්න පුළුවන්නම් හොඳයි කියන එක තමා අපේ යෝජනාව.පෝය සහ ඉරිදා දවයේ වාහන යන එක නවත්වන්න.

**සභාපතිතුමා :-**
මේකෙ මෙහෙම තියෙනවා ගරු මන්ත්‍රීතුමා, මාර්ගයේ ගමන් කරනු ලබන වාහන වල උපරිම බර ටොන් 03ට සහ කියුබ් 03කට යටත්ව ධාවනය කිරීමට සඳුදා සිට සෙනසුරාදා එතකොට එතන ඉරිදා කොහොමත් නැහැ.දක්වා පෙ.ව. 6.00 සිට වේලාව ඇතුළත් කරන්න ඕන.එවිට අපිට දාන්න තියෙන්නේ පෝය දවස පමණයි. ගිවිසුමට කොන්දේසි දාමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
එහෙම තිබ්බට පෝය දවසත් වැඩකරපු අවස්ථා ආරංචි වෙලා තියෙනවා ඒ නිසා ගිවිසුමට දාන්න.

**සභාපතිතුමා :-**
එහෙනම් ගිවිසුමට කොන්දේසි දාමු.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගිවිසුම අවුරුදු 03කට දැම්මොත් කාලය මදි වෙයි ද?

**සභාපතිතුමා :-**
මෙහි තියෙන්නේ නම් ඔවුන් සමඟ එකඟ වෙලා තියෙන්නේ නම් වසර 05කට.ලොකු ඇප මුදලක් ගෙවල තියෙනවා. යම්කිසි දෙයක් වුණොත් කපාහරින්නත් පුළුවන්.මුලින් තිබුණේ ලක්ෂ 03යි.මේ පාර ඔවුන්ගෙන් භාරලක්ෂ පනස්දාහකට ඇප තැන්පත් මුදලක් දාල තියෙනවා. ඒක අපි ඇප තැන්පතුවකුත් දැම්මා.ඊට අමතරව මාස්පතා රු.15000.00 බැගින් ගෙවන්නත් අවශ්‍යයි.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.04 යෝජනාව,දෙහිගහපිටිය වෙලන්ගල්ල මාර්ගය භාවිත කිරීම වෙනුවෙන් ගිවිසගත් ගිවිසුම 2026.01.06 දිනෙන් අවසන් වන බැවින් 2025.12.29 දින පැවති මුදල් කමිටු ආවරණ අනුමැතිය මත මහා සභාවට ඉදිරිපත් කිරීමෙන් පසු 2026.01.07 දින සිට වසර 5 ක් සඳහා ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව හා මාස්ටර් හෝල්ඩින් ආයතන සමඟ ගිවිසුමට එළඹීම සඳහා වූ යෝජනාවට ඉරිදා දිනය හා පෝය දිනය ද විවෘත නොකරන ලෙසට ගිවිසුමට ඇතුළත් කිරීමට එකඟ වීම මත මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.05.සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා:-**
**06.05.2026.වර්ෂය සඳහා පුහුණු සැලැස්ම අනුමත කිරීමට යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
2026 කියලා පුහුණු සැලැස් ම තියෙනවා.මේක හැම අවුරුද්දක ම කරන දෙයක්.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.05 යෝජනාව,2026.වර්ෂය සඳහා පුහුණු සැලැස්ම අනුමත කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.06.සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**
**06.06.සුළු ඉඩෝර තත්ත්වයන් හමුවේ වුවද අර්බුදයට ලක්වන ගැටහැත්ත පානිය ජල යෝජනා ක්‍රමය සක්‍රීය හා ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගනිමින් පාරිභෝගික ජනතාව වෙත අඛණ්ඩව හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා දියුරුම්පිටිය ජල යෝජනා ක්‍රමය සමඟ ඒකාබද්ධ කිරීම සුදුසු බවට යෝජනා කරමි.**

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගැටහැත්තට යනකොට ප්‍රෙෂර් එක හුඟක් වැඩි වෙන්න පුළුවන්. සමහරවිට මේකෙ බට ලයින් එක අලුතින් දාන්න වෙයි.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ සම්බන්ධව තාක්ෂණික ඇගයීමක් තියෙද?

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රීතුමා මේක යෝජනාවක් පමණයි. මේවන විට දිවුරුම්පිටියේ තියෙන ජල ටැංකියේ ලොකු ජල ධාරිතාවක් තියෙනවා.නමුත් වතුර පහළට එනකොට පොඩි ඉඩෝරයකට පවා හිඳෙනවා.වතුර වැඩිපුර ටැංකියේ තියෙන නිසා .මේ ළඟදි ශ්‍රමදානයක් දාල සුද්දත් කළා. ඒක පහළට ඒකාබද්ධ කරගත්තොත් ඒ ගැටළුවත් අපිට විසඳගන්න පුළුවන්.මේ වෙලාවේ මන්ත්‍රීතුමා කිවුව කතාව හරි. මේ වෙලාවේ අපි යෝජනාවක් තමයි කරන්නේ.යෝජනාවෙන් පසුව රණවීර මන්ත්‍රීතුමා කිවුවා වගේම, අපි එතනත් බලන්න ඕනි තාක්ෂණය අත්‍යාවශ්‍යයි. වේගයෙන් එනකොට බට ටික පුපුරන්න ඉඩ තිබෙනවා.එතන වතුර ලොකු ධාරිතායක් තියෙනවා.අපි ඒක අනිවාර්යයෙන්ම තාක්ෂණික කමිටුවක් හරහා තමයි, මේක අපි යෝජනාවක් කරන්නේ.යෝජනාව සම්මත කරගන්න පුළුවන් වුණොත් අපිට ඒකට අවශ්‍ය කරන තාක්ෂණ යොදලා, අවශ්‍ය උපදෙස් අරගෙන තමා කරන්න බලාපොරොත්තු වෙන්නේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ සම්බන්ධව මට මතකයි මීට කලින් සභාවෙදි අපි මුලින් ම ඉඩම සම්බන්ධයෙන් අපි පවරාගැනීමක් කළේ නැහැ කියලා,දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමය සම්බන්ධව.ඒසම්බන්ධයෙන් ඔබතුමා යම් ක්‍රියාමාර්ගයක් ගත්තද කියල මම දැනගන්න කැමතියි.

**සභාපතිතුමා :-**
ගැටළුව තියෙන්නේ ටැංකිය නෙවෙයි ළිඳ.මමත් ගියා බලන්න.මමත් ඒ ගිය වෙලාවේ ඔය ප්‍රශ්නය ඇහුවා.නමුත් ඒ ගොල්ලන්ට වතුර දෙන්න එකඟතාවයක් තමා තියෙන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙතන ළිඳ ගත්තොත් එහෙම, එතන ඉඩම පවරා ගැනීමක් කරලා නැහැ.නමුත් ඔවුන්ගෙන් බාධාවක් නැහැ. ප්‍රාදේශිය සභාවේ වත්කමක් විදිහට අපිට ළිඳ තියෙන ඉඩම පවරා ගතහොත් නීත්‍යානුකූලව අපිට ලොකු පිටුවහලක් වෙයි කියලා.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ටැංකිය තියෙන ඉඩම දෙන්නෙක්ගෙන් තමයි අරන් තියෙන්නේ. වැටක්වත් ගහලා නැහැ.

**සභාපතිතුමා :-**
අපි යෝජනාවක් දාමුද අපි ඒක සභාවට පවරා ගන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඔව් සභාපතිතුමා.එතකොට රණවීර මන්ත්‍රිතුමාගේ ප්‍රශ්නයටත් විසඳුමක් ලැබෙනවනේ.අපි මුලදිත් මේ ගැන කතා කළා.දැන් මාස 06 කුත් ගියා.තාම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරලා නෑ.පරණ ඒවා පැත්තකින් තියලා, අද මේ 2026 ජනවාරි මාසෙනේ.පළවෙනි සභාවනේ.අපි අද තීන්දුවක් ගමු.ඒක නීත්‍යානුකූලව සභාවට පවරා ගන්න.එතකොට රණවීර මන්ත්‍රිතුමාගේ අදාල පාර්ශවයේ ප්‍රශ්නවලටත් උත්තරයක් ලැබෙයි.

**සභාපතිතුමා :-**
ඔබතුමාට පුලුවන් මේ වෙලාවේ යෝජනාව දාන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ මම යෝජනා කරනවා දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමය සඳහා තිබෙන එම ළිඳ සභාවට පවරා ගැනීමට යෝජනා කරනවා.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ යෝජනාව දාල තියෙන්නේ, ගැටහැත්ත නගරය ප්‍රදේශයේ ජල ප්‍රශ්නය ගොඩක් තියෙන නිසා.මේ වැඩේ කරන එක හොඳ දෙයක්.ලොකු ප්‍රශ්නයක් තියෙනවා ගැටහැත්තේ කඩ හිමියන් ජලය ලබාගැනීමේදී, නිරන්තරයෙන් ලොකු ගැටලුවකට මුහුණපානවා.මෙම ක්‍රියාමාර්ගය බොහොම ඉක්මනින් කරගන්න පුළුවන් නම්ගොඩක් හොඳයි.

**සභාපතිතුමා :-**
බොහොමත්ම ස්තුතියි. ඇත්තටම හොඳ යෝජනාවක්.එහෙම තමා අපි බලාපොරොත්තු වෙන්නේ.එය තමා විය යුත්තේ. මෙය කවුරු යෝජනා කළත්, ඒකට කවුරුත් ඒකමතිකව උදව් වෙනවා. සභාවේ අභිවෘද්ධිය සඳහා ඒ වගේ යෝජනා අදහස් අනිවාර්යයෙන්ම ඉදිරිපත් වෙන්න ඕනි.ඒ සම්බන්ධව බොහොමත් ම ස්තුතිවන්ත වෙනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.06 යෝජනාව,සුළු ඉඩෝර තත්ත්වයන් හමුවේ වුවද අර්බුදයට ලක්වන ගැටහැත්ත පානිය ජල යෝජනා ක්‍රමය සක්‍රීය හා ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගනිමින් පාරිභෝගික ජනතාව වෙත අඛණ්ඩව හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා දියුරුම්පිටිය ජල යෝජනා ක්‍රමය සමඟ ඒකාබද්ධ කිරීම සුදුසු බවට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.07.සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**
**06.07.2025 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාව සහා අනුමැතිය සඳහා යෝජනා කරමි.**

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.07 යෝජනාව,2025 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාව සහා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය

**සභාපතිතුමා :-**
06.08.සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**
**06.08. ගැටහැත්ත බහු කාර්යය ගොඩනැගිල්ල තුළ පවතින සෞඛ්‍ය උපකරණවලින් කොටසක් සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් තක්සේරුව සිදු කර ඇති අතර තවත් කොටසක් කොළඹ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය මඟින් පත් කිරීම් සිදු කරන ලද ජීව වෛද්‍ය ඉංජිනේරු හා එම කමිටුව විසින් තක්සේරු කරන ලද අතර එම කමිටුව විසින් ජීව වෛද්‍ය උපකර්ණ ලෙස තක්සේරු කළ නොහැකි බවට නිර්දේශයක් ඇති හා වෛද්‍ය උපකරණ ලෙස යොදා ගත නොහැකි ලෙසට පත් කර ලෝහ බරට වෙන්දේසි කිරීමට හෝ කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා තක්සේරු හා නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කර ගැනීම සඳහා මම යෝජනා කරමි.**

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
ඒ පිළිබඳව අපේ කවුරුත් මන්ත්‍රීතුමන්ලා දන්නවා.මේක ගැටහැත්තෙ බහුකාර්ය ගොඩනැගිල්ලමීට ඉහත දී දීල තියෙනවා සෞඛ්‍ය සායනයක් ඉටු කිරීම සඳහා.නමුත් ඔවුන් අවුරුදු ගාණක් ඉඳලා ඔවුන් එම ස්ථානය අතහැර ගොස් තිබෙනවා, එම වෛද්‍යවරයා. අපි ඊට පසු එය අපිට හැකි වුණා ගිය වසරේ මෙය බදු ලබාදීමට.නමුත් බදු ලබාදුන්නත් එහි තිබෙන වෛද්‍ය උපකරණ ටික ඒ වෛද්‍යවරයා ගෙනියන්නේ නැහැ. ඒ නිසා අපිට සිදු වුණා මේ ටික ඉවත් කරන්න. එම බදුකරුට ඉවත් කරලා දෙන්න ඕනේ.නමුත් මේ වන විට අපිට පුලුවන් වෙලා නෑ.ඉතින් අපිට මේකට තක්සේරුවක් ගන්න සිදු වුණා. තක්සේරුව ගන්න අපි බාහිර පාර්ශවයන්ගෙන් උදව් ගත්තා.එවිට ඔවුන් කියලා තියෙන්නේ වෛද්‍ය උපකරණ අපි කවුරුත් දන්නවා,කාලයක් තිබුණහම කොච්චර හොඳ වුණත් වැඩක් නැහැ.ඒවා යකඩ බරට තමයි දෙන්න වෙන්නේ.එම නිසා ඒ අපි මේක ඉවත් කර ගන්න ඕනේ.ඒ හින්ද තමයි කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබාදීම සඳහා තක්සේරු හා නිර්දේශ ලබා ගැනීමට මම යෝජනාව දැම්මේ.ඉතින් මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ සඳහා යම්කිසි දැනුමක් ඇති හැකියාවක් තියෙන අයගෙන් කමිටුවක් අපි පත් කර ගනිමු කියා මම සභාවෙන් ඉල්ලා සිටිනවා.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම මේ බඩු භාණ්ඩ කුමන හේතුවක් මත ගෙනත් දාල තියෙනවද කියල කියන්න අමාරුයි.මේවා කුමක් හෝ ජාතික රෝහලක අයින් කරපුව කිව්වා.කිසිම ප්‍රයෝජනයකට ගන්න බැහැ.ඒ නිසානේ යකඩ බරට දෙන්න වෙලා තියෙන්නේ.මේවගේ අක්‍රමවත් වැඩපිළිවෙලකුත් වෙලා තියෙනවා මේකේ.මේ ටික ගෙනැත් දාල තියෙන එක.මේ ටික කොහොම හරි යකඩ බරට තමා දීගන්න තියෙන්නේ.

**සභාපතිතුමා :-**

සභාවෙන් මේකට මුදලක්  නෑ.නමුත් මේක බදු දීල තියෙන්නේ වෛද්‍ය සායනයක් සඳහා ඒ අවශ්‍ය වෛද්‍යවරයා තමයි ඒ ටික ගෙනල්ලා තියෙන්නේ.නමුත් හැබැයි එම වෛද්‍යවරයාගෙන් මුදලක් ගන්නත් තියෙනවා මම හිතන්නේ.බදු පැහැරහැරලත් තියෙනවා.මේ අද ඊයේ වෙච්ච එකක් නෙමෙයි.නමුත් එතුමා එන්නෙත් නැහැ.එතුමා මොකක් හරි කැන්සර් එකක් හැදිලා හරි එහෙම ලෙඩක් වෙලා තමයි එන්නැතුව ඉන්නේ.නමුත් අපි මේක ඉවත් කරන්න ඕනනේ.නමුත් මේ ටික ඉවත් කිරීමට අවශ්‍ය නිසා තමයි මේ ටික කුමක් හෝ යකඩ බරට.එහෙම නැත්නම් අපි මේ පත් කරන කමිටුවෙන් තමයි තීරණය කරන්න ඕනේ, මේක කාර්මික සංවර්දන මණ්ඩලයට දෙනව ද? නැත්නම් යකඩ බරට දෙනවද කියලා.ඇත්තටම මේක ඉවත් කරන එක තමයි ප්‍රධාන ම අවශතාවය.මේ ටිකත් එක්ක හරි කරදරයක් එතන.මේක අවශ්‍යනම් අපිට පුළුවන් කාරක සභාවක් බවට පත් කර ගෙන ලේකම්තුමාගෙන් පැහැදිලි කරගන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
සභාපතිතුමා, කමිටුවක් පත් කරගෙන මේ කාර්යය සිදුකරමු.

**සභාපතිතුමා :-**
එහෙම නම් මම සභාවෙන් ඉල්ලා සිටිනවා අපි කමිටුවක් පත් කර ගනිමු.ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙනවා නම් වඩාත් හොඳයි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම වෛද්‍ය උපකරණ අදාල නිර්දේශ අනුව ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද කියා තීරණය කිරීමට කාර්මික සේවා කමිටුවට බලය පවරමු කියා මම යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාර්මික සේවා කමිටුවේ ගරු මන්ත්‍රීතුමන්ලාට අමතරව ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමාත්,ගරු මන්ත්‍රී අමිල් නිමේෂ මැතිතුමාත් මම යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගැටලුවක් නෑ.කමිටුවක් වුණා ම ඒ කමිටුවට අදාළ අයට විතරයි සම්බන්ධ වෙන්න පුළුවන්.හොඳ යෝජනාවක් තමා අපේ මන්ත්‍රීතුමා කළේ.ඒ කමිටුවට එහෙම සම්බන්ධ කරන්න බැහැනේ.ඒනිසා ඒ මන්ත්‍රීතුමන්ලා දෙදෙනාත් දාල අපි වෙනත් කමිටුවක් පත් කර ගනිමු ගරු සභාපතිතුමා.

**සභාපතිතුමා :-**
මෙහෙම කරමුද? කාර්මික සේවා කමිටුවට අමතරව,මේ කාර්යය සිදුකිරීම සඳහා තවත් මන්ත්‍රීවරු දෙදෙනෙක්ගේ නම් දෙකක් යෝජනා කරමු.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,නදුන් මන්ත්‍රීතුමා අදහස් කරන්න ඇත්තේ කොට්ඨාශයට අයත් මන්ත්‍රීවරු දෙන්නා නිසා ඒ දෙන්නගෙත් සහය ලබා ගත්තොත් හොඳයි කියලා.එහෙම නම් අපි ඒ දෙන්නත් දාල කමිටුවක් පත් කර ගනිමු.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම කියන්නේ මේකේ අවසානයට කාර්මික සේවා කමිටුව කියලා නම දාන්න එපා.

**සභාපතිතුමා :-**
මම හිතන්නේ මේක කතා කරනකොට තමා පැටලෙන්න ඇත්තේ.මෙහෙම කිව්වව නම් හරි.කාර්මික සේවා කමිටුවේ ඉන්නවානේ නව දෙනෙක්.කමිටු කතාවක් නැහැ.නව දෙනාගේ නම් කියන්න අවශ්‍ය නැහැනේ. එම නව දෙනා සහ ඉතුරු දෙදෙනා.එවිට කාර්මික කමිටුවක් නෙවෙයි එතන වෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම හිතන්නේ මේක කාර්මික කමිටුව වෙන් නෑ එතකොට.එහෙම නම් අලුතින් පත් කර ගන්න ඕනේ.ඒකේ අවසානයට කාර්මික කමිටුව කියලා නම දාන්න එපා.කමිටුවට අලුතින් සාමාජිකයන් පත් කරගෙන ඒකට සම්බන්ධ කළ යුතු නැහැනේ.මම විශ්වාස කරන්නෙත් මේක කාර්මික කමිටුවට අයිති වැඩක්.මේකට අලුතින් පත් කර ගන්න ඕන් නෑ කියන එක මගේ නම් මතය.

**සභාපතිතුමා :-**
කාර්මික කමිටුවේ ඉන්න අයගේ නම් ටික කියන්නකෝ.

**සභික කේ.ඩබ්ලිව්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම කාරණාවට මම යෝජනා කළේ, කාර්මික සේවා කමිටුවේ ඉන්න මන්ත්‍රීතුමන්ලා නව දෙනාට අමතරව වසමේ ඉන්න මන්ත්‍රීතුමන්ලා දෙදෙනාත් දාල කමිටුවක් හදමු.

**සභාපතිතුමා :-**
සමහරවිට කාර්මික කමිටුවේ ඉන්න මන්ත්‍රීවරු ඒකට එකඟ නොවෙන්න පුලුවන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ කමිටුව නිශ්චිත නැහැ.මම කියන්නේ නිශ්චිත වෙන්න නම්,මේ සභාව පිළිගත් ආකාරයට නම් ටික යෝජනා කරලා සිදුකළ යුතුයි.

**සභාපතිතුමා :-**
කාර්මික කමිටුවේ ඉන්න අයගේ නම් ටික කියන්න කියලා කියන්න.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂබණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,උප සභාපතිතුමා නම් කළ පරිදි මෙය කාර්මික කමිටුව විසින් ම සිදුකිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.08 යෝජනාව,ගැටහැත්ත බහු කාර්යය ගොඩනැගිල්ල තුළ පවතින සෞඛ්‍ය උපකරණවලින් කොටසක් සබරගමුව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් තක්සේරුව සිදු කර ඇති අතර තවත් කොටසක් කොළඹ ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය මඟින් පත් කිරීම් සිදු කරන ලද ජීව වෛද්‍ය ඉංජිනේරු හා එම කමිටුව විසින් තක්සේරු කරන ලද අතර එම කමිටුව විසින් ජීව වෛද්‍ය උපකරණ ලෙස තක්සේරු කළ නොහැකි බවට නිර්දේශයක් ඇති හා වෛද්‍ය උපකරණ ලෙස යොදා ගත නොහැකි ලෙසට පත් කර ලෝහ බරට වෙන්දේසි කිරීමට හෝ කාර්මික සංවර්ධන මණ්ඩලයට ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා තක්සේරු හා නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කර ගැනීම සඳහා වූ යෝජනාවට කාර්මික සේවා කාරක සභා කමිටුවට ඒ සඳහා බලය පැවරීමට එකඟවීමත් සමඟ මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.08.II. සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**
**06.08.II.මෙම තක්සේරුව සිදු කළ පසු එය වෙන්දේසි කිරීම සඳහා කුමන පුවත්පත්වල පළ කරන්නේ ද යන්නත් තීරණය කර ගැනීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

සභාපතිතුමා මම හිතන්නේ මෙය පුවත්පත්වල පළ කිරීම අත්‍යවශය වෙනවා.නමුත්ඒකට අපිට ලොකු වියදමක් යන නිසා පිරිවැය අවම ක්‍රමයකට තමා යන්න ඕනේ.මේක කියන විදිහට අපිට ලොකු මුදලක් උපයන්න පුළුවන් වෙයිද කියලා කියන්න බැනේ? නමුත් අපි මේක නීත්‍යානුකූලව පුවත්පත් දැන්වීමක් කියලා කියන නිසා දාන්න වෙනවාඒ අනුව යන පිරිවැය අනුව තමා තීරණය කරන්න ඕනේ.

**සභාපතිතුමා :-**
රජයේ පුවත්පත් දෙකක පළ කරමු. වාරමංජලී හා සිළුමිණ පුවත්පත්වල (සති අන්ත) පළ කිරීම සිදු කරමු නේද?

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.08.II යෝජනාව, මෙම තක්සේරුව සිදු කළ පසු එය වෙන්දේසි කිරීම සඳහා කුමන පුවත්පත්වල පළ කරන්නේ ද යන්නත් තීරණය කර ගැනීම සඳහා වූ යෝජනාවට වාරමංජලී හා සිළුමිණ පුවත්පත්වල (සති අන්ත) පළ කිරීමට මහා සභාව විසින් තීරණය කිරීමෙන් පසුව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.09සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**
**06.09. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා බදු පැනවීමේ ගැසට් පත්‍රයේ ව්‍යාපාර බදු පැනවීමේ කොටසට අයත් ව්‍යාපාර නම් ලැයිස්තුවට දුරකථන කුළුණු සඳහා ගාස්තු ඇතුළත් කර සංශෝධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂබණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීවරුනි,මේන මේ අපිට තියෙන ගැසට් එකේ කුළුණු සඳහා වෙනමවෝට් එකක් නැහැ.මෙච්චර කාලයක් තිබිලා නැහැ.නමුත් මේකට අපිට Oditඑකක් යනවා.මොකද අනිත් සභාවල මේ කුළුණු සඳහා මුදල් අයකරගෙන තිබෙනවා අනිත් පලාත්වල.අපිට අපේ සභාවට අයත් කුළුණු මම හිතන්නේ, 14ක් විතර තියෙනවා. මේවායෙන් අපිට මෙතෙක් කල් අය කර ගෙන නැහැ. 2004 Oditඑකක් එනවා අපි කුළුණු වලින් මුදල් අයකළේ නැහැ කියලා.මුදල් අයකරගන්න අපිට එහෙම ගැසට් එකක් සභාවේ සම්මත වෙලා නැහැ මෙතෙක් වෙනකන්,දුරකථන කුළුණු සඳහා.ඉතින් ඒකට තමා අපිට සභාවට යෝජනා කරලා ඇතුළත් කරන්න පුළුවන් වෙන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරුසභාපතිතුමනි,ඒ ගැන පොඩි පැහැදිලි කිරීමක් කළ යුතුයි.2004 ඉඳන් කුළුණු සම්බන්ධව මුදල් අයකලේ නැත්තේ මොකද කියලා විගණන විමසුමක් තියෙනවා.ඒකත් එක්ක අපි මේ ගැසට් එකට ඉදිරිපත් කරල නැති නිසා අපි මේ කරන්නේ වැරැද්දක් නිවැරදි කිරීමක් තමයි.ඒ කියන්නේ අතපසු වීමක් හරි අඩුපාඩුවක් හරි.ඒක අපි ව්‍යාපාර බදු ගන්න පුළුවන්ද කියන එක බලන්න තමයි ගැසට් එකට ඇතුළත් කරන්නේ.එහෙම කරලා අපි ඉදිරියට යමු කියන අදහස මම එක් කරන්න කැමතියි.

**සභාපතිතුමා :-**

ගයාෂාන් මන්ත්‍රීතුමා අදහසක් තියෙනවද ඒ ගැන.

**සභික ඩී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරුසභාපතිතුමනි, උපසභාපතිතුමා කියන විදිහට කරන්න පුළුවන්ද කියලා බලන්න ගැසට් එනට දාන්න බැහැ.මේකෙන් බදු අය කරනවද නැද්ද කියන එක, මහන්සිවෙලා හොයන්න ඕනේ රීති පොත කියවලා.පොත කියවන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,6.09 යෝජනාව අනුව,ඔබතුමා අපෙන් ඉල්ලන්නේ,යෝජනාවක් දාල අපි වරින් වර, ඔබතුමන්ලා ඉතින් ජයග්‍රහණය කළා.අපි ඉතින් පරාජය වූ අයවැය ලේඛනයට වැය ශීර්ෂයක් ලෙස දාන්න ඕන කියලනේ.

**සභාපතිතුමා :-**
ගැසට් එකට දාන්න කියන්නේ.ගැසට් එකේ මේ චෝට් එක නෑ.ව්‍යාපාර බදු අය කිරීමේදී මේකෙන් එනවා කියලා එහෙම එකක් නෑ.එහෙම ශීර්ෂයක් නෑ.අය වැයේ නෙමේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක ගැසට් එක දානකොට මේක අයවැය ලේඛනයේ, මුදල් අයකර ගැනීම බලපාන්නේ කොහොමද? අයවැය ලේඛනයේ තියෙන ආදායම් ශීර්ෂය මොකක් ද? කියලා අහන්නේ.

**සභාපතිතුමා :-**
මේක ගන්න පුලුවන්.වෙන සභාවල අරන් තියෙනවා.ව්‍යාපාර බදු යටතේ ගන්න පුළුවන්.අමිල් මන්ත්‍රීතුමා මේගැන අදහසක් දක්වන්න.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂබණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වරිපනම් සීමාවේ තියෙනව නම් අපිට මේක ව්‍යාපාර බදු විදිහට ඇතුළත් කරලා ගන්න පුළුවන්කම තියෙනවා.TRC එකත් එක්ක එකතු වෙලා මේ කුළුණු ව්‍යාපෘතිය කරගෙන යන හින්දා, අනිත් ස්ථානවල COST එකක් දෙනවා..ඒ ගැන සොයා බලන්න තමයි මේක සභා යෝජනාවක් විදිහට දාල ස්ථිර කරගෙන ගියොත් තමයි අපිට ඒක ඉස්සරහට කොහොමද යන්නේ කියලා හොයාගන්න පුළුවන් කියන එක තමයි මගේ අදහස.වරිපනම් සීමාව තුළ තියෙනව නම් අපිට ලබා ගැනීමේ හැකියාව තියෙනවා.දැනටමත් කොළඹ මහ නගර සභාව, කඩුවෙල මහ නගර සභාව ඇතුළු නගර සභාවල ව්‍යාපාර බදු විදිහට ටවර්වලින් බදු අයකර ගන්නවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වරිපනම් සීමාව කියලා කතාවක් නැහැ. අපිට වසම් 44ක් තියෙනවා.ඒ වසම් 44 තුළ මේ කුළුණක් සවි කළොත්, අපෙන් අවසරයක් ගන්න ඕනේ.එයාලට හයි කරන්න බෑ ඕන ඕන විදිහට.ඔබතුමන්ලා ප්‍රකාශ කළා 2004 ඉදන් මුදල් අයකර ගැනීමක් සිදුකරලා නැහැ කියලා.මං හිතන් නෑ ඒක සත්‍යක් කියලා.ඒගැන පොඩි පැහැදිලි කිරීමක් වෙන්න වෙනවා.ඒ ගැන සැලකිලිමත් වෙන්න වෙනවා.අපට ඒ අදාල නිලධාරියා ගෙන්නලා චෙක් කරගන්න ඕනේ, 2004 ඉඳන්ම මුදල් අය කරන් නැද්ද කියලා.මේක විශේෂ ම මුදලක් එකතු කරන්න පුළුවන් එකක්.මේක සරලව හිතන්න එපා.වෙළඳ බලපත්‍රයක් ගන්න එකක්වත්, වරිපනම් සිමාව කියන කතාව මෙතන නෑ.සභාවෙන් අවසර ගන්න ඕනේ ටවර් සවි කරන කොට.භූමිය අපේ.මේක ලොකු මුදලක්.ඔබතුමාට මේ වෙලාවේ පුළුවන්ද? නැත්නම් ඊළඟ සභාවට හරි ඉදිරිපත් කරන්න.2004 ඉදන් ඒ සම්බන්ධව විෂය නිලධාරී කතා කරලා,මේ තොරතුරු ඉදිරිපත් කරන්න කුළුණු සම්බන්ධව.ලොකු මුදලක් සභාවට අයවෙලා ඇති.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දැන් මේ සභාවේ එහෙම චෝට් එකක් නෑ කියලනේ කියන්නේ.මේක මේ සභාවේ ඉදිරියට වැඩ ටික කරගෙන යන්න, සභා යෝජනාවක් විදිහට දාගමු කියලනේ කියන්නේ.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීතුමා, මේක අපි කරන එකක් නෙමේ. මේ සමාගම් ලොකු මුදලක් ගෙවනවා රජයට.මම හිතන්නේ මධ්‍යම පරිසර අධිකාරිය එහෙම බලලා ලොකු මුදලක් ඔවුන් මධ්‍යම ආණ්ඩුවට ගෙවනවා.අපේ ගැසට් එකේ අපිට තියෙන වගේ ව්‍යාපාර බදු අයකර ගන්නකොටසක්.ඒකේ සංදේශ කුළුණු වලට අයකරන එක අපේ සභාවේ නැහැ.ඒ හින්දා අපිට ලොකු මුදලක් අයකරන්න බැහැ. රු.3000.00ක් වගේ මම දන්න තරමට.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
නෑ.නෑ.සමාවෙන්න සභාපතිතුමා,මට දැනගන්න අවශ්‍ය, මේ ඉතිහාසයේ ආපු ආයතන, මම 2011 ඉදන් ඉන්නවනේ.මෙය සභාවට අයවෙලා නැත්නන්.වගකීමෙන් කියන්නේ,කාගෙහරි මේක සාක්කුවට යන්න වෙනවා.ඒක ගිහිල්ලා තියෙනවා.ඒක හින්දා මේක හරියටම තොරතුරක් දැන ගන්න ඕනේ.මේක මේ ලොකු මුදලක්.තුන්දාහක් නෙමේ.ඒක අපි සභාවෙන් තිරණය කරන්න හොඳ නෑ.ඒකෙ තුන්දාහේ කතාවක් නෑ.

**සභාපතිතුමා :-**
සභාව කාරක සභාවක් බවට පත් කරන්න.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට මම යෝජනා කරනවා.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

මෙතැන් සිට මහා සභාවක් බවට පත්විය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාව සභාවක් බවට පත් කිරීමට මම යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, ප්‍රාදේශිය සභාවට කුළුණක් සම්බන්ධයෙන් තියෙන්නේ, ගොඩනැගිලි නිර්දේශය තමා අපි දෙන්නේ.කුළුණ ගොඩනැගිමට අනුමැතිය තමා අපි දෙන්නේ. එවිට අපි හිතමු ඩයලොග් ටෙලිකොම් ආයතනය කියනවා කුළුනක් අවශායි කියලා,ඒකට අවසරය දෙනවා TRC එකට අවශා ලිපි ලේඛන දුන්නහම,ආරක්ෂක අමාත්‍යාංශය,ප්‍රාදේශිය සභාව, මධ්‍යම පරිසර අධිකාරිය, ඔය ආයතන ටික ඔක්කොටම ගිහිල්ලා ක්‍රියා කරගෙන යනවා.එවිට සභාවට තියෙන පළවෙනි අයිතිවාසිකම තමා ඒ ටවර් එක ගොඩනැගීම සඳහා අවසර ලබා දෙන එක.දෙවෙනි එක තමා සභාවට ඕන ම ආයතනයකින් ව්‍යාපාර කරන ඕනම ආයතනයකින් ඒ ගාස්තුව ලබාගන්න පුළුවන්.දැන් අපි කතා කරපු රුපියල් 3000.00 ගන්න පුළුවන්.මේක අපේ ප්‍රදේශයේ තියෙන කුළුණු වලින් ඒ මුදල ලබා ගැනිමේ ගැටලුවක් නෑ.ඒ කරගෙන යන්නේ ව්‍යාපාරයක්.නැත්නම් එහෙම නොවුණොත් ඕනම කෙනෙක්ට කොළඹ තියෙන ප්‍රධාන සමාගම් සංස්ථාපනය කරලා, කොළඹ තියෙන සමාගම්වල ඒ අදහස මෙහෙට ගෙනැල්ලා ඒ සියලුම දෙනා නිදහස් වීම ගන්න පුළුවන්.එතකොට මේකේ මම දකින පැත්ත නම් එහෙම ගැනීමේ ගැටලුවක් නෑ.ව්‍යාපාරය සඳහා ගන්න රුපියල් 3000.00 ගැටලුවක් නෑ කියලා තමා මම නම් දකින්නේ.මගෙ අදහස ඒක තමා නැත්නම්, අපි ඒ දෙක කතා කිරීමක් තමා සිද්ධ කරන්නේ.

**සභාපතිතුමා :-**
අපි සම්මත කරගත්තේ ඒක තමා. මෙතැන් පටන් ඒක ලබාගන්න තමයි. මේක ගැසට් එකට දානවා කියන යෝජනාව. සම්මත කර ගත්තේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.09 යෝජනාව, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ 2026 වර්ෂය සඳහා බදු පැනවීමේ ගැසට් පත්‍රයේ ව්‍යාපාර බදු පැනවිමේ කොටසට අයත් ව්‍යාපාර නම් ලැයිස්තුවට දුරකථන කුළුණු සඳහා ගාස්තු ඇතුළත් කර සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.10සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**
**06.10. 2026 වර්ෂයේ මහා සභා රැස්වීම් සඳහා කරන සංග්‍රහයන් සඳහා එක් සභාවාරයකට රුපියල් 12,000.00 ක උපරිමයකට යටත්ව වියදම් දැරීම සුදුසු බවට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේකට අපිට පසුගිය දිනවලත් දැඩි වියදමක් ගියා.මේක මම පුද්ගලිකව ගෙනාපු යෝජනාවක් නෙමෙයි.බොහොම සීමා සහිතව තමා කෑම බීම ලබා දෙන්නේ.සභා කීපයකටම මම ගත්තා.අපිට සභාව කටයුතු සම්බන්ධව එවන අධීක්ෂණ වාර්තාවෙත් තියෙනවා.මේක එවල තියෙනව අපිට පළාත් පාලන ආයතන වල සභා කටයුතු අධීක්ෂණය විධිමත් කිරීම සඳහා සහකාර පළාත් පාලන කොමසාරිස්,රත්නපුර.මේකෙ තියෙනවා 04 යටතේ සභා වාර්තා හැකිතාක් සංෂිප්තව සකස් කරන ලෙස උපදෙස් දෙනු ලබන අතර, ඒකෙම තියෙනවා මහ සභාව වෙනුවෙන් සභා අරමුදලින් දිවා ආහාරය ලබාදීම සඳහා නීතිමය ප්‍රතිපාදන සැලසී නොමැති බවද කාරුණිකව දන්වමි.මේක පළාත් පාලන අමාත්‍යාංශයෙන් ආපු එකක්. ඒකත් එක්කම තමා මම මේ රු.12000.00ක් යෝජනා කරලා තියෙන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.10 යෝජනාව,2026 වර්ෂයේ මහා සභා රැස්වීම් සඳහා කරන සංග්‍රහයන් සඳහා එක් සභා වාරයකට රුපියල් 12,000.00 ක උපරිමයකට යටත්ව වියදම් දැරීම සුදුසු බවට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.11සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**
**06.11. ඇහැලියගොඩ, පලීගල, ගැටහැත්ත හා දම්මුල්ල මහජන පුස්තකාලයන් සඳහා "වෛද්‍යවරයා" සඟරාව මිලදී ගැනීමට යෝජනා කරමි.**

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වෛද්‍යවරයා සඟරාව ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද? පක්ෂයට සම්බන්ධ එකක්ද කියන එක අපි දන්නෙත් නැහැනේ.ඒ නිසා පොඩි හැඳින්වීමක් කළොත් ඒක වටිනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වෛද්‍යවරයා කියන්නේ සඟරාවක්.සඟරා ලියාපදිංචි කරනවානේ ISBM අංකයකින්.ඒකෙ තියෙන්නේ සෞඛ්‍ය තොරතුරු,සෞඛ්‍ය නිර්දේශ,වෙනත් නව තාක්ෂණික තොරතුරු වගේ දේවල්.කතෘ මණ්ඩලය ගත්තහම වෛද්‍යවරුන් ඉන්න කාර්ය මණ්ඩලයක්.දිලීන් මන්ත්‍රීතුමා කිව්වා වගේ පක්ෂයට සම්බන්ධයක් නැහැ. ඉල්ලීම් කරලා තියෙන්නේ පාඨකයින්.පාඨක ඉල්ලීම් අනුව ඇවිල්ලා පුස්තකාල වලින් තමයි මේක මහ සභාවට දාල තියෙන්නේ. ඒ අනුව මම හිතනවා මේක අපි ඉක්මනට ගමු කියලා.

**සභාපතිතුමා :-**
අපි පාඨක සමාජයක් ඇති කළා.ඒ පාඨක සමාජයේ ඉල්ලීමක් අනුව තමයි මෙම වෛද්‍යවරයා කියන සඟරාව ලබාගැනීමට සූදානම් වෙන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,පුස්තකාලයට පොතක් හෝ සඟරාවක් මිලදී ගැනීමේදී කමිටුවකින් නිර්දේශයක් අරන් නෙමේ ද දාන්නේ.එහෙම නිරිදේශයක් අරන් ද තියෙන්නේ.මොකුත් ක්‍රමවේදයක් නැද්ද ඒකට.

**සභාපතිතුමා :-**
පුස්තකාල කමිටුවක් තියෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නැත්නම් වෙනත් නම් වලින් එන්න පුලුවන්නේ.

**සභාපතිතුමා :-**
පුස්තකාලාධිපතිත් එක්ක තමා, ඒ සම්බන්ධව කටයුතු කරන්නේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.11 යෝජනාව,ඇහැලියගොඩ, පලීගල, ගැටහැත්ත හා දම්මුල්ල මහජන පුස්තකාලයන් සඳහා "වෛද්‍යවරයා" සඟරාව මිලදී ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.12සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමා:-**
**06.12.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ තීන්ත ආලේප කිරීම( පළමු අදියර) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,වැසිකිළි පද්ධතිය අලුත් කිරීම යෝජනාවක් සම්මත කළා, විශාල මුදලකුත් එක්ක.ඒකෙ ප්‍රගතිය තත්වය කොහොමද, දන්නෑ දැන්.

**සභාපතිතුමා :-**
අපි එහෙම යෝජනාවක් කළා. අපි ඇත්තට ම ඒ මුදල අපිට ඒක කරන්න බැහැ.අපි ඒක පළාත් පාලන ආයතනයට දීල තියෙනවා. ලොකු මුදලක් .ඒක නිසා මේවන විට අපිට පුලුවන් වුණා, මුදල් ප්‍රතිපාදන ලැබෙනකන් අපේ පුස්තකාල ගොඩනැගිල්ලේ පිටිපස සම්පූර්ණයෙන් ඉවරයි.දැන් එම පුස්තකාල වැසිකිළියට අමතරව අලුතින්ම සම්පූර්ණ ටයිල් අල්ලපු වැසිකිළි පද්ධතියක් හදල ඉවරයි. ඒක දැන් අපිට පුළුවන් භාවිතා කරන්න. ඊට අමතරව දැන් අපි මැණික් පොළේ එක අවසාන අදියරේ තියෙන්නේ.ඒක දැන් මහජනයාට දෙන්න පුලුවන්.සභාවේ අරමුදලින් කළ නොහැකි නිසා අපි ඒක පළාත් සභාවට යොමු කළා .අපි හිතනවා ඒකත් හැකි ඉක්මනින් ලබාදෙන්න පුළුවන් වෙයි කියලා.ඒක හින්ද ලොකු මුදලක් සභාවෙන් වියදම් කරන්න අමාරුයි .

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දැන් මෙතන වෙළදාම් කටයුතු කරන අයට ලොකු අපහසුතාවයකට පත්වෙලා තියෙනවා, වැසිකිළිය.මේක විශාල මුදලක් නම් තාවකාලික පදනම මත හරි යම් මට්ටමකට, පාවිච්චි කරන්න පුළුවන් මට්ටමකට ගෙනැත් දෙන්න පුලුවන් නම් හොඳයි.

**සභාපතිතුමා :-**
ඇත්තටම අපි ඒක මේ ටයිල් ටික මාත් ගිහිල්ලා බැලුවා පුද්ගලිකව.ඒවා අලුතින්ම කඩල ටයිල් අල්ලන්න ඕනි.සුද්ද කරන්න බැහැ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එතන පල්ලෙහාට බැස්සහම හරි අප්‍රසන්නයි.

**සභාපතිතුමා :-**
මමත් ගිහින් බැලුවා.එතන සුද්ද කරන්න වෙන ම කෙනෙක් දාල තියෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,වෙළඳ ව්‍යාපාර කරන අය ලොකු අපහසුතාවක ඉන්නේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.12 යෝජනාව,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ තීන්ත ආලේප කිරීම( පළමු අදියර) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.13සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා:-**
**06.13.ඇහැලියගොඩ මහජන පුස්තතාලයේ තීන්ත ආලේප කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
ඇහැලියගොඩ පුස්තකාලයේ අපි මේවන විට ගොඩනැගිල්ලේ වහලය ගහලා වැසිකිළි පද්ධතිය හදලා තියෙන්නේ.දැන් අපි ඒක පාඨකයන් සඳහා දෙන්න පුළුවන්.නමුත් අපි ඒක බැලුවේ ලොකු මුදලක් යන්නේ නැහැ පොත් පත් සහ සඟරාවල් ඉවත් කරලා තියෙන නිසා,අපිට ඒ එක්කම තීන්ත ටිකක් ගාන්න පුළුවන් වුණොත් හොඳයි කියලා හිතලා තමා මේ යෝජනාව ඉදිරිපත් කළේ. ඒ නිසා තමයි මේ යෝජනාව ඉදිරිපත් කළේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.13 යෝජනාව,ඇහැලියගොඩ මහජන පුස්තතාලයේ තීන්ත ආලේප කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
06.14සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ යෝජනාව.

**සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා:-**
**06.14.ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ලේ වැහිපීලි අලුත්වැඩියා කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මම යෝජනා කරමි.**

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමනි,මෙම යෝජනාව ඉතා වැදගත් එකක්.අපේ පැත්ත නිරන්තරයෙන් වැසි තිබෙන පැත්තක්.පොළේ වෙළඳමහතුන් හා පාරිභෝගික ජනතාව නිරන්තරයෙන් පීඩාවට පත්වෙනවා.මෙය කාලෝචිත යෝජනාවක්.ඒ වගේ ම ගොඩනැගිලි දෙක අතර තියෙන පරතරය නිසා අපහසුතාවයට පත් වෙනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.14 යෝජනාව,ගැටහැත්ත බහුකාර්ය ගොඩනැගිල්ලේ වැහිපීලි අලුත්වැඩියා කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.15.උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
**06.15. සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම සඳහා මාර්ග නඩත්තු ඒකකයක් ආරම්භ කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා|:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම මේක අයවැය යෝජනාවට දාපු අපේ කමිටුවේ වැඩක්. අපිට තියෙනවා මාර්ග එක්දහස් අටසිය ගාණක්.ඒ අතරින් RDA මාර්ග සහ පළාත් මාර්ග ඇරුනහම ඒ සියලුම මාර්ගවල නඩත්තු කටයුතුවල වගකීම තියෙන්නේ ප්‍රාදේශිය සභාවට.අපිට අයිති කාපට් පාරවල් තියෙනවා. කොන්ක්‍රීට් පාරවල් තියෙනවා. ගුරු පාරවල් තියෙනවා. එම පාරවල් ටික අබලන් වුණාට පස්සේ,කැඩුනට පස්සේ,කැඩී ගොස් අවසානයේ යාන්නම බැරි තත්වයට ආවට පස්සේ තමයි අපි සාමාන්‍යෙයන් යෝජනාවක් දාල සංවර්ධනය කරන්නේ.නමුත් මෙහිදී කාපට් පාරවල් වල තාර පාරවල් සහ කොන්ක්‍රීට් පාරවල් වල වලවල් ඇති වීගෙන එනකොට ඒවා තවදුරටත් වර්ධනය වෙන එක වළක්වලා,ක්ෂණිකව මැදිහත් වෙලා,වසා දමන්නයි.ඊට පසු අපේ වරිපනම් සීමාවේ තියෙන පාරවල් ටිකට ප්‍රමුඛතාවයක් දෙන්න වෙනවා.වරිපනම් සීමාවේ තියෙන පාරවල් සුද්ද කරන්න.ඒත් එක්කම අපෙන් ඉල්ලීම් කරනවා ජල මාර්ග හදන්න පාරවල් කඩන්න අපෙන් ඉල්ලීම් කරනවා.අපි ඒකට පසුගිය සභා වාරයේදී යන්ත්‍රයක් මිලදී ගැනීමට යෝජනා කරගත්තා. පාරවල් දෙපැත්ත ශුද්ධ කිරීම වගේ සියලුම කාරණා ඒකරාශී කරලා මාර්ග නඩත්තු අංශයක් ආරම්භ කරන්නත්,ඒ සඳහා අපි 2026 අයවැයේ ප්‍රතිපාදන වෙන් කර ගත්තා.ඒකට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගන්න අපි යෝජනාවක්

දැම්මා.අන්න ඒ වගේ සියලුම කාරණා ඒකරාශී කරලා, අපි මාර්ග නඩත්තු ඒකකයක් ආරම්භ කරන්න.ඒකට අපි 2026 මුදල් වෙන් කර ගත්තා, ඒකට අවශ්‍ය යන්ත්‍රෝපකරන ගන්න.ඒ සඳහා තමා මේ යෝජනාව මං ඉදිරිපත් කරන්නේ.කාර්මික නිලධාරී දෙදෙනාගේ අධීක්ෂණය යටතේ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, උපසභාපතිතුමාගේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක්.ඒ වගේම මම මේ වෙලාවේ සභාවේ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ පළවෙනි කොටසේ 3 තියෙනවා, "එක් එක් ප්‍රාදේශීය සභා ප්‍රදේශ සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාව, එම ප්‍රදේශය ඇතුළත පළාත් පාළන ආයතන විය යුතු අතර, මහජන සෞඛ්‍යට, පොදු උපයෝගිතා සේවාවන්ට සහ පොදු මං මාවත්වලට ද" ආදී වශයෙන් තියෙනවා.මම යෝජනාවක් දැම්මා, මේ වෙලාවේ අපිට ඇහැලියගොඩ නගරයට ඔසුසැලක් අවශ්‍යයි කියලා.ඒ යෝජනාව මේකට ඇතුළත් වෙලා නැහැ. මට ඒ පිළිබඳව බැහැර කළ ලිපියක් ලැබිලත් නැහැ.ගිය ගමන මම එකක් දැම්මහ ම ඒක ප්‍රතික්ෂේප වීමට හේතුව තැපැලෙන් එවලා තිබුණා.අපි අනවශ්‍ය වියදම් කපාහැරිය යුතුයි.හැබැයි අනවශ්‍ය වියදම් කපා හරිනව වගේම තමයි, අත්‍යවශ්‍ය දේට වියදම් කළ යුතුයි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සභා වාර්තා එක්කම ඒ කවරෙ මයි එවුවේ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගිය පාර මට රෙජිස්ටර් තැපැලේ ලිවුම ආවා.ඒ නිසා මම මේ වෙලාවේ කියන්නේ මෙන්න මේ කාරණාව.මම 2009 මම සභාවේ සිටි කාලයේ මේක අවශ්‍යයි කියලා මම දැම්මා.මොකද මේ ප්‍රදේශයේ විශාල, දැන් අපි දන්නවා ඖෂධ ගොඩක් අඩුයි.මේ ඇහැලියගොඩ බල ප්‍රදේශයේ පමණක් නෙවෙයි,පන්විල, දික්දෙනිය, දිගෝව,ගොඩගම්පල යනාදී ප්‍රදේශවලට. මේ පැත්තෙන් ගත්තහ ම දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මිනිස්සුත් මේ නගරයට එනවා.මේ නගරය තුළට මේක අත්‍යවශයයි කියන යෝජනාව මං කරා එදා.එදා ඒක කරාට පස්සේ, ඒක සභාවෙන් කරන්න බෑ.ඒක අපි දන්නවා.නමුත් සභාපතිතුමා අපි මාසයකට සැරයක් මෙතන්ට ඇවිත් මිනිස්සුන්ගේ ප්‍රශ්න කතා කරන්න වෙනවා.කතා කළේ නැත්නම් මොනවද කතා කරන්නේ සභාවේ.නැත්නම් මේ අහවල් ගුණසේකර මහතාගේ නිවස අසල සිට ප්‍රේමදාස මහතාගේ නිවස අසල දක්වා පාර කියල, පාරවල් ම මේකේ දාල වැඩක් නැහැනේ. මේවගේ යෝජනාවක් අපි ගෙනාවට පස්සේ එවකට හිටපු ගරු තිලක් රෝහණ සභාපතිතුමා, මම යෝජනාව ගෙනාවට පස්සේ බැහැර කළේ නෑ.මේ යෝජනාව ස්ථිර කරන්නේ එවකට හිටපු උපසභාපතිතුමා වන ලියනගේ මැතිතුමා.මේ මේ අදහස් අරගෙන සභාවට ඉදිරිපත් කරන්න.ඊට පස්සේ මේ උධෘතය අරගෙන සභවෙන් ලියුමක් ගහලා අමාත්‍යංශ ඇමතිවරයාට ලබාදුන්නා. ලබා දුන්නට පස්සේ ක්‍රියාත්මක කරන එක එහෙ එකක්.ඒ නිසා කරුණාවෙන් මම ඉල්ලනවා ,පුළුවන් නම් අපිට බැහැර කරන්නේ නැතුව මේ සභාවේ මන්ත්‍රීවරු වශයෙන් ගේන්නේ වැදගත් යෝජනා,මේ යෝජනාවල් සභාවේ අපිට ක්‍රියාත්මක කරන්න,ඔබතුමා මේවා ක්‍රියාත්මක කරන්න වෙර දරනවා.ඒක අපි දන්නවා.මේ පුටුවේ මෙතන වාඩි වුණොත්,මේ සභාවේ අපි ඇදගෙන ගියෙත්,අපි විපක්ෂය.විපක්ෂයේ අපි කණ්ඩායම්, නමුත් අපි විපක්ෂයක් ලෙස ගන්න තීරණ (පැහැදිලි නෑ) නමුත් මේ වගේ අවස්ථාවකදී අපි කවදාවත් අපි සුජීව මන්ත්‍රීතුමා කිවුව වගේ විරුද්ධ වෙන්නෑ.මම මෙතනින් වාඩි වුණොත් මේ2026 ජනවාරි මාසෙ ඉදන් මේ සභාව තුළ අපි ඉතාමත් වැදගත් විදිහට තීරණ ගන්නවා විනා, අනිත් සභාවලට ආදර්ශයක් දෙන්න ඕනි අපි.ඒ නිසා මේ සභාවේ මෙතන අසුන් ගත්තේ මම ඊළඟ සභා වාරයේ දී මම මට අවශ්‍ය තැන මම ඉන්නවා.මේ ගැටලුවත් විසඳන්න එපැයි.අපේ දිලීන් මන්ත්‍රීතුමා අපි අවසානයේ තීරණය කළා.අපි ගත්තේ දේශපාලන තීරණයක් නිසා.ඉතින් ගරු සභාපතිතුමා මේ පිළිබඳව ඔබතුමාගේ ගෞරවනීය අවධානය මේ සඳහා යොමු කරන්න.ඊළඟ කාරණාව තමයි අපේ තවත් එක යෝජනාවක් දැම්මා ,ඇහැලියගොඩ වත්තේ කෝවිල පාර .ඒ සම්බන්ධයෙන්

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,රීති ප්‍රශ්නයක්.අපි මේ යන්නේ යථා පරිදි කල් දී ඇති යෝජනා. මම හිතනවා වෙනත් අදහස් දැක්වන්න තියෙනව නම් .මන්ත්‍රීතුමන්ලගේ වෙනත් අදහස් දැක්වීම් තියෙනවා.මන්ත්‍රීවරයෙක් නයාපත්‍රයට දාන්න යෝජනාවක් දැම්මට පස්සේ ඒක දාන්නෙම,ඒක න්‍යාය පත්‍රයට ඇතුලත් වුනේ නැත්නම් ඒක පැහැදිලි කරල ලිපියක් යවනව. ඒ පැහැදිලි කිරීමේ ලිපිය මම හිතන්නේ එතුමා ගාව තියෙන්න ඇති.නැත්තන් අපිට ඒක දෙන්නත් පුළුවන්. නැවත වතාවක් ඒක හම්බුනේ නෑ කියල කියනව නම්.ඒ කියන්නේ ඔබතුමාගේ දකුණු පස සිටින මන්ත්‍රීතුමන්ලාගේ ලිපි තමයි අපි තැපැල් කරන්නේ නැත්තේ. අනිත් ටික ලියාපදිංචි තැපැලෙන් තමයි අපි යැවුවේ.මම රීති ප්‍රශ්නෙකට නැගිට්ටේ.ඒ නිසා මම ඉල්ලා සිටිනවා වෙනත් අදහස් දැක්වීමේදී අපි ඒක කරමු ගරු මන්ත්‍රීතුමා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ වගේම සභාපතිතුමා කෝවිල පාර අපිට දාලත් නෑ.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ යෝජනාව මම කලින් සභාවෙත් දාල තියෙනවා.මගේ යෝජනාව දාන්න බෑ කියල ඒක අයින් කරලා තිබුණා.එම යෝජනාවට මම පෞද්ගලිකව ලිපියක් හින්දු කටයුතු අමාත්‍යංශයට යොමුකරලා ගරු සුන්දරලිංගම් ප්‍රදීප් ඇමතිතුමාටත් යොමුකරලා තියෙනවා. ආගමික ස්ථානවල සංවර්ධන කටයුතු සභාවෙන් කරන්න බෑ කියලා රීති වලත් තියෙනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ පිළිබඳ සභාපතිතුමා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න .මේ වගේ යෝජනාවක් ආවම බැහැර කිරීම නෙමේ වෙන්න ඕන ගරු සභාපතිතුමා.මගේ යෝජනාවක් විදිහට නෙමේ, ඔබතුමාගේ යෝජනාවක් වශයෙන් හරි ඒක ක්‍රියාත්මක කරන්න.මෙ ඉතාම වැදගත් යෝජනාවක් ගරු සභාපතිතුමා, විශ්වාසනීය ඒවගේම ගුණාත්මක බෙහෙත් ටිකක් ලබා ගන්න පුළුවන් ඇහැලියගොඩට.මෙයින්

මහත් ප්‍රතිලාභයක් ලැබෙන බව මම කියනවා.මේ නිති රීත් මධ්‍යයේ වුනත් මේ අවස්ථාව ලබා දිම ගැන ස්තූතිවන්ත වෙනවා.

**සභික සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,උපසභාපතිතුමා මේ පිළිබඳ සමාජ මාධ්‍යයේ මේ ගැන කතා කරලත් තියෙනවා.සභාවේ කතා කරන්න කලින්. ඒක හොඳයි.අපි සතුටු වෙනවා.මමත් කැමතියි.මම අහන්න කැමතියි දැන් ඔබතුමා විස්තරයක් කළා මාර්ග පද්ධතිය නඩත්තු ඒකකයක් හදන එක ගැන.එතකොට ඒ නඩත්තු ඒකකය සඳහා අපිට දැන් කණ්ඩායමක් අවශ්‍යයිනේ. ඒ අය බඳවා ගන්නවා ද මේ වර්ෂයේදී?.බඳවා ගන්නවානම් කවුද? කණ්ඩායමක් බඳවා ගන්නවාද?මේ අවුරුද්දේ බඳවා ගන්නවාද? විස්තරයක් දැන ගන්න කැමතියි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දැනට අපේ සිටින සෞඛ්‍ය කම්කරුවන් මේකට යොදවනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දැනට අපේ සිටින සෞඛ්‍ය කම්කරුවන් මාර්ග නඩත්තු ඒකකයට ගන්නවා කියලද ඔබතුමා කියන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔව්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
එතකොට සෞඛ්‍ය කම්කරුවන් මාර්ග නඩත්තු ඒකකයට ගන්න ක්‍රමවේදයක් තියෙනවද සභාපතිතුමා?.

**සභාපතිතුමා :-**
මේ යෝජනාව අපිට සභාවේ තීරණය කරන්නත් අමාරුයි**.**

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක සමාජ මාධ්‍යවල තීරණය කරලා තිබුණා.

**සභාපතිතුමා :-**
සමාජ මාධ්‍ය කියන එක ඇත්ත නෙමෙයිනේ ගරු මන්ත්‍රීතුමා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, උප සභාපතිතුමාමයි ඒක පළ කරලා තිබුණේ. ඒ වන විට සභාවේ තීරණය කරලා තිබුණෙත් නැහැ. අපිට ඒ වෙලාවේ අදහස් දක්වන්න ගියෙත් නැහැ. නමුත් අපිට මේ වෙලාවේ අදහස් දක්වන්න අවස්ථාවක් හම්බවෙලා තියෙනවා. උපසභාපතිතුමා කියනවා ඒ ව්‍යාපෘතිය සඳහා සභාවේ ඉන්න සෞඛ්‍ය කම්කරුවන් තමයි මාර්ග කම්කරුවන් විදිහට එකතු කරගෙන මේ මාර්ග නඩත්තු ඒකකය පිහිටුවන්නේ කියලා. ඒක එහෙමද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම මම මේක කාර්මිත නිලධාරී මහතාගෙන් ඇහුවා. එතුමා කිව්වා කුමක් හෝ කාර්යයක් තියෙනවා නම්, අපි ගත්තොත් පාරක්, කාපට් පාරවල් දෙකක් තියෙනවා, බුළුගහපිටිය පාර අඹනඹුව පාර,වියලගොඩ පාර කියල.අපි පාරවල් ටිකක් ඉස්සෙල්ලා නිශ්චිත කරගෙන, ඒ පාරවල් වල අපිට මාර්ග නඩත්තු අංශයෙන් යනකොට අපිට පුළුවන් ඒ වැඩේට විතරක් අපිට සේවකයින් බඳවා ගන්න පුළුවන් ක්‍රමවේදයක් තියෙනවා.අවශ්‍ය නම් කාර්මික නිලධාරී මහතා ගෙන්වලා අපිට පුළුවන් වැඩි විස්තර අවශ්‍ය නම් දැනගන්න.

එතන ඉන්නවා තත් කාර්යය පදනමේ ඉන්න අය.තාවකාලික පදනමේ ඉන්න අය.ඔවුන් යොදව ගන්න පුළුවන්.ඔවුන් බැඳිලා සිටිනවාප්‍රධානියා කියන රාජකාරි කරන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ අනුව ඔවුන්ට අමතර ගෙවීමක් සිදු කරනවාද ,අමතර ගෙවීමක් නැතිව සෞඛ්‍ය කම්කරුවන්ට අරමුණ වෙනස් කරන්න පුළුවන්ද ?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ අවශ්‍යතාවය මත අරමුණ වෙනස් කරන්න පුළුවන්

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අවශයතාවය මත සේවා පහසුකම් ලබා ගන්න පුලුවන්.අමතර ගෙවීමක් කරන්නෑ.යෝජනාව අපි අගය කරනවා.මේ වගේ වැඩ වෙන්න ඕනි.ඒ ව්‍යාපෘතිය කරනකොට ඒකට අවශ්‍ය කණ්ඩායමක් බඳවා ගන්නේ කොහොමද ,වැටුප් ගෙවනවද,සභා අරමුදලින් කොපමණ දායකත්වයක් දරණවද, ඒ ව්‍යාපෘතියේ අපිට පොඩි පැහැදිලි කිරීමක් තිබුණා නම් හොඳයි මීට වඩා.

**සභාපතිතුමා :-**
අනිවාර්යයෙන් අපිට මීට වැඩිය පුළුල්ව විග්‍රහ කරන්න වෙනවා.අද යෝජනාවක් දාන්නේ මේක අපි කරන්නේ කොහොමද කරන්නේ කියලා පසුව අපි සාකච්ඡාවට ගමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මාර්ග නඩත්තු ඒකකයක් පිහිටුවීමට පනත අනුව ප්‍රතිපාදන තියෙනව නම්.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ ප්‍රාදශෙිය සභාවේ ඉස්සර තිබිලත් තියෙනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ අනුව ප්‍රතිපාදන තියෙනවා.කිරිමේ ගැටලුවක් නෑ කියලනේ ඔබතුමාල කියන්නේ.ඒ ගැන පොඩ්ඩක් අපිට පැහැදිලි කිරීමක් කරන්න.ඒ වගේම අපේ රංජිත් වික්‍රමසිංහ මැතුතමා කිවුවා සභාපතිතුමනි, එයා යෝජනා කිහිපයක් දාල තියෙනවා, ඒ වගේ ම ජිනේන්ද්‍රානි මන්ත්‍රීතුමිය යෝජනාවක් දාල තිබ්බා.ඒක එතුමිය පහළ පලවෙනි කෝවිලට දාපු යෝජනාව මේ සභාවේ කතා කරලා යෝජනාවක් සම්මත වුණා.දෙවෙනි කෝවිලට දාපු යෝජනාව සභාවේ කතා කරන්න දුන්නේ නැහැ. මම දන්නෑ. අපි මුලින්ම මේ ගැන සාකච්ඡාවක් කළානේ සභාපතිතුමා. ඒ යෝජනා ප්‍රතික්ෂේප කරන්න එපා.අපි ආණ්ඩු පක්ෂයේ හරි ,විපක්ෂයේ හරි,කවුරු හරි දාපු යෝජනා සමහර වෙලාවට සභාවට ගේන හොඳ යෝජනාවක් වෙන්න තියෙනවා.ඒක මගඇරීමක් තමයි මේ ඔබතුමා හරි උපසභාපතිතුමා හරි එකතු වෙලා, මේ අපි දාපු යෝජනා ප්‍රතික්ෂේප කිරීමෙන් සිද්ධ වෙන්නේ. ඒ නිසා සභාපතිතුමනි,අපිට වේදිකාව හැදිලා තියෙන්නේ මේ ප්‍රාදේශීය සභාව තුළ කතා කරන්න විතරයිනේ මහජනතාව වෙනුවෙන් ඒක හරස් කරන්න එපාෙඅපේ යෝජනාත් මේ න්‍යාය පත්‍රයට දාන්න.ඒක මග අරින්න එපා ගරු සභාපතිතුමා.

**සභාපතිතුමා :-**
අපි පන්සල් සහ කෝවිල් දාල අපිට නිකන් කාලය යනව විතරයි මෙතන.වාර්තාවලත් කියල තියෙනවා බොහොම සංෂිප්තව කරන්න කියලා.කෝවිල් කියලා තිබුණොත් අපිට ගරු මන්ත්‍රීතුමා මේ සංවර්ධන යෝජනා කරන්න බෑ.පන්සලකට අපි කියමුකෝ යෝජනාවක් දැම්ම කියලා.ඒත් කරන්න බෑ. දාල අපිට කාලය ගත කරන්න පුළුවන්. නමුත් අපිට ඒකට අපිට ප්‍රතිපාදන දෙන්න, පනත්වල තියෙනවා, ආගමික ස්ථාන වලට මැදිහත් වෙන්න බැහැයි කියලා. කාලය යන එක තමයි වෙන්නේ.(ඝෝෂාව)

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ යෝජනා පිළි අරගෙන, ඒ යෝජනා අපිට කරන්න බැහැ කියලා අපි දන්නවනේ. නමුත් ඒ අදලා පාර්ශවයන්ට දැනුම්දීමක් සිදුකළ යුතුයි.ගරු සභාපතිතුමනි න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න අවස්ථාව ලබාදෙන්න.අපි මන්ත්‍රිවරු විදිහට මේ ප්‍රශ්න කතා කරන්න ඕනනේ.මං දන්නෑ මේවා සභාවේ කතා කරාහම නාරද හාමුදුරුවො තරහ වෙයිද කියලා.හැබැයි නාරද හාමුදුරුවන්ගේ පාර හදනකොට අපි කැමත් වුණානේ සභාපතිතුමනි.

**සභාපතිතුමා :-**
ඒක ඒ යෝජනාව එපා කියලා කිවුවා.ඒක කරොත් එහෙම අපි ඔඩිට් වෙනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
අපි ඒ වෙලාවේ ප්‍රකාශ කලෙත් නැනේ ඒ යෝජනාව ගැළපෙන්න නෑ කියලා.මං ඒ වෙලේ කිවුව විතරයි මේක ගැළපෙනව නම් කරමු කියලා.අපිට න්‍යාය පත්‍රයට ඇතුලත් කරන්න අවස්ථාව දෙන්න.අපිට ප්‍රශ්නයක් නෑ මේක සභාවෙන් කෙරුන් නැති වුණාට.ඒ ගැන පොඩි ඉදිරි ක්‍රියාමාර්ගයක් ගන්න.ඒ හින්දා අවස්ථාව දෙන්න සභාපතිතුමා මේ යෝජනා න්‍යාය පත්‍රයට දාන්න.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මාර්ග නඩත්තු කරන එක හොඳ වැඩක්.මාර්ග නඩත්තු කරන කොට අපිට තියෙනවා A ශ්‍රේණියේ හා B ශ්‍රේණියේ මාර්ග තියෙනවා.මධ්‍යම ආණ්ඩුවෙන්, පළාත් සභාවෙන් දැනට නඩත්තු කරන මාර්ග තියෙනවා.කොහොමද මේ නඩත්තු ඒකකය ස්ථාපිත කරන්නේ, ප්‍රාදේශීය සභා පාරවල් විතරද? නැත්නම් දෙකම තියෙන නිසා ඒ අපේ වැඩපිළිවෙල කොහොමද?

**සභාපතිතුමා :-**
අපිට පළාත් මාර්ග මේකෙන් අපිට කරන්න බැහැ. අපිට ඇත්තටම කරන්න පුළුවන් අපේ පනතේ මංමාවත් යටතේ අපිට කරන්න පුළුවන් අපේ ප්‍රාදේශීය සභාවේ ගැසට් එකට දාල තියෙන පාරවල් පමණයි.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,උපසභාපතිතුමා උදාහරණයට ගත්තේ, පලීගල පාර.ඒක විෂය පථය අනුව කරන්න බැහැ.ඒකයි මම මේ ප්‍රශ්නය මතු කළේ. ඇත්තට ම නඩත්තු වෙන්න ඕනේ.පාරවල් ටික ඇත්තටම දුර්වල වෙවී යන්නේ .ඒක නඩත්තුවක් නොවුනොත් උපසභාපතිතුමා කියපු අදහස තමා අනාගතයේ නිර්මාණය වෙන්නේ.ඒ නිසා වැඩපිළිවෙලක් යෝජනා කරනකොට ඒකට අපිට සංෂිප්ත වාර්තාවක් අවශ්‍යයි, මේන්න මේක තමා කරන්නේ කියලා.සමාජ මාධ්‍ය වල එතුමා ලොකු ප්‍රචාරයක් දීල තිබුණා.ඇත්තට ම ඒක හොඳයි.විෂය පථය අවබෝධයක් තියෙන්න අවශ්‍යයි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.15 යෝජනාව, සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය නඩත්තු කිරීම සඳහා මාර්ග නඩත්තු ඒකකයක් ආරම්භ කිරීමට සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
දැන් වෙලාව ප.ව 12.25 යි.විවේක කාලයක් සඳහා සභාව ප.ව 1.00 දක්වා කල් තබනවා.

විවේක කාලයෙන් පසුව නැවතත් සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

**සභාපතිතුමා :-**
6.16. උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායකමැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායකමැතිතුමා:-**
**06.16. ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ වහලය මත සූර්ය කෝෂ සවි කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව අපි අයවැය යෝජනාවටත් දැම්මා.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවආදර්ශයක් විදිහට අපි පුනර්ජනනීය බල ශක්ති ක්‍රමයට යොමු වෙලා, ජාතික බලශක්ති පද්ධතියට අපි යම් දායකත්වයක් දීල,සභාවක් විදිහට අපිත් සූර්ය කෝෂ සවි කරල,එහි දෙකක් තියෙනවා.ජාතික පද්ධතියට දෙන්නේ නැතිව භාවිතා කරන ඒව තියෙනවා.බැටරි භාවිතා කරලා ජාතික පද්ධතියට දාන ඒව තියෙනවා.ඒ විදිහට සූර්ය කෝෂ සවි කිරීමට යෝජනා කරනවා.අයවැයෙත් අපි ප්‍රතිපාදන වෙන්කර ගත්තා. ඉදිරියේදී විදුලි වාහන කියන එක ලංකාවේ දැන් ගොඩක් ජනප්‍රියයි. ප්‍රාදේශිය සභාව විදිහට ඒක චාර්ජ් කිරීමට චාර්ජින් පොයින්ට් මම හිතන්නේ අපිට 15ක් විතර මොකක් හරි ආයතනයකින්, ස්ථාන තියෙනවා.එය ඇත්තටම ද්විතීක අවස්ථාව. සූර්ය කෝෂ සවිකරල අපිට ඒවායින් ආදායමක් ලබාගන්නත් පුළුවන්. ඉතින් ඒක මම හිතනවා කාලෝචිතයි කියලා. මේක දැනට අපහසුයි. නමුත් මේක කොහොමහරි ක්‍රියාත්මක කරන්න කියලා යෝජනා කරනවා.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂබණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,උපසභාපතිතුමාගේ යෝජනාව ඇත්තටම හොඳ යෝජනාවක්.අපිට සූර්ය පැනල මගින් විදුලිය ලබාගන්න පුළුවන් නම්, ඒකට යන වියදම අපිට අවුරුදු 05ක් යනකොට ඒ වියදම අපිට හම්බ වෙනවා.එවිට අපිට පැනල් සඳහා අවුරුදු 12 ක වගේ වගකීමකුත් දෙනවා. අවුරුදු 05ක් යනකොට අපිට වියදමත් හම්බ වෙනවා, ආදායමත් සමඟ. ඇත්තටම හොඳ ව්‍යාපෘතියක්.ඉදිරියට මෙය කරගෙන යන්න පුළුවන් නම් උපසභාපතිතුමාගේ ව්‍යාපෘතිය ඇත්තටම ඉතා හොඳ ව්‍යාපෘතියක් වෙනවා ඉදිරියට.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම අපි නවීන තාක්ෂණයත් එක්කත් මුසු වෙන්නත් ඕනි.ඒත් එක්කම එය කාලෝචිතයි.මම හිතන්නේ විදුලිබල මණ්ඩලයෙන් දැන් ඒ සඳහා ගෙවන ගෙවීම් පවා අඩු වෙලා තියෙනවා. ඒ රේට් එකත් එක්ක ගළපන කොට අපේක්ෂිත ඉලක්ක වලට ළඟා වෙන්න පුළුවන් ද කියන එක මම අහන්න කැමතියි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇත්තටම ඒක එහෙම ප්‍රශ්නයක් තියෙනවා තමයි.ඒක වෙන්නේ ජාතික විදුලිබල පද්ධතියට එවෙලෙම දෙනවනම්.දවල් කාලයේ දෙනව නම්.නමුත් බැටරි පද්ධතියක් සකස් කරලා මෙය රාත්‍රියේදී දෙන්න ගත්තොත් එහෙම ඔවුන් අදාළ උපරිම මිල දීල ගන්නවා.ඒත් එක්ක ම ජාතික, රජයේ ප්‍රතිපත්තිය තියෙන්නෙත් පුනර්ජනනීය බල ශක්තියට යන්න.මම හිතනවා අපිට මේක රජයේ ප්‍රතිපත්තිත් එක්ක ගැටළුවක් වෙන එකක් නැහැ කියලා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ යෝජනාව හොඳයි එකඟයි.නමුත් අපිට එහෙම කරන්න පුළුවන්නම් ඒ යෝජනාවට එකඟයි.හැබැයි අර පදනම මත.ඒ කොස්ට් එකත් එක්ක පවත්වා ගන්න පුළුවන් නම් ඒ යෝජනාවට එකඟයි.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.16 යෝජනාව, ප්‍රාදේශිය සභා ගොඩනැගිල්ලේ වහලය මත සූර්ය කෝෂ සවි කිරීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.17. උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ යෝජනාව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායකමැතිතුමා:-**
**06.17.මාහර බෝමළුව කොරටුව වත්ත පාර සංවර්ධනය කිරිම සඳහා පවතින නීතිමය ගැටලු විසඳීම සඳහා යෝජනා කරමි**

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැණිකේ මැතිනිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

එම යෝජනාවමගේ වසමට අයත් පාරක.මහි නිවරදි කිරීමක් කරන්න ඕනේ.මෙහි සඳහන් වෙන්නේ කොරටුව වත්ත පාර කියලා.ඒය පිට කොරටුව ලෙස සංශෝධනය විය යුතුයි.සභාපතිතුමනි මෙය 1971-05-28 සහ 1993-11-26 ගැසට් පත්‍රෙය සභාවට අයත් පාරක් ලෙස ලියාපදිංචි කර තිබෙනවා. විශාල ගැටළු ප්‍රමාණයක් තියෙනවා ගම් වාසීන් කියන විදිහට. සභාවට අයත් පාරක් එක පුද්ගලයෙක් විසින් එයාට හිතුමතේට පාරක් දීලා තියෙනවා.දැනට ඒ පාර එයා දීලා තියෙන්නේ වෙන් අයට අයිති ඉඩම්වලින්.ඒ නිසා ඒ ගේ ඉඩමටත් නඩුවක් යනවා කියලා, හිටපු ලේකම්තුමා එක්ක කතා කරන කොට කීවේ ඒ නඩුව ඉවර වෙනකම් මේ සඳහා කිසි දෙයක් කරන්න බෑ කියලා.නමුත් මෙතන ලොකු ප්‍රශ්නයක් තියෙනවා.මොකද සභාවට අයිති පාරක්.ගෙවල් 20ක ජනතාව භාවිතා කරන පාරක්.ඒ පාරේ පයින් යන්න බැහැ මඩ ගොහොරුවක්.ළමයි ඉස්කෝලෙ යනවා. මාස 06ක් තිස්සේ සභාවට මිනිස්සු ලියුම් 02ක් දීල තියෙනවා.මං ලේකම්තුමාගෙන් විශේෂයෙන් ම ඉල්ලා සිටිනවා මේකට අවශ්‍ය නීතිමය කටයුතු කරලා ඒ ජනතාවට ඒ පාර නිවරදි ආකාරයට ලබා දීලා සංවර්ධනය කරන්න කියලා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.17 යෝජනාව, මාහර බෝමළුව පිටකොරටුව වත්ත පාර සංවර්ධනය කිරිම සඳහා පවතින නීතිමය ගැටලු විසඳීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.18.සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.18.බ/ කරඳන පේරවත්ත පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම මාර්ගයේ මුල් කොටස් සංවර්ධනය කර තිබෙනවා.අවසන් කොටසත් සංවර්ධනය කරමින් පවතිනවා.පාලම කොටස අබලන් වෙලා තියෙනවා.පාලම දක්වා යන කොටස සංවර්ධනය කළ යුතුව තිබෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම හිතන්නේ එම මාර්ගයේ සාමාන්‍ය ත්‍රීරෝද රථ හා සාමාන්‍ය වාහන ගමන් කළත් ,වෙනත් වාහන ගමන් කරන්න බැරි තත්වයකට පත්වෙලා තියෙනවා.වර්ෂාවත් සමඟ දැඩි සෝදා පාලුවකට ලක්වෙලා තියෙනවා වටේ කොටස. ඒ මන්ත්‍රීතුමාගේ යෝජනාවට ප්‍රමුඛත්වය ලබාදෙන්න පුළුවන් නම් හොඳයි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.18 යෝජනාව, බ/ කරඳන පේරවත්ත පාර සංවර්ධනය කිරීමට සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.19.සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.19.චින්තක මහතාගේ තේ ඉඩම අසල සිට ඉදිරියට පහළ මල්වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම මාර්ගයේ බොහෝ කාලයකින් සංවර්ධන කටයුත්තක් සිදු වෙලා නැහැ.වාහනයක් ගමන් කිරීමට සුදුසු තත්වයේ නැහැ. වාහන තියෙන අයත් පෙරපාසල ළඟ වාහන තියලා තමා යන්නේ.වාහන යන්න සුදුසු තත්ත්වක නෑ.මේ මාර්ගය සංවර්ධනය කර ගැනිමට ඔබතුමාගේ අවධානය යෝමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.19 යෝජනාව, චින්තක මහතාගේ තේ ඉඩම අසල සිට ඉදිරියට පහළ මල්වත්ත මාර්ගය සංවර්ධනය කිරීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.20.සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.20.දම්මුල්ල ලලිතා මහත්මියගේ නිවස අසල සිට ඉදිරියට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිනිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම මාර්ගයේ සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන් ම නතර වෙලා තියෙන්නේ.මෙම ලලිතා මහත්මියගේ නිවස අසලට යනතුරු කොන්ක්‍රීට් කිරීම සිදුකර තිබෙනවා.ඉන් ඉදිරියට කොන්ක්‍රීට් කිරීම සිදුකළ යුතුව තිබෙනවා.පාර පටන් ගන්න ස්ථානයේ දෙපැත්ත පැති බැම්ම යොදා සංවර්ධනය කිරීම යෝග්‍යව තිබෙනවා.ඒ සඳහා ද මේ සභාවේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.20 යෝජනාව, දම්මුල්ල ලලිතා මහත්මියගේ නිවස අසල සිට ඉදිරියට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.21. සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමාගේ යෝජනාව.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**

**06.21.මෝරගල ක්‍රීඩාපිටිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර එය පවරා ගැනීමට මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මෙය ඇහැලියගොඩට තියෙන සම්පතක්.මෙය නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තමයි තියෙන්නේ. මෙය ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට පවරා ගතහොත් විශාල ආදායමක් හොයන්න පුළුවන් තැනක්. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලීමක් කරනවා.

ගරු සභාපතිතුමනි, මං තවත් යෝජනාවක් දැම්මා.ඒක ප්‍රතිෂේප වෙලා තියෙනවා.පොළ භූමිය සම්බන්ධයෙන් මම දාල තිබුණා යෝජනාවක්. එහි මම සංස්කෘතික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට එක ගොඩනැගිල්ලක් යොදා ගමු කියන කාරණය තමා මං යෝජනා කළේ.ඒ හා සමාන ම යෝජනාවක් කලින් සභාවට දැම්මා කියලා තමා ප්‍රතික්ෂේප කරලා තිබුණේ.සංස්කෘතික මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම අප සභාවයට අත්‍යවශ්‍ය කාරණයක්. සභාවට මුදලකුත් එනවා.සමාජයට සේවයකුත් වෙනවා.ඒ ගැන අවධානය යොමුකරන ලෙස මම ඉල්ලීමක් කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, එතුමා කියපු කාරණේට, සංස්කෘතික මධ්‍යස්ථානයක් එහා පැත්තේ හදලා තියෙනවා.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**

නමුත් ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා,වුවමනා වැඩ කටයුත් සිදු වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා.සංස්කෘතික මණ්ඩලය හරහා තමයි ඒක පවත්වාගෙන යන්නේ. මේකෙන් අපට සභාවට ආදායමක් ගැනීමට සභාව මගින් පවත්වාගෙන යන සංස්කෘතික මධ්‍යස්ථානයක් වෙන්න ඕන.ඒකෙන් සභාවට ආදායමක් මෙන් ම සේවයක් සිද්ධ වෙනවා.ඒ කාර්යයන් දෙකම සිද්ධ වෙනවා.ප්‍රසංගයක් වගේ පවත්වන්න ඒ වගේ තැනක් නෑ.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිනිය:-**

ගරු සභාපතිතුමනි,මට ඒක දැනගන්න ඕනි අපි ඒක පවරගන්න ක්‍රමවේදයක් තියෙන්න ඕනි.

**සභාපතිතුමා :-**

ඉල්ලීමක් කරන්න ඕනි.අපි ඒක කළා. නමුත් ඔවුන් කියන්නේ මිලියන ගාණක් යට කළා කියලා පස් දාල ගොඩකරන්න .ඒ නිසි අපි ඒකට ඉල්ලීමක් කරමු. නමුත් ඒක අමාත්‍යංශ අතර ඇමතිවරු අතර සිදුකරන්න තියෙන ලොකු කාර්යභාරයක්. නමුත් අපි ඉල්ලීමක් කරමු. අපේ රංජිත් මන්ත්‍රීතුමත් කිවුවා වගේ මෙතනින් ගන්න බැරි තීරණ අපි ඉස්සරහට ගමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

සතුටුයි සභාපතිතුමා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,නගර සංවර්ධනයට ඉස්සරවෙලා නගර සංවර්ධන සැලැස්මේ තිබුණේ, ජාත්‍යන්තර ක්‍රීඩා පිටියක් බවට පත් කරන්න තමයි මූලික සැලැස් ම තිබුණේ.ප්‍රාදේශීය සභාවට භාර ගත්තොත් ලොකු වගකීමක් තියෙනවා විශාල මුදලක් අය කරන්න .ඒ නිසා සාකච්ඡාවට ප්‍රවේශයක් ගන්න කොටත් ඒ ගැන අවධානය යොමු කරන්න.

**සභාපතිතුමා :-**

අපි ඒක ගත්තොත් කරන්න ටිකක් අමාරුයි.මූලා පහසුකම් නැති නිසා. අපි ඒක ක්‍රීඩා අමාත්‍යංශයට දීල ඔවුන් හරහා සිදුකිරීම තමයි සුදුසුම ක්‍රමවේදය. ඊට පස්සෙ වෙන දෙයක් තමා අපිට ගන්න වෙන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමාගේ 06.21 යෝජනාව,මෝරගල ක්‍රීඩාපිටිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර එය පවරා ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

6.22.සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**

**06.22.දිද්ද මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය:-**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය**

ගරු සභාපතිතුමනි,දිද්ද මාර්ගයේ කාණු පද්ධතිය අක්‍රමවත්ව පවතින නිසා ජලය බැස යැමට කිසිසේත් ම සුදුසු තත්ත්වයේ නැ.පාර කැඩිලා ලොකු අවධානමකට පත්වෙලා තියෙනවා.එම නිසා එය සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 06.22 යෝජනාව, දිද්ද මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.23.සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
**06.23.බෝපැත්ත සමගි මාවත තුම්මන් හන්දිය සංවර්ධනය කිරීම යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,බෝපැත්ත සමගි මාවත තුම්මන් හන්දිය කොටස ලොකු පළුදු වීමකට ලක් වෙලා තියෙනවා.එම නිසා එය සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 06.23 යෝජනාව, බෝපැත්ත සමගි මාවත තුම්මන් හන්දිය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.24.සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
**06.24.සෙනෙහේ සියපත ගම්මානයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,සෙනෙහෙ සියපත ගම්මානය හදන කොට ගෙවල් පහත තියෙන නිසා කාණු පද්ධතිය තියෙන්නේ උසින් වගේ.ඒ නිසා කාණු පද්ධතිය උතුරලා ගියාට පස්සේ ගෙවල්වල මිදුල් හා ගෙවල්වල සිටීමට බැරිම තත්වයකට පත්වෙලා තියෙනවා.එම නිසා එම කාණු පද්ධතිය නිසි ලෙස සකසා දෙන ලෙස ඉල්ලා සිටිනවා. එම ගම්වාසීන් විසින් විසින් ලිපියකුත් ලබා දී තියෙවා මේ යෝජනාව සභාවට යොමු කරන්න කියලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ මන්ත්‍රීතුමියගේ යෝජනාවට කාරුණික අවධානය යොමුකරන්න.කොට්ඨාශවල මන්ත්‍රීවරුන්ට නිසි ආකාරයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් වෙනවා කියලා.එක පැත්තකට විතරක් යනව කියල වගේ තේරෙන්නේ. මේ පිළිබඳ අවධානය යොමු කරන්න.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 06.24 යෝජනාව, සෙනෙහේ සියපත ගම්මානයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
06.25.සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ යෝජනාව.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
**06.25.මිටිපොල අක්කර 8 ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රිට් කිරීම මීටර් 150 ක් සංවර්ධනය කිරීමට යෝජනා කරමි. (පැති බැම්ම මීටර් 50 ක්)**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මේ පාර අවුරුදු 50 ක් පමණ පරණ පාරක්, මේ අක්කර 8 පාර කියන්නේ.ප්‍රධාන මාර්ගයට එන අතුරු මාර්ගයක්.එම මාර්ගයෙන් දියවෙල්ල, පන්විල, රුකහේන ආදී ප්‍රදේශවලට යන්න එන්න පහසු මාර්ගයක් තමයි මේ අක්කර 8 මාර්ගය කියන්නේ.ඒ නිසා මේ මාර්ගය සවර්ධනය කරලා දෙන්න කියලා ප්‍රදේශ වාසීන්ගේ ඉල්ලීමක් විදිහට මං යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 06.25 යෝජනාව, මිටිපොල අක්කර 8 ප්‍රවේශ මාර්ගය කොන්ක්‍රිට් කිරීම මීටර් 150 ක් සංවර්ධනය කිරීමට සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(පැති බැම්ම මීටර් 50ක්)

**සභාපතිතුමා:-**
06.26.සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ යෝජනාව.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
**06.26.කිරිපෝරුව වීරසිංහගොඩ මාර්ගයේ ශාන්ත මහතාගේ නිවස අසල මාර්ග කොටසේ පැති බැමි දෙක සංවර්ධනය කිරීමට යෝජනා කරමි.(මීටර් 50 ක්)**(මෙය මීටර් 30 ක් ලෙස සංශෝධනය විය යුතුයි.)

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,කිරිපෝරුව වීරසිංහගොඩ මාර්ගය කියන්නේ ගම මැද පිහිටි ප්‍රධාන මාර්ගයක්.කිරිපෝරුව විහාරස්ථානය, පාසල, රෝහල යන ස්ථාන වලට ගමන් කරන්න පුළුවන් මාර්ගයක්.මේ මාර්ගය සවර්ධනය කරන්න ග්‍රාමීය සංවර්ධන යෝජනාවලටත් ඇතුළත් කරලා තියෙනවා.මෙම මාර්ගය දෙපැත්තේ තියෙන්නේ වෙල් යාය.ඒක නෙමේ ගැටලුව වෙලා තියෙන්නේ, පසුගිය දවස්වල පැවති අයහපත් කාලගුණය නිසා පාර හරහා වතුර පිටාර දාල මෙම පාර කැඩිලා ගිහින් තියෙන්නේ.වාහන ගමන් කිරීමට අපහසුයි මේ මාර්ගයේ.දැනට ප්‍රදේශයේ ජනතාව විසින් තාවකාලිකව මාර්ගය දෙපසට වැලි කොට්ට දාල සකස් කර ගෙන තියෙනවා.ඒ නිසා කිරිපෝරුව වීරසිංහගොඩ මාර්ගයේ ශාන්ත මහතාගේ නිවස අසල මාර්ග කොටසේ පැති බැමි දෙක සංවර්ධනය කරලා දෙන්න කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 06.26 යෝජනාව, කිරිපෝරුව වීරසිංහගොඩ මාර්ගයේ ශාන්ත මහතාගේ නිවස අසල මාර්ග කොටසේ පැති බැමි දෙක සංවර්ධනය කිරීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.මිටර් 30 ක්)

**සභාපතිතුමා:-**
06.27.සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමාගේ යෝජනාව.

**සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා:-**
**06.27. විපුලසේන මහතාගේ නිවස අසල සිට චමින්ද මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ මීටර් 100 ක පමණ දිගින් යුත් කාණු පද්ධතිය කොන්ක්‍රිට් ලැලි යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ මාර්ගය තියෙන්නේ උඩුමත්ත මිහිඳු මහා විද්‍යාලය ඉදිරිපිට.දැනට ඒ මාර්ගය හොඳ තත්ත්වයේ තියෙනවා පාර.නමුත් වතුර ටික බහින්නේ පාර උඩින්.ඒ හින්දා මම ඉල්ලා සිටින්නේ පාර අයිනෙන් චමින්ද මහතාගේ නිවස දක්වා කාණු පද්ධතිය සවර්ධනය කරලා දෙන්න කියලා, කොන්ක්‍රීට් ලැලි දාලා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමාගේ 06.27 යෝජනාව, විපුලසේන මහතාගේ නිවස අසල සිට චමින්ද මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ මීටර් 100 ක පමණ දිගින් යුත් කාණු පද්ධතිය කොන්ක්‍රිට් ලැලි යොදා සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
06.28.සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමාගේ යෝජනාව.

**සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා:-**
**06.28. තොරණකඩ සුසාන භූමියට පිවිසෙන මාර්ගය කුට්ටි ගල් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ මාර්ගයේ දැනට පවතින්නේ, කෙනෙක් මිය ගියාට පස්සේ මිනියක් අරන් යන්නවත් බැරි තත්ත්වයක.වගුරු බිමක් වගේ තියෙන්නේ.හතර දෙනෙක් අරන් යන්න බෑ දෙපැත්තෙන්.ඒ නිසා මිනිස්සු අපහසුතාවයට පත් වෙනවා.ඒ මාර්ගයේ මීටර් 100 ක් වගේ ප්‍රමාණයක් තියෙනවා.එම නිසා මෙය සංවර්ධනය කර දෙන්න කියලා මං යෝජනා කරනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මේක හොඳ යෝජනාවක්.මීට ඉහත දී ගම්වාසීන්ගෙන් පැමිණිල්ලක් ආවා.කනත්ත බැකෝ එකක් දාල කනත්ත කපනවා කියලා.මම එදත් එතන්ට ගිහිල්ලා බැලුවා.පාර දෙපැත්ත පළල් කර ගෙන ගිහිල්ලා තිබුණා.එතන දී මාර්ගය කපන්න පුළුවන්ද කියන ගැටලුවකුත් මට ආවා.මෙහිදී සභාපතිතුමා විශේෂයෙන් ම අපි අවධානය යොමු කරන්න ඕනේ ඒ ප්‍රදශෙයේ මැණික් පතල් ගැරීමකුත් සිද්ධ වෙනවා.ඇත්තට ම ලොකුවට ම ඒ දේ යනවා.දෙපැත්ත පළල් කර ගෙන යනකොට පොඩ්ඩක් හොඳටම බලන්න් ඕන ටිකක් තමයි.ඒහෙම කපා ගෙන යන කොට කෙනෙක් කෙනෙක් දිගින් දිගට ම පස් ඉවත් කර

ගෙන ගිහිල්ලා පතල් කැපීමේ නියලෙන්න හේතුවකුත් ඇතිවෙයි කියලා මට හිතුණා.ඒකයි මේ ප්‍රශ්නය මේ වෙලාවේ මම ඇතුළත් කළේ.කාවින්ද මන්ත්‍රීතුමා මේ ගැන නෙමේ කතා කළේ.නමුත් මේ වෙලාවේ ඒකටත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එතන පොඩි පැහැදිලි කිරීමක් අවශායි.ඒ කටයුත්තට ප්‍රාදේශිය ලේකම්තුමිය සම්බන්ධ වුණේ කොහොමද?

**සභාපතිතුමා:-**
එතන සුසාන භූමිය තියෙන්නේ සභාවට.නමුත් ඒ ඉඩම තියෙන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒතකොට ඒ සුසාන භූමිය ප්‍රාදේශිය සභාවට වත්කමක් නෙමේද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,කසල අගනයේ කර්මාන්තයට අදාළ පස් ලබා ගැනීමට තමා අපි ඒ පාර දෙපස පළල් කරේ.එතන වත්තේ තියෙනවා, වත්තෙන් පවරගෙන ප්‍රාදේශිය ලේකම් කාර්යාය භාරේ තියෙන ඒ සම්පූරණ ඉඩම තියෙන්නේ එතන.ඒ ඉඩමේ තමා දැන් ජනතාව පදිංචි කරලා තියෙන්නේ.ඒ එතනත් පාර දෙපැත්තේ තියෙනවා බිම් කොටසක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ භාරයේ තියෙන.ඒ නිසා අපි ඇත්තට ම අවසර ගන්න ඕන එතනින්.ඒ නිසා තමා අපි එතනින් අවසර ගත්තේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පවර ගත්ත ඉඩමෙන් කොටසක් තමයි නේද දැන් භාවිතා කරන්නෙ.එහෙමද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
නැ පාර යන්නේ ඒ ඉඩම මැද්දෙන් තමා.ඒනිසා පාර පළල් කරන කොට ඒ නිසා අනිවාර්යෙන් ම අහන්න එපැයි.පාර පළල් කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මාර්ගය අයිති ප්‍රාදේශිය සභාවට නෙමේද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මාර්ගය අයිති ප්‍රාදේශිය සභාවට.මාර්ගය තමා පළල් කරේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ම හිතුවේ.ම හිතුවේ ඒක ප්‍රාදේශිය සභාවට අයිති නෑ කියලා.ප්‍රාදේශිය සභාවට අයිති බලය මං හිතුවේ කප්පාදු කිරීමක් වෙලා කියලා.එහෙම අවශාතාවය මම දන්නෑ.මම දන්න විදිහට ප්‍රාදේශිය ලේකම්තුමියගෙන් මේ අවස්ථාවේ දී අවසර ගන්න ඕන නෑ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
අවසරයක් නෙමේ සභාපතිතුමා.පාරවල් අයිති ප්‍රාදේශිය සභාවට.පළමු අදියරේම ගැසට් කළා මාර්ග 600 ක්.ඉස්සරහට ගැසට් කරනවා ඉතිරි සියලු ම පාරවල් ටික.පාරවල් අයිති අපිට.ඒ බිම අයිති ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට නිසා දැනුම් දීමක් විදිහට තමා කළේ.

**සභාපතිතුමා:-**
ඇත්තට ම ඒක ගත්තේ කසල අංගනය කොන්ත්‍රාත්තුව ගත්ත මහත්මයෙක්.අපි බැලුවේ ඒක අපි මුදලක් නැතුව, මං තාක්ෂණ නිලධාරීතුමාගෙන් ඇහුවා, ට්‍රැක්ටර් දෙකක් එද්දි පාර මදි කිවුවා.මේක පාර අපේ වුණාට ඉඩම වතු,පුස්සැල්ල වත්ත වැවිලි සමාගමට මං හිතන්නේ දැනට තියෙන්නේ.එයාලගෙන් අහන්න ඕනේ.අනිත් එක තමා, අපේ තාක්ෂණ නිලධාරී තමා කිවුවේ, ඕක කනත්තක් වුණාට, නැවත පදිංචි කිරීමේ බිම් කොටසයි ඔක්කොම පවරලා තියෙන්නේ ලේකම් කාර්යාලයට කියලා.ලිඛිතව ඇහුවා නෙමේ, අපි බැල්වේ, අපි පස් ටිකත් ගන්න කොට ම අපිට පාරක් පොඩ්ඩක් පළල් කර ගන්න පුළුවන්.එතකොට අපිට මුදලක් යන් නැනේ.දැන් ඒකට මුදලක්වත් ගියේ නෑ.අපිට මුදලක්වත් ගියේ නෑ.ඒ හින්දා මැණික් කතන්දරේ හින්දා තාක්ෂණ නිලධාරීතුමා කිවුවා ඔය වැඩේ ඉවර වෙනකම් ම ඉන්න කියලා.බැරි වෙලාවත් මොකක් හරි වුණොත් මැණික් තියෙනවා කියලා, වෙන ම ප්‍රශ්නයක් එනවනේ.ලිඛිතව ඉල්ලුවා නෙමේ.ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ළඟ හිටපු අයට දීපු ඉඩම් තමයි ඔය. ලේකම්තුමියට නිකන් මතක් කළා පමණයි.මෙන්න මෙහෙම එකක් කරනවා කියලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
නැ නැ සභාපතිතුමා වට්ස්ඇප් පණිවිඩේ තිබ්බේ ලේකම්තුමියගේත් අවසරය ගත්තා කියලා.ඒකයි කිවුවේ.සභාපතිතුමාගේ බලය කප්පාදු කරන් නැතුව ඉස්සරහට අරගෙන යන්න.අපට ඊළඟ සභාවේ දී ඒ බලය අපට තියෙන්න එපැයි.ඒ නිසයි.

**සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම යෝජනා කළේ ඒ සුසාන භූමිය ගැන නෙමේ.තොරණගොඩ සෙඩ් එකට එහා පැත්තෙ තියෙනවා, සොහොන් පිට්ටනියක්. එක ගැන තමයි මම යෝජනා කළේ.

**සභාපතිතුමා:-**

හරි හරි.මේක වෙන කැල්ලක්.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමාගේ 06.28 යෝජනාව,තොරණකඩ සුසාන භූමියට පිවිසෙන මාර්ගය කුට්ටි ගල් යොදා සංවර්ධනය කිරීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
06.29.සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමාගේ යෝජනාව.

**සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා:-**
**06.29.තොරණගොඩ සිට අමුපිටිය දක්වා දිවෙන මාර්ගයේ වෙන්දේසි ඉඩමට හැරෙන හන්දියේ සිට පහළට මීටර් 200 ක් පමණ කාණුව කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ පාරත් දැන් විනාශ වෙලා තියෙන්නේ.වතුර පාර ඒ පාර දිගේ එන හින්දා.තවත් ඒ පාර අබලන් වීම වැඩි වෙනවා අපි මේ කාණු පද්ධතිය සංවර්ධනය කළේ නැත්නම්.මං ඉල්ලීමක් කරනවා කඩිනමින් ඒක කරලා දෙන්න කියලා.මොකද හෙල සහිත පාරක් ඒක.ඒ නිසා මෙය කඩිනමින් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමාගේ 06.29 යෝජනාව,තොරණගොඩ සිට අමුපිටිය දක්වා දිවෙන මාර්ගයේ වෙන්දේසි ඉඩමට හැරෙන හන්දියේ සිට පහළට මීටර් 200 ක් පමණ කාණුව කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.30.සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
**06.30.බෝපැත්ත දිද්ද කොට්ඨාශයට මසකට දෙවරක් ආයුර්වේද සායනයක් පැවැත්වීමට කටයුතු සලසා දෙන මෙන් මම යෝජනා කරමි.**

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ සිටින ජනගහනයේ හැටියට ජංගම දිස්පැන්සරියක්වත් නෑ.ඒ නිසා බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ ජනතාව ආයුර්වේද ප්‍රතිකාරයක් ලබා ගන්න, පුස්සැල්ල ආයුර්වේදයට යන්න ඕනේ.නැත්නම් පනාවල ආයුර්වේදයට යන්න ඕන.ඒ නිසා බෝපැත්ත දිද්ද කොට්ඨාශය තුළ ආයුර්වේද වෛද්‍ය සායනයක් මාසෙක දෙවරක් ආරම්භ කර දෙන ලෙස ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.ඒ ගැන අවධානය යොමු කරන්න.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමාගේ 06.30 යෝජනාව,බෝපැත්ත දිද්ද කොට්ඨාශයට මසකට දෙවරක් ආයුර්වේද සායනයක් පැවැත්වීමට කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීම් කළ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.31. සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
**06.31.විලේගොඩ ඇටඹගහහේන අතුරු මාර්ගයට බෝක්කු දෙකක් ලබා දීමට යෝජනා කරමි.**

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇටඹගහහේන මාර්ගය ෆැන්සි මහතාගේ නිවස අසල සිට සරත් මහතාගේ නිවස අසල දක්වා බෝක්කු දෙකක් ලබා දුන්නොත් කෙටි මාර්ගයකින් නිවෙස් 10 කට 15 කට ගමන් කිරීමට පහසු වෙනවා.අනිත් එක වඩුවන්ගොඩ මාර්ගය යම් හෙයකින් බ්ලොක් වුණොත්, මාර්ග අනතුරකට ලක් වුණොත් එහෙම ඒකට ප්‍රවේශ මාර්ගයක් ලෙස, අතුරු මාර්ගයක් වශයෙන් භාවිතා කරන්නත් පුළුවන්.ඒ නිසා මේ මාර්ගය සවර්ධනය කිරීමට සහයෝගය දෙන්න කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමාගේ 06.31 යෝජනාව,විලේගොඩ ඇටඹගහහේන අතුරු මාර්ගයට බෝක්කු දෙකක් ලබා දීමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**

6.32. සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
**06.32.කැ/ ඉහළගම - විජේනායක මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,කැ/ ඉහළගම - විජේනායක මාර්ගය සංවර්ධනය කිරීමට අවස්ථා කීපයකදී උත්සහ කළා.මං හිතන්නේ ගරු ස්වාමීන් වහන්සෙත් ලොකු උත්සහයක යෙදුණා.නමුත් ඒ කටයුත්ත කරන්න බැරි වුණා.නමුත් දැන් බයිසිකලයකටවත් ගමන් කරන්න බැරි තත්ත්වයකටත් පත් වෙලා තියෙන්නේ.ඒනිසා මේක මධ්‍යම රජයට හා පළාත් සභාවට හරි යොමු කරලා ඒක සංවර්ධනය කරන්න.ගරු සභාපතිතුමා මේක ඔබතුමාගේ කොට්ඨාශයට අයත් මාර්ගයක් මේක.කොට්ඨාශ සීමාව සීමා කරන මාර්ගයක්.ඒනිසා ඒ ගැන විශේෂ අවධානය යෝමු කරන්න කියලා මං යෝජනා කරනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,එතන විජේනායක පන්සලත් එක්ක පල්ලමට තිබෙන පාර,මං හිතන්නේ ඤාන මුදලාලි කියලා තමා කියන්නේ.මං හරියටම නම දන්නේ නෑ.එයාගේ වියදමින් හදලා දෙන්නම් කියලා යෝජනාවක් ආවා.මං ඒක ලිඛිතව දෙන්නත් හිටියේ.බඩු ටික අරගෙන එයාගේ වියදමින් කරන්න සභාවේ අවසරය අරන් දෙන්න කියලා ඉල්ලීම කළා.ඒ නිසා ඒ ගැන සලකා බලන්න කියලා යෝජනා කරනවා.එයාගේ ලිවුමත් එක්ක ම මං අරගෙන ඇවිත් තියෙනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං හිතන්නේ මේ මාර්ගය, ඔබතුමාටත් අපේ නායක ස්වාමීන් වහන්සේ එදා පැවසුවා.ඒ මාර්ගයේ යම්කිසි පටු බවක් තියෙනවා.නමුත් අපේ වත්සලා මන්ත්‍රීතුමිය කිවුව වගේ ඤාන මුදලාලි මහත්තයත් අපි එක්ක කතා කළා.එතුමගෙ නිවස ළඟින් තමයි තාප්පෙ කඩල පාර ගන්න දෙන්නම් කිවුවා.ඒකෙදි ඒ පාර විකල්ප මාර්ගයක් වශයෙන් භාවිතා කරන්න පුළුවන් බෝපැත්ත මාර්ගයට එනකන්.එතන දී පාර පළල් කර ගැනීමේ ප්‍රශ්නයේ දී අපේ නායක ස්වාමීන් වහන්සේ මැදිහත් වෙන්නම් කිවුවා ගමේ ප්‍රභූවරුන් එක්ක ගිහිල්ලා.කතා කරලා අරන් දෙන්නම් කිවුවා පාර ප්‍රශ්නය.ඒ කියන්නේ අඩි 12 කට ගන්න පුළුවන් පාර.අපිට මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් ප්‍රතිපාදන වෙන් කර ගන්න පුළුවන් නම් ඒක ඉතාම වටිනා මාර්ගයක් කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.32 යෝජනාව, කැ/ ඉහළගම - විජේනායක මාර්ගය සංවර්ධනය කිරිමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
6.33. සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමාගේ යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
**06.33.බ/ කරදන විහාරහේන මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම හිතනවා ඒක ගම්ලත් මන්ත්‍රීතුමා යෝජනා කළ යුතු යෝජනාවක්.මේක එතුමගේ කොට්ඨාශයේ.මේකේ සැලකිය යුතු ප්‍රමාණයක් සංවර්ධනය වෙලා තියෙනවා.ගෙවල් 50 ක් විතර ගමන් ගන්නා මාර්ගයක්.කඳු සහිත මාර්ගයක්.ඒකේ විශාල ආර්ථික කටයුතුවල නිරත වෙන පිරිසකුත් ඉන්නවා.තේ කුරුඳු රබර් ආශ්‍රිත නිෂ්පාදන විශාල වශයෙන් වගා කරලා තියෙනවා.එමනිසා මාර්ගය සංවර්ධනය කරලා දුන්නොත්, වාහනයක් ගමන් කරන්න පුළුවන් මට්ටමට, ඒ ප්‍රදේශයේ ඉඩම්වල වටිනා කමත් වැඩි වෙනවා.ඒ වගේ ම රටේ සංවර්ධනයට දායකවන භෝගවලට නියම වටිනාකමක් ගන්නත් පුළුවන් වෙනවා.ඒ නිසා මේ මාර්ගය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ සහෝදර මන්ත්‍රීතුමා සද්භාවයෙන් මගේ කොට්ඨාශය සම්බන්ධව ගෙනාපු යෝජනාව ගැන මං සතුටු වෙනවා.නමුත් මේ යෝජනාව මං 2025/11/11 දින 6.49 යටතේ සභා වාරයේදී කළ යෝජනාවක්.ඔබතුමාට මතක ඇති ඔබතුමා මයි ඒක ස්ථිර කරන්න ඇත්තේ.එතකොට මේක නැවත දැම්ම තේරුමක් මම සතුටුයි ඔබතුමාගේ යෝජනාව හරි ක්‍රියාත්මක වෙලා මේ මාර්ගය සංවර්ධනය වෙනවට.

**සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව ඉදිරිපත් කරලා තියෙනව නම් මේ යෝජනාව, ඉවත් කරන්න.මට ඕනේ.මගෙ නමින් නෙමේ, මෙතුමගෙ නමින් හරි පාර හැදෙන්නයි ඕනේ.මාර්ග කි.මී. 600 ක් සංවර්ධනය කරන යෝජනාවට මේකත් ඇතුළත් කරන්න.ඒක තමා මගේ අදහස.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලියමැතිතුමාගේ 06.33 යෝජනාව,බ/ කරදන විහාරහේන මාර්ගය සංවර්ධනය කිරිමසඳහා වූ යෝජනාව 2025/11/11 දින මහා

සභාවේ යෝජනා වූ 6.49 යෝජනාව ම වන බැවින් මෙම යෝජනාව මෙම සභාවෙන් ඉවත් කිරීමට මහා සභාව එකඟ විය.

**සභාපතිතුමා:-**
06.34. සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණියගේ යෝජනාව.

**සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණිය:-**
**06.34.මාහර පන්සල පාරේ අධික වර්ෂාව නිසා කැඩී ගිය බෝක්කුව සහිත පාර ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මාහර පන්සල පාරේ අධික වර්ෂාව නිසා කැඩී ගිය බෝක්කුව කැඩී ගිහිල්ලා තියෙනවා.එම බෝක්කුව කඩිනමින් සංවර්ධනය කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව අපටත් ඇවිල්ලා තිබ්බා.සමාජ මාධ්‍ය හරහා ද එය share වුණා.මං කිවුවා ඒ අදාළ මන්ත්‍රීතුමියවත් දැනුවත් කරන්නම් කියලා.කවුරු හරි වැටුණොත් එහෙම.ප්‍රශ්නයක් වෙනවා.ඒ නිසා සභාපතිතුමා මේක ඉක්මන් කරලා කරන්න පුළුවන් නම් හොඳයි කියලා මං යෝජනා කරනවා.

**සභාපතිතුමා:-**
අපි ඒක ප්‍රමුඛතා කාර්යක් කරලා කරන්න ඕනේ.අත්‍යවශ්‍ය වැඩක්.පසුගිය ආපදා සැලැස්මටත් අපි ඒක දාල තියෙන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ 06.34 යෝජනාව,මාහර පන්සල පාරේ අධික වර්ෂාව නිසා කැඩී ගිය බෝක්කුව සහිත පාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
06.35. සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණිය.

**සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණිය:-**
**06.35.මාහර ලියනගේ වත්ත පාර සංවර්ධනය කිරිම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරිමට යෝජනා කරමි.**

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ පාර සංවර්ධනය කරන්න නීතිමය ගැටලු තියෙනවා.ඒකත් මං ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා සභාවේන් ගත යුතු අවශ්‍ය පියවර තියෙනවා.ඒනිසා ඒ පාර සංවර්ධනය කරීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ 06.35 යෝජනාව, මාහර ලියනගේ වත්ත පාර සංවර්ධනය කිරිම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
06.36. සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිතුමා.

**සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණිය:-**
**06.36.මාහර පාරට හැරෙන මාහිංගොඩ හන්දියේ ජලය රඳා පවතින ස්ථානය ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මෙම ස්ථානය ගරු සභාපතිතුමා හා උපසභාපතිතිතුමා දන්නවා.ඒ නිසා මාහර පාරට හැරෙන මාහිංගොඩ හන්දියේ ජලය රඳා පවතින ස්ථානය ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ 06.36 යෝජනාව,මාහර පාරට හැරෙන මාහිංගොඩ හන්දියේ ජලය රඳා පවතින ස්ථානය ප්‍රතිසංස්කරණය කිරිමසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
06.37.සභික ඒච්.ආරියදාස මැතිතුමාගේ යෝ ානාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.37.බුළුගහපිටිය සීතාවකවත්ත චමිල් මහතාගේ නිවස ළඟ සිට චාමර මහතාගේ නිවස දක්වා මාර්ගය (මීටර් 50 ක් පමණ) කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**සභික එස්.එම්.සුමිත්‍රාසේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ වෙන්දේසිවත්තෙ පාර කොන්ක්‍රීට් කරලා තියෙනවා.ඉතුරු කොටසයි මේ කොන්ක්‍රීට් කිරීමට මම යෝජනා කරන්නේ.මීටර් 50 ක වගේ කොටසක් තියෙන්නේ.ඒ නිසා මේ මාර්ගය සංවර්ධනය කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා..

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒච්.ආරියදාස මැතිතුමාගේ 06.37 යෝජනාව,බුළුගහපිටිය සීතාවකවත්ත චමිල් මහතාගේ නිවස ළඟ සිට චාමර මහතාගේ නිවස දක්වා මාර්ගය (මීටර් 50 ක් පමණ) කොන්ක්‍රීට් කිරීමට සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
06.38.සභික ඒච්.ආරියදාස මැතිතුමාගේ යෝ ානාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.38.ධර්මාලෝක මාවතේ පුංචිහේවා මහතාගේ නිවාස සඳහා ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.(මීටර් 200 ක් පමණ)**

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ මාර්ගය කාපට් කරලා තියෙන්නේ.ධර්මාලෝක මාවතේ පුංචිහේවා මහතාගේ නිවාස දක්වා යන මාර්ගයේ ප්‍රධාන පාරෙන් ඇතුළට යන ස්ථානයේ සිට පහළට යනකන් කාපට් එක ගැළවිලා ගල් ගැලවිලා තියෙනවා.ඒ නිසා ඒ මාර්ගය කඩිනමින් සංවර්ධනය කරන්න ඕන.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මීටර් 200 ට වැඩිය තියෙනවා මං හිතන්නේ.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
මීටර් 200 ට වැඩිය තියෙනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම නම් හිතන්නේ ධර්මාලෝක මාවත පටන් ගන්න තැන ඉදන් හැදුව නම් හොඳයි කියලා.හන්දියේ ඉදල නෙමේ, මුල ඉදල ම හදන්න ඕන කියලා.එතන තියෙන්නේ ගෙවල් මංඩියක් විතරයි.එතන මාළු කඩේ රංජි අයියලාගේ ගෙවල් ටිකෙත් යන්න බෑ.ගල් මතුවෙලා තියෙන්නේ.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒච්.ආරියදාස මැතිතුමාගේ 06.38 යෝජනාව,ධර්මාලෝක මාවතේ පුංචිහේවා මහතාගේ නිවාස සඳහා ඇති මාර්ගය සංවර්ධනය කිරීමටසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (මීටර් 200 ක් පමණ)

**සභාපතිතුමා:-**
06.39.සභික ඒච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.39.දන්දෙනිය පාරේ ජයවර්ධන මහතාගේ නිවස ඉදිරිපිටින් ඇති පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි. .(මීටර් 200 ක් පමණ)**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රධාන පාරේ ඉදලා ඇතුළට යන්න තියෙන පාරක්.පාරත් එක්ක ම තමා මෙහා පැත්තෙ ඇළත් තියෙන්නේ.මේ පාර පවුල් 50 ක් විතර භාවිතා කරන පාරක්.ඒ නිසා මේ පාර අත්‍යවශ්‍ය පාරක් හැටියට සංවර්ධනය කළ යුතුයි කියලා මං යෝජනා කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒච්.ආරියදාස මැතිතුමාගේ 06.39 යෝජනාව,දන්දෙනිය පාරේ ජයවර්ධන මහතාගේ නිවස ඉදිරිපිටින් ඇති පාර සංවර්ධනය කිරීමට සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය. (මීටර් 200 ක් පමණ)

**සභාපතිතුමා:-**
කල් දී ඇති යෝජනා තියෙන්නේ එපමණයි.හදිසි යෝජනා දෙකක් තියෙනවා.

**සභාපතිතුමා:-**

**හදිසි යෝජනා:- 01**
**ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාළ විශේෂ දේපළ වන සෙරමික් කර්මාන්ත ශාලාවේ තක්සේරු කටයුතු අවසන් කර ඇති බැවින් එහි වටිනාකම අනුව ගෙවිය යුතු රජයේ ගාස්තුව 1% රුපියල් 355,310.00 ක මුදල ගෙවීමට මම යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
මං හිතන්නේ මේක අපේ මන්ත්‍රිවරු සියලු ම දෙනා ම දන්නවා.අපි වරිපනම් එකතු කරනකොට එක් විශේෂ දේපලක් හැර තමයි ගියවර සම්මත කර ගන්නේ.මොකද මේක සෙරමික් ආයතනයෙන් අපට විශේෂ වරිපනම් මුදලක් හම්බෙනවා.ඒක ලොකු මුදලක්.ඉතින් අපි ඒක තක්සේරු කරනවා අවුරුදු පහෙන් පහ.ඒක අපි අලුතෙන් තක්සේරු කරපු වාර්තාව ඇවිත් තියෙනවා අපිට.අපි ඒ රිපෝට් එක ගන්න මේ මුදල ගෙවන්න ඕන,.ඊට පස්සෙ තමා අපිට ඒ වාර්තාව ලැබෙන්නේ.ඒ වාර්තාව ලැබුණට පස්සෙ තමා අපිට ඒ මුදල අපිට ලබා ගන්න පුළුවන් වෙන්නේ. මේක මේ හදිසි යෝජනාවක් විදිහට එන්නේ, මේක අපිට එන්නේ වරිපනම් බදු සීමාවේ ඇති දේපල තක්සේරු කර ගැනීම අපිට එන්නේ 2026.01.09 වෙනිදා.ඒක හින්දා තමා මේක හදිසි යෝජනාවක් විදිහට දාන්න සිද්ද වුණේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව ගරු සභාපති බන්ධුලසේන දුණුවිලමැතිතුමාගේ හදිසි යෝජනා:- 01 යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාළ විශේෂ දේපළ වන සෙරමික් කර්මාන්ත ශාලාවේ තක්සේරු කටයුතු අවසන් කර ඇති බැවින් එහි වටිනාකම අනුව ගෙවිය යුතු රජයේ ගාස්තුව 1% රුපියල් 355,310.00 ක මුදල ගෙවීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය

**සභාපතිතුමා:-**
**හදිසි යෝජනා:- 02**
**ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාළ විශේෂ දේපළ වන සෙරමික් කර්මාන්ත ශාලාවේ තක්සේරු වටිනාකම රුපියල් 35,531,000.00 වන අතර එයින් 10% ක මුදල වන රුපියල් 3,553,100.00 ක වාර්ෂික වරිපනම් බදු මුදල 2026 වර්ෂයේ සිට අය කර ගැනීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා:-**
මේ දෙක හදිසි යෝනා විදිහට දාන්න වුණේ 2026.01.09 වෙනිදා ආපු නිසා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව ගරු සභාපති බන්ධුලසේන දුණුවිලමැතිතුමාගේ හදිසි යෝජනා:- 02 යටතේ ඇහැලියගොඩ ප්‍රාදශෙිය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාළ විශේෂ දේපළ වන සෙරමික් කර්මාන්ත ශාගාවේ තක්සේරු වටිනාකම රුපියල් 35,531,1000.00 වන අතර එයින් 10% ක මුදල වන රුපියල් 3,553,100.00 ක වාර්ෂික වරිපනම් බදු මුදල 2026 වර්ෂයේ සිට අය කර ගැනීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය

**සභාපතිතුමා:-**
**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

**07.01.2025.12.08වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.01 යටතේ ඉදිරිපත් කළ 2025.12.08වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
**07.02.2025.12.08වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.02 යටතේ ඉදිරිපත් කළ 2025.12.08වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා:-**
**07.03.2025.12.17වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.03 යටතේ ඉදිරිපත් කළ2025.12.17වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
**07.04.2025.12.17වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.04 යටතේ ඉදිරිපත් කළ2025.12.17වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
**07.05.2025.12.29 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.05 යටතේ ඉදිරිපත් කළ2025.12.29 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
**07.06.2025.12.30වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.06 යටතේ ඉදිරිපත් කළ2025.12.30 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
**07.07.2025.12.30වන දින පැවති ප්‍රසම්පාදන (ටෙන්ඩර් ලබාදීම) කමිටු වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක වාර්තාවක් නිසා සංශෝධනයක් කරන්න තියෙනවා.මෙම වාර්තාවේ අංක 03 යටතේ තියෙන ඇහැලියගොඩ එළු හා කුකුළු මස් සඳහා මහා සභා අනුමැතියට යටත්ව බුලත්ගම ඇතිරාලලාගේ ශ්‍රී ෂෂින්ද්‍ර සංදීප බුලත්ගම මයා වෙත වාර්ෂිකව රු.2,269,000.00 ක මුදලකට බදු දීමට ප්‍රසම්පාදන කමිටුව තිරණය කළා කියලා.ඒක මොහොම්මදූ හුසෙයින් මොහොම්මදූ රවුෆ් මයා ලෙස නිවරදි වෙන්න ඕන.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.07 යටතේ ඉදිරිපත් කළ2025.12.30 වන දින පැවති ප්‍රසම්පාදන (ටෙන්ඩර් ලබාදීම) කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
**07.08.කාර්මික සේවා කමිටුව - නොපැවැත්විණි.**

**සභාපතිතුමා:-**
**07.09.පරිසර හා පහසුකම් කමිටුව - නොපැවැත්විණි.**

**සභාපතිතුමා:-**
**07.10.නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව - නොපැවැත්විණි.**

**සභාපතිතුමා:-**
**08. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

**සභාපතිතුමා:-**
**08.01.2025 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 08.01 යටතේ ඉදිරිපත් කළ2025 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාවමහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
**08.02.2025 දෙසැම්බර් මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 08.02 යටතේ ඉදිරිපත් කළ2025 දෙසැම්බර් මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා:-**
**09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.**

**සභාපතිතුමා:-**
මං සියලුම මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්ගෙන් ඉල්ලා සිටිනවා, අපි සභාව පටන් ගන්නත් ටිකක් පරක්කු වුණ නිසා තමාගේ පැහැදිලි කිරීම්වලට එක වරක් පමණක් ලබා ගන්න කියලා යෝජනා කරමින් මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා අවස්ථාව මෙතැන් සිට ලබා දෙනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව මම කර ගන්නවා, IDAG ආයතනයෙන් ප්‍රාදේශිය සභා සභිකයින් වෙනුවෙන් කළ සහතික පත්‍ර පාඨමාලාව නිමකළා. එම ආයතනයට ස්තුති කරන්න මම මේක අවස්ථාවක් කර ගන්නවා.මම එම විභාගය සඳහා පෙනී සිටියා. “B” සාමාර්ථයක් ලබා ගැනීමට එහිදී මට හැකි වුණා.ඒ ආයතනයට ස්තුති කරන්නවා මං මේ අවස්ථාවේ.

ඒත් එක්ක ම සභාපතිතුමනි, සාමවිනිසුරු දිවුරුම දෙන එකට අපිට ඒ අවස්ථාව හදලා දෙන්න කියලා, ඒ යෝජනාවත් මං කරනවා.

**සභාපතිතුමා:-**
ගරු මන්ත්‍රීතුමනි, මනත්‍රීතුමියනි, ඒක අපේ ලේකම්තුමා ඒකට මැදිහත් වෙලා කතා කරලා තියෙනවා.ඒක අපි සභාවේ මැදිහත් වීමෙන් නෙමේලු කෙරෙන්න ඕනේ.ඒක අධිකරණ අමාත්‍යාංශයත් එක්ක කතා කරලා, ලේකම්තුමාගෙත් උපදෙස් අරගෙන, කතා කරලා කරමු.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, කාන්තා කමිටුවක් පිහිටවන්න මම යෝජනා කළා.ඒදා සභාපතිතුමා හිටියේ නෑ.මං හිතන්නේ කාන්තාවන්ට ලොකු සේවයක් කරන්න පුළුවන් අවස්ථාවක් තියෙද්දී ඒකට අවස්ථාවක් ලැබුණේ නෑ.ඒක පිහිටුවන්න, සභාවේ තව මන්ත්‍රීවරියන් 4 දෙනෙක් ඉන්නවා.ඒකටත් මට අවස්ථාව දෙන්න කියලා මං යෝජනා කරනවා.

ඒත් එක්කම සභාපතිතුමනි මං හිතන්නේ ප්‍රාදේශිය සභාවක ප්‍රධානම දෙයක් තමයි, කසල කළමණාකරණය.ඒක ප්‍රදේශයේ හරියට වෙන්නෙ නෑ.මං එක වතාවකුත් මේ ගැන කිව්වා. ක්‍රිඩා පිට්ටනිය ළඟින් ම තියෙන පාර, මෝරගල හොරගොඩ පාරේ දිගින් දිගටම කසල එකතු කිරීම ක්‍රමවත් නෑ.එතනින් යන්නවත් බැරි තත්ත්වයක් තමා තියෙන්නේ ගරු සභාපතිතුමනි.ඒ නිසා ඒ ගැන සොයා බලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.ඒ වගේ ම පනාවල පාරේ නිතර කසල එකතු කිරීම් සිදු වෙන් නැති තැන් තියෙනවා.ඒ ගැනත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වගේ ම සභාපතිතුමනි, කණගාටුදායක සිද්ධියක් වුණා.ඔබතුමා තමා ඒක සිද්ධ කළේ. ඇත්තට ම මට හරී කණගාටුයි.මේ ගැන අප්‍රසාදයත් පළ කරනවා මං මේ වෙලාවේ.මොකද හොරගොඩ ප්‍රදේශයට බල්බ් දාල තිබුණ් නෑ.ඒ වෙලාවේ මගේ මහ ගේ ඉස්සරහ අක්ක කෙනෙක් දවස් දෙකක් සභාවට ඇවිල්ලා ඔබතුමා හම්බෙන්න බැරි වුණහ ම, සභාවෙන් ඔබතුමාගේ ටෙලිෆෝන් නම්බර් එක දුන්නලු.ඒ ටෙලිෆෝන් නම්බර් එකට කතා කරාහම කිව්වලු, වත්සලා මන්ත්‍රීතුමිය ලිස්ට් එකෙන් ඇවිල්ලා තියෙන්නේ, නමුත් කාවින්ද මන්ත්‍රීතුමාට කිවුව නම් බල්බ් එක දාල දෙන්න තිබුණයි, කියන එක කිව්වලු.

ඒ වගේ ම ඔබතුමාට තවත් අවස්ථාවක මතක ද දන්නේ නෑ. ඔබතුමාගේ පෞද්ගලික කටයුත්තක් සඳහා වන රක්ෂණ ආයතනයට ගිය විටෙක, තවත් මහත්මයෙක් කියලා තියෙනවා, බල්බ් ටික දාල නෑ කියලා.ඒ වෙලේ ඔබතුමා කිව්වලු, එහෙම දාන්න බෑ, මන්ත්‍රීතුමාට කිවුව ද කියලා.ඊට පස්සේ කිව්වලු වත්සලා මන්ත්‍රීතුමියට කිවුව කියලා.වත්සලා කියන්නෙ කවුද කියලා ඒ වෙලේ ඔබතුමා ඇහුවලු.ඇත්තට ම මං කියන්නේ ඔබතුමා ලැජ්ජ වෙන්න ඕනේ, ඒක ඔබතුමාගේ ගෞරවයට හානියක්.මේච්චර මාස 6 ක් යනකොට ප්‍රාදේශිය සභාවේ ඉන්න මන්ත්‍රීවරියන්, මන්ත්‍රීවරුන් කවුද කියලා හඳුනන් නෑ කියන එක.මට ඒක ලොකු ගැටලුවක්

වුණා.මොකද ඔබතුමා ඒක ප්‍රකාශ කරලා තියෙන්නේ මගේ සහෝදරයා එක්ක.මං හිතන්නේ ආරියදාස මන්ත්‍රීතුමා සාක්ෂි දරයි, මහ මැතිවරණය, ජනාධිපතිවරණය, හොරගොඩ ප්‍රදේශයේ පෝස්ටර් ටික ගහලා මාලිමාවට උපරිම වැඩ කරපු මගේ සහෝදරයට තමා ඔබතුමා ඒක කියලා තිබුණේ.ඇත්තට ම ලොකු කණගාටුවක් ඇති වුණා.මට ගෙදරට කියන්නේ කුමාරි කියලා.කුමාරි මට හරි දුකයි, මාලිමාවට වැඩ කරපු එක ගැන කිවුවා.වත්සලා කියන කෙනෙක් දන්නේ නෑ කියපුවහම මේ වෙලාවේ, මගේ කණගාටුව ප්‍රකාශ කරන්න මං මේක අවස්ථාවක් කර ගන්නවා.

සභාපතිතුමනි, හොරගොඩට බල්බ් 11 ක් දාන්න තිබුණා.බල්බ් දානකොට එතනට ගිහිල්ල ඉන්න මට එහෙම අවශ්‍යතාවයක් ඇත්තේ ම නෑ ඇත්තටම.මං කියන්නේ ප්‍රදේශයේ මොනව හරි දෙයක්, මගෙ පියා හිටියත් කවදාකවත් නම ගහගෙන වැඩ කළේ නෑ.මං හිතන්නේ උපසභාපතිතුමා සාක්ෂි දරයි.හැම වෙලේ ම වැඩක් කළ යුතුයි කියන තැන තමා හිටියේ.බල්බ් 11 ක් දාන්න තිබුණා.බල්බ් 10 ක් දාලා, මගේ පියාගේ නිවස ඉදිරිපිට බල්බ් එක දාලා තිබුණේ නෑ.මං හිතන්නේ අවුරුදු 30 කට වැඩි කාලයක් ප්‍රාදේශිය සභාවේ හිටපු ජොෂ්ඨතම මන්ත්‍රීවරයා තමා තාත්තා.ඔය සිද්ධිය දැන ගෙන මං තාත්තාට කතා කළා ම කිවුවා අනේ කමක් නෑ කුමාරි කිවුවා.මට හරි කණගාටුවක් ඇති වුණා.ඒ වෙලාවේ උපසභාපතිතුමා කතා කළා.උපසභාපතිතුමා කතා කළා කාවින්ද මන්ත්‍රීතුමාට.කාවින්ද මන්ත්‍රීතුමා කතා කරන වෙලාවේ මං හොරගොඩ.කාවින්ද මන්ත්‍රීතුමා කිවුව ඒක දැකලා නෑ කියලා.ඇත්තටම දැක්කෙ නැති වෙන්න බෑ සභාපතිතුමා.අනිත් 10 ම දාන්නයි ගේ ඉස්සරහ එක නොදාන්නයි.පහුවදා හැබැයි දාලා තිබුණා.ඒකට මං ස්තුතිවන්ත වෙනවා මොකද ජොෂ්ඨතම මන්ත්‍රීවරයා වගේ ම තමයි, දැන් මගේ පියාට අවුරුදු 75 කට වැඩියි පියාට.එතකොට ඒ බල්බ් දාන කොකු ටික ඒ සියලු දේවල් ටික කරලා දීලා තිබුණේ තාත්තට ලැබිච්ච ප්‍රතිපාදනවලින්.ඒකට තමා බල්බ් එක ගිහින් හයි කළේ.ඒ ගැන මට සතුටුයි.මං කියන්නේ එහෙම දේවල් කරන්න එපා.පිළිවෙලකට දාන්න.උපසභාපතිවරයා මැදිහත්වෙලා ඒක දාල තිබුණා.ඒ වගේ දේවල් ඇත්තටම කැතයි සභාපතිතුමා.ඒවගේ දේවල් වෙන්න තියන්න එපැයි කියන ඉල්ලීම මං මේ වෙලාවේ කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම එතුමියට ආවේගයක්, දුකක් ආපු එක සාධාරණයි.නමුත් ඇත්තට ම වෙලා තියෙන්නේ ලයිට් කණුව තියෙන්නේ ගොඩක් වත්ත ඇතුළට වෙන්න.එතන කෙසෙල් ගාලක් තියෙනවා.කෙසෙල් අතු නිසා බල්බ් එක ඇත්තට ම දැකලා නෑ.ඊට පස්සේ පහුවදා ගිහින් දැම්මා.අපි වසම්වල බල්බ් දාන්න යද්දි, කාර්මික නිලධාරී මහත්මයටත් උපදෙස් දීලා තියෙන්නේ, තැනින් තැන බල්බ් දාන්න යන්න එපා කියලා.පිළිවෙලට කොනක ඉඳන් දාගෙන යන්න.ඒක කාගෙද කින්ද මන්ද අදාළ නෑ.අපි මුලින් කරන්නේ තියෙන බල්බ් ටික අලුත් වැඩියා කරන එකනේ.ඒදා බල්බ් 19 දාල තිබුණා එදා ඒ වසමේ.ඒක ඒ අතපසු වීමක් වෙලා තියෙන්නේ.මොකක්ද ඒක අවංක අතපසුවීමක් වෙලා තියෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, විදුලි නිලධාරී මහත්මයා එහෙනම් වැරද්දක් කරලා තියෙන්නේ.ඔබතුමාගේ උපදෙස් පිළි අරගෙන නෑ විදුලි නිලධාරී මහත්මයා.විදුලි නිලධාරී මහත්මයා මෙතනට ගෙන්නන්න.ඔබතුමාගේ උපදෙස් පිළිපැද්දෙ නෑ කියලා මම ඔප්පු කරලා පෙන්වන්නම්.එතුමා උපදෙස් පිළිපැදලා නෑ.ගෙන්නන්.

**සභාපතිතුමා:-**
විදුලි බල්බ් දාන වැඩෙන් මම ඇත්තට ම අයින් වෙලා ඉන්නේ.ඒකට මැදිහත් වෙන්න මට වෙලාවක් නෑ.උපසභාපතිතුමා, සභාපතිතුමාගේ ලේකම්තුමත් එක්ක මේ වැඩේ කරන්නේ.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ලබන මාසේ වෙනකොට අපේ මුස්ලිම් ජනතාවගේ රාමසාන් උපවාස මාසය ආරම්භ වෙනවා.එම නිසා හැම පල්ලියකම, අපේ ප්‍රාදේශිය සභා ප්‍රදේශය ඇතුළත අටක් නවයක් තියෙනවා.ඒ හැම පල්ලියකම රෑ 8 න් පස්සේ යාඥා තියෙනවා.රෑ 10 වෙනකන් තියෙනවා.හැම පාරකින් ම මිනිස්සු පල්ලියට එනවනේ.අතුරු පාරවල්වලින් එහෙම.එම නිසා මම යෝජනා කරනවා අතුරු පාරවල්වල, මං මුන්සීර් මන්ත්‍රීතුමාටත් මං කියන්න තමයි හිටියේ.මං මේ සභාපතිතුමාට මතක් කරන්නේ, අතුරු පාරවල්වලින් රෑට ගමන් ගන්නා නිසා ඒ ප්‍රදේශයේ ඉන්න, අපිව සම්බන්ධ කර ගන්න ඕන් නෑ.ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරයා සම්බන්ධ කර ගන්න. මුන්සීර් මන්ත්‍රීතුමා ඉන්නවා අස්ගගුල පැත්තට.කොහෙන් වුණත් කමක් නෑ,කාටහරි සේවයක්නේ කරන්න ඕනේ.නම දාන්න ඕන් නෑ අපේ.ඒ වගේ ම මෝරගල, බදුවත්ත, තලගහමුල, විලේගොඩ, වගේ ප්‍රදේශ බලලා ඒ ටික කරලා දෙන්න.

අනිත් කාරණය තමා වැකඩ කාණු පද්ධතිය.අපේ උපසභාපතිතුමා ඊයෙ පෙරේදා ආවා මළගෙදරක.අපි දෙන්නා පොඩ්ඩක් කතා වුණා.එතන ඉන්න කට්ටිය ඇවිල්ලා කිවුව මෙන්න මෙහෙම පොඩි ප්‍රශ්නයක් තියෙනවා,මං කිවුවා අපිට නම් තාම ප්‍රතිපාදන මොකුත් නෑ.යෝජනා කොළවල ලියලා දුන්නට, මොකුත් කෙරුන් නෑ තව වෙනතුරු.නමුත් මං උපසභාපතිතුමා පෙන්නලා කිවුවා, උපසභාපතිතුමා ඇවිත් ඉන්නේ, එතුමාටත් පොඩ්ඩක් මතක් කරන්න කියලා.පස්සේ ගමේ මිනිස්සුත් කිවුවා එතනින් යන එනකොට.උපසභාපතිතුමා කිවුවා, ඇත්ත,මිනිස්සුන්ට වාහනයක් යනකොට පොඩ්ඩක් අයින් වෙන්නවත් ඉඩක් තියෙන්න ඕන කියලා එතුමා එතනදි ම කිවුවා.

අනිත් එක මම දැම්ම මහජන ක්‍රීඩාංගනයේ කාණුව.ඒක මං UD එකට යොමු කරන්න කියලා මං දෙතුන් පාරක් කිවුවා.ඒක මේ වෙනකන් තාම මොකුත් කෙරුන් නෑ.UD එකට කිවුවද දන්නේ නෑ.මොකද දන්නෑ වුණේ.ඔබතුමා දැනුම් දුන්න ද?

**සභාපතිතුමා:-**
අපි 9 වෙනිදා ගත්තා නගර සංවර්ධන කමිටුව.ආයේ 16 ගන්නවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**

ඒ අවට මිනිස්සු හැම වෙලේම කියනව මතක් කරන්න කියලා.බැකෝ එකක් දාල පොඩ්ඩක ඇදලා දාන්න තියෙන්නේ.පැය ගාණකින් කරන්න පුළුවන් වැඩක් ඕක.මහ ලොකු වැඩක් නෙමෙයි.කුණු නෑ.වැස්සට තැනින් තැන වතුර පිරිලා.මං ඔබතුමාට ඒක යෝජනාවක් විදිහට කරනවා ඒක පොඩ්ඩක් සලකා බලන්න විශේෂ යෝජනාවක් විදිහට.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං ගිය සභාවේදී කිවුව අපිට දින පොතක් හරි ලබා දෙන්න කියලා.ආයතනයක් හරි සම්බන්ධකරගෙන එම කාර්ය සිදු කිරීම පිළිබඳව මම මේ අවස්ථාවේ ගෞරවනීය ස්තූතිය පුද කරනවා.

ඒ වගේ ම ගරු සභාපතිතුමනි, මිස්බාහ් මන්ත්‍රීතුමා සඳහන් කළා රාමසාන් මාසය වෙනුවෙන් ඒ කටයුතු කෙරෙන්න ඕන කියලා.ඒ වගේ ම තමා, මීට දින කීපයකට ඉහත ඇහැලියගොඩ වත්තේ අලුත් යාය කොටසේ, ඒ අයගේ සිංහල, දමිළ, මුස්ලිම් ඒ ප්‍රජාවගේ සංස්කෘතික වශයෙන් කටයුතු කරන පල්ලි පන්සල් කෝවිල් වල තියෙන උත්සව සම්බන්ධව වැඩි අවධානයක් අපි සභාවට අපි යොමු කරන්න ඕන.අපි ගියවර සභාවලදී මේ කාරණා සිද්ධ වුණා මෙතුමා කිවුව වගේ.මං මේ වෙලාවේ කණගාටුවෙන් වුණත් ප්‍රකාශ කරනවා.මේ දමිළ ඒ ප්‍රජාවගේ ඒ සංස්කෘතික කටයුත්තෙදී ඒ පිරිසක් ඉන්දියාවේ යනවා.ඒක උසස් වීමක් ලබලා පැවිදි වෙලා අපේ පූජ්‍ය පක්ෂය වගේ.එවැනි අවස්ථාවක ඒ කෝවිල අලුත් කැල්ල ඉස්සරහින් හැදුවා දේවස්ථානයක්.කෝවිලක් හැදුවා.ඒ පාර ගැන තමා මම ඉස්සෙල්ලා කතා කළේ.ඒ කෝවිලට බල්බ් එකක් දාන්න කිවුව.ඒ කණුවේ තියෙනවා ඒ කොක්කත්.ඒ අය ඇවිල්ල අපේ උපසභාපතිතුමාට මතක් කරලා තිබුණා.හරි වැඩේ කිවුවා.හැබැයි වැඩේ කෙරුන් නෑ.අවසානයේ ඒ අය ඉන්දියාවටත් ගිහිල්ලා තියෙනවා.ඒ නිසා ඒ මිනිස්සු මේ දිහා ජාතිවාදයෙන් බලනවා.කරුණාවෙන් සවන් දෙන්න.ජාතිවාදයෙන් බලන්නේ.සුළු ජාතීන් කියලනේ කියන්නේ.අපි නම් කවදාවත් සුළු ජාතීන් කියලා කියන් නෑ.ඒ දේ හැගෙන්න තියන්න එපා ඒ මිනිසුන්ට.එවැනි දෙයක් සිද්ධ වුණොත් නැවත වතාවක් අපි අතරේ අසමගිය ඇතිවෙන්න පුළුවන්.එහෙම වුණොත් ඒ කොලහලයට මුල හොයන් ගියොත් බල්බ් එකක් දාපු නැති එකක්.ඒ නිසා මෙවැනි සුළු දේවල් සිද්ධ වෙන්න දෙන්න එපා .මං ඔබතුමාගෙන් ගෞරවයෙන් අවධානය යොමු කරනවා.මොකද අපි මේ ඔබතුමන්ලට කියන්නේ, ඔබතුමා උඩ තියන්නත් නෙමේ.යම් යම් ගැටලු ගැන අපි කතා කරලා තියෙනවා.යම් යම් ගැටලු වෙන්න පුළුවන් තැන් අපි මතක් කරනවා.ඔබතුමා කළා හෝ නොකළා.අපේ උපසභාපතිතුමාගේ මුහුණ හරිම ලස්සනයි පිං පාටයි.හැබැයි ඇතුළත් පිරිසිදු ඇති කියලා හිතනවා.මොකද අපි අවුරුදු 5 ක් සභාවෙ හිටියා.ඒ නිසා සභාපතිතුමනි, ඔබතුමාගේ ගෞවරනිය අවධානය යොමු කරන්න.ඔබතුමාගේ ගෞරවනිය හැසිරිම ගැන අපි විපක්ෂයක් හැටියට අපි ඉතාම සතුටු වෙනවා.මං මේ කියන්නේ දුරදිග බලලා., විදිහකින් ඒ මිනිස්සු ජාතිවාදයකින් බැලුවොත්, ප්‍රශ්න වෙන්න පුළුවන්.මේ පනතෙත් තියෙන නිසා.

ඒ වගේම තව යෝජනාවක් කළා සරෝජනී මන්ත්‍රීතුමිය.කෝවිලට යන අඩි 50 ක් විතර තියෙන මාර්ගය සංවර්ධනය කරලා දෙන්න කියලා.ඒක මුන්සීර් මන්ත්‍රීතුමා හරි, ඔබතුමා හරි කමක් නෑ,ඔබතුමාලා ගිහිල්ල ඒක මුල්ගල් තියලා ලස්සනට ඒ වැඩේ කරන්න.ඒකටත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න, ඒ යෝජනව ඊළඟ වාරයේ දී හරි දාන්න අවධානය යොමු කරන්න, අයින් කරන්න එපා කියලා මං කියනවා.මේ සභාව ගෞරවාන්විතව අරගෙන ගිහිල්ලා, අනාගත පරපුරට අපි සභාවෙන් යම්කිසි දෙයක් කලා යැයි කියන්න.කේ.එල්.රත්නායකමැතිතුමා ඉන්න කාලේ, පෝය දවසේ කඩවල් වහලා.ලයිට් එහෙම දාල දුන්නා.ඒ වගේ ම තිලක් රෝහණ මැතිතුමා, කරුණාපාල මැතිතුමා, සන්දනායක මැතිතුමා ඉන්න කාලේ විශාල සේවාවන් වුණා.එවැනි සේවාවක් කරලා නමක් තියන්න පුළුවන් තැනකට ඔබතුමාට එන්න හැකියාව ලැබෙන්න කියලා අපි විපක්ෂයක් විදිහට ප්‍රාර්ථනා කරනවා.

**සභාපතිතුමා:-**
ගරු සභාවෙන් අවසරයි. මට අත්‍යවශ්‍ය කාරණාවකට එළියට යැමට අවශ්‍ය නිසා, මෙතැන් සිට සභාවේ කටයුතු ඉදිරියට කර ගෙන යැම සඳහා සභාවේ මූලාසනය උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමාට භාර දෙනවා.බොහොම ස්තූතියි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බොහොම ස්තූතියි.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පෙබරවාරි මාසෙ 19 වෙනිදා වන විට මුස්ලිම් ජනතාවගේ නෝම්බි කාලය පටන් ගන්නවා.ඒ සඳහා මිස්බාහ් මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා.ඇහැලියගොඩ අපේ බල ප්‍රදේශය තුළ සාමාන්‍යයෙන් පල්ලි 14 ක් තියෙනවා.ඒකෙන් පල්ලි දෙකක් කුරුවිට සභාවට අයිති වෙනවා.ජුම්මා පල්ලි 07 ක් තියෙනවා.පල්ලිවලට මිනිසුන්ට යන්න තියෙන පාරවල්, මිනිසුන්ට රාත්‍රියට යන්න බැරි තත්ත්වයකින් සමහර පාරවල් තියෙනවා.අස්ගගුල ප්‍රදේශයෙත් ලයිට් වගයක් පිච්චිලා තිබිලා ළඟදි දැම්මා.තවත් ලයිට් එකක් තියෙනවා පල්ලිය ඉස්සරහ.ඒකත් දාන්න ස්වාමී යෝජනා කරලා තියෙනවා.ඒ වගේ අවශ්‍ය තැන් සංවර්ධනය කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒත් එක්ක ම රංජිත් මන්ත්‍රීතුමත් කතා කළා.ඇහැලියගොඩ වත්තේ අලුතින් දාපු කෝවිල.ඒකෙ ලොකු උත්සවයක් තිබ්බා.ගම්වාසීන් එකතු වෙලා තමන්ගේ මැදිහත් වීමෙන් මහන්සියෙන් ලස්සනට හදා ගත්තු කෝවිල.කෝවිල ඉස්සරහ අලුත් කැල්ලට යන පාරේ, පොඩි කෝවිලක් හැදුවා.ඒක පටන් අරන් උත්සවයක් තිබුණා.ගරු සභාපතිතුමනි අපි කියන්න කැමතියි, පොඩි ලයිට් එකකින් මං හිතන්නේ ජාතිවාදයක් ගොඩනැගෙයි කියලා.සභාවෙන් දාන පොඩි ලයිට් එකකින්, සභාවෙන් හදන පොඩි පාරකින්, පොඩි කාණුවකින් ජාතිවාදයක් ඇතිවෙයි කියලා මං හිතන් නෑ.මොකද එතන ඉන්න මිනිස්සු පැහැදිලිව දන්නවා.මාත් ඇහැලියගොඩ වත්තේ, මං ඉපදිච්ච ඇහැලියගොඩ වත්තේ, මං පොඩි කාලේ එහෙ තමා හැදුනේ.මාත් පොඩි කාලේ ලයිම් කාමරවල ඉඳලා තියෙනවා.මං ඒ හින්දා පැහැදිලි කිරීම කෙටි කර ගන්නම්.ගරු සභාපතිතුමනි එම ස්ථානය, මට සැකයක් තියෙනවා.ඔය ලයිට් එකක් පෙන්නලා ඔතන කවුරු හරි ජාතිවාදයක් අවුස්සන්න හදනව ද කියන එක.ලයිට් එකක් පෙන්නලා ජාතිවාදයක් හදන්න හදනවද කියන

එක මට පොඩ්ඩක් සැකයක් තියෙනවා.අපි සතියට දෙතුන් පාරක් අපි ඒ ස්ථානයට යන නිසා අපිට දැනෙවා, ඒක සාමාන්‍යයෙන් දේශපාලන වශයෙන් පාවිච්චි කරන්නත් පුළුවන්.නමුත් ඇත්තම කියනව නම් අපි පහුගිය ආණ්ඩුකාල තුළ ගොඩක් ජාතිවාද වලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙනවා ඇත්තම කියනව නම්.

ගරු සභාපතිතුමනි මං දෙමළ භාෂාවෙන් කතා කරන්න අවසර ඉල්ලනවා.මං පළවෙනි වතාවටතමා මේ දෙමළ භාෂාවෙන් සභාවේ කතා කරන්නේ. (දෙමළ භාෂාවෙන් සභාව ආමන්ත්‍රනය කරයි.)

ගරු සභාපතිතුමනී, ලේකම්තුමනි, ඇත්ත වශයෙන් අපි මෙම මහා සභාවට සම්බන්ධවීමේ හේතුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිවරු ප්‍රකාශ කළ පරිදි ආගම් භේද ජාති භේද ඇති කරන පුද්ගලයින් අප නෙමේ.ජාතික ජනබලවේගයට අයත් අපගේ ප්‍රතිපත්ති අනුගමනය කරන ඕනෑ ම පුද්ගලයෙක් ඕනෑ ම පාක්ෂිකයෙක් ආගම් භේද ජාති භේද ඇති කරන අය නොව බවත්, පසුගිය අවුරුදු 75 තුළ මෙම රටේ සුළු ජාතිකයින් වන අප ගොඩක් දුක්ගැනවිලිවලට මුහුණ දුන්නෙමු.අපි දන්නවා මේ රටේ පසුගිය අවුරුදු 30 තුළ පැවති එම යුද්ධයට හේතු වුයේ එම කාලයේ මුල්ගල් හිටවපු අයයි.මෙම රට පාලනය කරපු, දුක් වින්දෙ මෙම රටේ මිනිසුන්ය.ඔවුන් තුළ ප්‍රචන්ඩත්වය ඇති කර ඔවුන් තුළ ම විනාශයන් සිදු කරා.ඔබ දන්නවා 77, 78 කාලයේ දෙමළ භාෂාව කතා කරන ජනතාවගේ දේපල ගිනි තබා කුඩුපට්ටම් කර ඔවුන්ගේ හිත්වල ප්‍රචන්ඩත්වය වපුරා රට පුරා ගිණි තැබුවා ය.මෙවැනි විවිධ ප්‍රචණ්ඩ ක්‍රියා ඇති කර, ඇත්ත වශයෙන් ඒ යුද්ධයක් ඇති වුණා.අපි දන්නවා හුහක් දේශපාලන නායකයන් වශයෙන් හිටපු අය යුද්ධය ඔවුන්ගේ බලය තහවුරු කර ගැනීමට මිස ජනතාවගේ සුභ සිද්ධියට නොවන බව දන්නවා.අපේ ජාතික ජනබලවේගය පාලනයේ පසුගිය අවුරුදු එකහමාර තුළ කොහේවත් කිසියම් පල්ලියක්, කිසියම් කෝවිලක්, කිසියම් ක්‍රිස්තියානි පල්ලියක්, කිසියම් පුජනීය ස්ථානයක් හෝ විනාශ කළේ නැත.සමච්චලයට ලක් වුයේ නැත.මෙය පැහැදිලි කාරණාවක් කාටවත් ප්‍රතිෂේප කළ නොහැකි.ගරු සභාපතිතුමනි, සත්‍ය වශයෙන් ම අද මිනිස්සු සැනසිල්ලේ ජීවත් වෙනවා.තමන්ගේ ආගමික කටයුතු හා ඇදහිලි ද සැනසීමේ කරනවා.තමන්ගේ ආගමික ස්ථානවලට සැනසීමේ යනවා.මෙවැනි සමාජයක් තමයි ඇති කරන්න ඕනේ කියා තමයි අපි දේශපාලනයට පැමිණියේ.අපි බොහෝ පීඩාවන්ට පත් වු අය වේ.අපි දන්වා පාස්කු ප්‍රහාරය එහි බලපෑම නිසා මේ රටේ බොහෝ ක්‍රිස්තියානි මිනිසුන්ගේ හිත්වලට වඩා අපේ හිත් කලකිරීමට පත් ව ඇත.ඕනෑ ම ක්‍රිස්තියානි භක්තිකයෙක් අපි දකින කොට හිතෙහි දුකක් ඇති වෙනවා.මක්නිසා ද මේ සැලසුම් සහගත වු ක්‍රියාවක් නිසා.අද වන විට ඕනෑම ක්‍රිස්තියානි සහෝදරයෙක් දකින විට හිතට වේදනාවක් ලබා දෙනවා.ඔවුන් ව දකින විට ඔවුන්ගේ හිත්වල ඔවුන්ට සිදු වු ප්‍රශ්න කොයිතරම් දුරට ඔවුන්ට හානියක් කර ඇති බව ඔවුන්ගේ හිත්වලින් පෙනේ.ඒ විතරක් නොවේ.අපගේ ව්‍යාපාරික ස්ථාන තහනම් කරා.මේ විදිහට පාලනය කළ අය අද ජාතික ජනබල වේගය රජයේ පාලනයේ ජාති භේදය, ආගම් භේදය, තිබේ කියා කීම ලැජ්ජා සහගතයි.පුදුමයි.ගරු සභාපතිතුමනි, සත්‍යවශයෙන් ම මිනිස්සු අද සැනසීමේ ජීවත් වෙයි.ලබන 30,31 දිනවල අප ටවුමේ කෝවිලේ වේල් උත්සවය පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත.මෙයට අවශ්‍ය වතුර බවුසර් ඇතුළු සියලු ම පහසුකම් අප සභාව විසින් ලබා දීමට කටයුතු සුදානම් කර ඇත.

-සිංහල පරිවර්තනය -
ඒ.අරුන් ප්‍රසාද්.(විෂය තනතුර - වැවිලි ප්‍රජා පහසුකම් සලසන්නා.)

මං නැවතත් ඒක සිංහලෙන් පොඩි කැල්ලක් කියන්නම්. ගරු සභාපතිතුමනි 31 වෙනිදා මේ නගරයේ තියෙන ශිවන් කෝවිලේ උත්සවයක් තියෙනවා.තේරු උත්සවයක්.ඒකට වතුර බවුසර් අපි සභාවෙන් සියලු කටයුතු ලැස්ති කරලා තියෙනවා.එවැනි තත්ත්වයක අපි ඉද්දි මං හිතන්නෑ.අපි ඇත්තට ම ජාතිවාදය වපුරන සමාජයක් නෙමේ.ආගම්වාදය ගෙනියන සමාජයක් නෙමේ.අපි ඇත්තටම පොඩ්ඩක් කල්පනා කරන්න ඕන පසුගිය කාලවල අපේ රටේ මිනිස්සු දුක් වින්ද ද කියලා.ඒවැනි තත්ත්වයක් ඇත්තට ම දැන් නෑ.ඒ නිසා මං ඉල්ලා සිටිනවා ගරු සභාපතිතුමනි, අපි සියලුම ආගම්, සියලුම ආගමික උත්සවවල් එද්දි ඒවට අපේ සභාවෙන් අපිට කොයි තරම් මැදිහත් වෙන්න පුළුවන් ද? ඒවට මැදිහත් වෙලා අපිට ලබා දෙන්න පුළුවන් උපරිම සහයෝගය දෙමු කියලා මං ඉල්ලා සිටිනවා.බොහොම ස්තුතියි.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම මං මේ දැන් ගියා එහා පැත්තට.ඇත්තටම අපි ලැජ්ජ වෙන්න ඕන මේව කතා කරන්න වුණාහම.මේවා වාර්තාවල ලියවෙන්නත් හොඳ නෑ.අපේ සභාවෙම නිලධාරී මහත්ම මහත්මීන්ලා සියලුම දෙනාම කන්නේ ඔය ටොයිලට් එකට එහා පැත්තෙ කාමරේ.දැන් බලන්න පුළුවන්නම් දැන් මේකෙ දොර ඇරලා.ඇත්තටම ලැජ්ජයි.මාර ගඳක් තියෙන්නේ.මං එතන්ට ගිහින් විනාඩි දෙකක් කොල් එකක් ගන්න ගියේ.මටම ඉන්න බැරි වුණා.මම ගියා එහා පැත්තට.ඒ නිසා ලබන වාරේ එනකොට අනිවාර්යෙන් ම සභාපතිතුමනි, මේකට මොකක් හරි විසඳුමක් තියෙන්න ඕනේ.මොකද මේක අපේ සභාව.ඒ හින්දා අපි ලැජ්ජ වෙන්න ඕනේ.ලේකම්තුමා අනිවාර්යෙනම ඒකට මැදිහත් වීමක් කරන්න.එක්කො අර තියෙන බයෝ ගෑස් එක අයින් කරන්න.එහෙම නැත්නම් ඒකට ආවරණයක් දාන්න.ඒක අනිවාර්යෙන් විය යුතුයි.මොකද අපි මෙතන ඇවිත් කතා කරන්න, අපි ඉන්න තැන අපි හදන් ඉන්න එපැයි.අපි මේ සභාව හදන්න හදනවා එළියට ගිහිල්ලා.සභාවේ අපි ඉන්න කොට අපිට මේකෙ ඉන්න පුළුවන්ද?සමාවෙන්න ඕන.මට මේ දුකක් ඇති වුණා ඒකයි මං මේ කතා කළේ.ඒ හින්දා මේකට අනිවාර්යෙන් ම මොකක් හරි විසඳුමක් ගත යුතුයි.ස්තුතියි.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ ප්‍රධාන මාර්ගයආරම්භ වෙන්නේ නාගොඩින්, බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ ප්‍රධාන මාර්ගය අවසන් වෙන්නේ දිද්දට හැරෙන හන්දියෙන්.මං මීට කලින් සභාවලත් කිවුවා බෝපැත්තට විදුලි බල්බ් දාන්න දිනයක් දෙන්න කියලා.ඒ මාර්ගයේ ආරම්භයේ සිට දිද්දට හැරෙන මාර්ගය දක්වා, ප්‍රධාන මාර්ගයේ තියෙනවා තව විදුලි බල්බ් 15 ක් පමණ දාන්න.නමුත් දැන් කිවුවේ අතුරු මාර්ගවලට දාන්න තියෙනවා කියලා.ඔබතුමා දැන් කිවුවා පිළිවෙළට දාන්න කියලා තමා කියල තියෙන්නෙත් කියලා.නමුත් පිළිවෙළට දාල නෑ.නමුත් ප්‍රධාන මාර්ගය සම්පුර්ණ වෙලා නෑ.නමුත් පළමු අවස්ථාවේදී

පිළිවෙළට බල්බ් ටික දාල නෑ.ඒ නිසා මං ඉල්ලා සිටිනවා, දෙවැනි අවස්ථාවෙදි වත් පිළිවෙළට බල්බ් දාල කටයුතු කළොත් හොඳයි කියලා.ඒ වගේ ම මං කීපවතාවක් ම ඉල්ලා සිටියා මේ විදුලි කාර්මික මහත්මයා ලබා දෙන්න කියලා.නමුත් මේවන තෙක් ලැබුණේ නෑ.මං සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම්තුමාටත් කිව්වා ඒ අවස්ථාව දෙන්න කියලා.ඉතින් ඒ අනුව කටයුතු කරන හැටියට සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි දැන් මාස 6ක් විතර වෙනවා සභාවට ඇවිල්ලා.ඒ මාස 6 ඇතුළත මේ ඇහැලියගොඩට දැවැන්ත වැඩ කොටසක් කරලා තියෙනවා මේ වෙන කොට.සෑම කොට්ඨාශයකම මොකක් ම හෝ වැඩක් කෙරිලා තියෙනවා.ඉතින් ඒ ගැන අපිට පොඩි සතුටක් තියෙනවා.ඒකට සභාපතිතුමා උපසභාපතිතුමා අපේ කණ්ඩායම ඉතා විශාල මහන්සියක් වුණා.අනෙකුත් ප්‍රාදේශිය සභා එක්ක සංසංදනය කළොත් මං හිතනවා ඇහැලියගොඩ ප්‍රදේශය තමයි වැඩිපුර මේ වෙනකොට වැඩ කරලා තියෙන්නේ.ඒක මං හිතනවා 2026 මං හිතනවා ඒක,ඒක අපිට දෙගුණයකින් තුන් ගුණයකින් වර්ධනය කර ගන්න පුළුවන් වෙයි කියලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
සාධක තියෙනවාද?කුරුවිටයි ඇහැලියගොඩයි සංසන්දනය කළොත් ඒකට සාධක තියෙන්න ඕනේ.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
සාධක තියෙනවා.(ඝෝෂාව) අපිට පෙනුන් නැති වුණාට ඇතට ගොඩක් වැඩ කරලා තියෙනවා කියලා, අපිට පෙන්වන්න පුළුවන්.අනිත් එක තමා මේ සභාව තියෙන දවසක.අද වාගේ දවසක අනිවාර්යෙන් සභාපතිතුමනි, මේ පාරේ දාන වාහන ටික, අපේ මේ සභාවේ කණ්ඩායම වාහනවල එන්නේ.වාහන ගැහුවට පස්සේ ඉස්සරහ තියෙන වාහන ගන්න බෑ.පල්ලෙහාට ගියාට පස්සේ සමහර අය චෝදනාවක් කළා.අපි සැලැස්මක් හැදුවොත් හොඳයි.සභාව තියෙන දවසට අනිවාර්යෙන් ම අපේ මන්ත්‍රිවරුන්ගේ වාහන මෙතන ගහනවා.එදාට වාහන ගහන්න එපා කියන්න හරි ඕන.එක දවසයි නේ මාසෙට.ඒ නිසා ඒ සඳහා වැඩපිළිවෙළක් අත්‍යවශ්‍යයි.ඊළඟ එක තමා.අපි හඳුන ගත්ත ගම්මාන තියෙනවා.විශේෂයෙන් ම කම්මල්ගොඩැල්ල.කම්මල් වැඩ කරන ගම්මාන.ඒ අයගෙන් අපේ ඇහැලියගොඩට අවශ්‍ය නිශ්පාදන හදන්න ගම්මානයක් හදමු කියන එක මගේ යෝජනාවක් තියෙනවා.ඒකත් එක්ක මැටි කර්මාන්තය ආශ්‍රිතව ඒ වගේ නිශ්පාදනය කරන්න පුළුවන් කණ්ඩායම් ඉන්නවා ඒ පිරිස් ඒක රාශි කරලා අපි ගම්මානයක් හදන්න බලාපොරොත්තුවක් තියෙනවා.ඒ නිෂ්පාදන දැනටමත් කෙරෙනවා.ඒ ගොල්ලන්ට හොඳ මිලක් තියෙන වෙළඳපොලක් ඇති කරන්න පුළුවන් විදිහේ වැඩසටහන්වලට අපි යමු කියලා මම යෝජනා කරනවා.ඒ එක්ක ම මැණික්වලින් වැඩ කරන, රත්තරන් වැඩ කරන කණ්ඩායම් ඉන්නවා.ඒවා හඳුනාගෙන, ඇහැලියගොඩ ඒ සියල්ල ඒක රාශි කරලා, ඔබතුමාලටත් සම්බන්ධ වෙන්න පුළුවන්.අපි ව්‍යාපෘතියක් හදලා ඒ වැඩ කටයුතු ඉස්සරහට කරගෙන යන්න.ඇහැලියගොඩ නගර සැලැස්ම දැන් මේ වෙනකොට සාකච්ඡා කරලා තියෙනවා.මෙතන කතා කරන සමහර දේවල් ඒකට අදාළයි.ඒවා ඉදිරියේදී සිදු වෙයි.අපි පුළුවන් තරම් ඒකට සම්බන්ධ වෙලා තම තමන්ගේ ගම්වලට අවශ්‍ය යෝජනා හරි ඉදිරිපත් කරන කොට, ඒ යෝජනාව හරි වැදගත් වෙනවා අපිට සාකච්ඡාවට ගන්න.දැන් මේකෙ ඉඩකඩ මදි.ඒක පැහැදිලියිනේ.මං දැක්කා ලේකම්තුමා හා කණ්ඩායමත් එක්කෙ ඉන්න වෙලාවේ ගැටහැත්තේ ගොඩනැගිල්ල.අපි අඩු තක්සේරුවක හිටියට, මං එදා තමා ගියේ බලන්න.ඒ ගොඩනැගිල්ල ඉතාමත් ඉහළ මට්ටමේ සම්පතක් ඒක.මං හිතනවා ඒ සම්පත ප්‍රයෝජනයට ගන්න.සභාව තියන්න ඒකේ.ඒකෙ ඉඩකඩ ඕන තරම් තියෙනවා.අපේ අනික් සහෝදරයින්ට ඉන්න කාමරයක් දෙන්න පුළුවන්.සාකච්ඡා කරන්න තැනක් හදා ගන්න පුළුවන්.ඒක හොඳට ම හොඳයි.ඒ නිසා ඒවගේ ඒවා අපි බලන්න ඕනේ.ඒක කුලියට දෙන්න පුළුවන්.එකෙන් ආදායමක් ගන්න පුළුවන්.ඒ වගේ අදහස්, දැක්මක් අපි හදා ගමු.මොකද අපි නොදන්න සම්පත් තියෙනවා මේ සභාවට අයිති, සමහර තැන්වල.මේ ධිවර සංස්ථාවේ ඉතුරු කැල්ල මම හිතනවා ඒක හදලා ඉවර වෙලා දෙන්න පුළුවන්.ගන්න කට්ටිය ඕන තරම් ඉන්නවා.මං කියන්නේ අපි හැමෝම එකතුවෙලා ඉදිරිපත් වෙන්න.අපි පුළුවන් තරම් උත්සහ කරන්නේ මේ ඇහැලියගොඩ ගොඩ දාන්න.ඒක අපේ කාර්යක් වෙලා තියෙන නිසා අපි ඒනට පූර්ණ කාලීනව ඉන්නවා ඉදිරිපත් වෙලා.

**සභික සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය:-**(දෙමළ භාෂාවෙන් සභාව ආමන්ත්‍රනය කරයි.)

ගරු සභාපතිතුමනි, දැන් සභික මුන්සීර් මැතිතුමා ආගම්වාදය, ජාතිවාදය ගැන කතා කළා.ඔහු කියපු විදිහට කිසිම දෙයක් සිදු වුයේ නැත. (ඝෝෂාව) මිනිසුන් විසින් කෝවිලට විදුලි බල්බයක් සකස් කර දෙන ලෙස ලිපියක් භාර දුන්නෙමු.අද වෙනතුරු එය සිදු වුයේ නැත.මෙම ලිපිය ගරු උපසභාපතිතුමාට භාර දුන්නෙමු.සවිකර දෙනවා කියා පැවසුවා.නමුත් සවි කළේ නැත.එහෙ කෝවිලේ හැමදාම වැඩසටහන් පැවැත්වෙනවා.බල්බයක් නොමැති නිසා රෑ මිනිස්සු කළුවරේ ඉන්නවා.මෙම කෝවිල ප්‍රතිසංස්කරණය කර දෙනවා කියා ප්‍රදීප් සහෝදරයා ඒ සඳහා ලක්ෂ පහක් දෙන බවටත් පොරොන්දු වුණා.නමුත් එය ලබා දුන්නේ නෑ.දෙනවා දෙනවා කියා කටින් ම පැවසුවා.කෝවිලට මොකුත් ම කළේ නෑ.එම කෝවිලට යන මාර්ගය සාදා දෙන ලෙස මා යෝජනා කරමි.එයත් නවතා තිබේ.ඔහු යෝජනා කර ඇතිබව ප්‍රකාශ කළා.ඇයි ප්‍රතිෂේප වුණේ කියා දන්නේ නෑ.දැන් ගරු සභික මුන්සීර් මයා ප්‍රකාශ කළ නිසා කියන්නෙමි.අපි සාමයෙන් ජීවත් වෙන්නෙමු.අපි කිවුවා කියා ඔහු කියනවා.අපි එහෙම කිවුවේ නැත.එසේ ම අපි දැන් ඉල්ලන්නේ වීථි ලාම්පුවක් සවි කර දෙන ලෙස ඔබට හැකියාවක් තිබේ නම් එම මාර්ගය සාදා දෙන්න.මිනිස්සු දැඩි දුෂ්කරතාවයෙන් තමා ගමන් කරන්නේ.එය සාදා දුන්නොත් හොඳයි.හදලා නොදුන්නත් ඔවුන් ඉන්දියාවට ගියා.හැමදාම වැඩසටහන් පැවැත්වෙන නිසා වීථි ලාම්පුවක් ලබා දෙ ලෙස ඉල්ලමි.

-සිංහල පරිවර්තනය -

ඒ.අරුන් ප්‍රසාද්.(විෂය තනතුර - වැවිලි ප්‍රජා පහසුකම් සලසන්නා.)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මං හිතන්නේ එතුමිය කතා කරන්න ඇත්තේ බල්බ් සම්බන්ධව වෙන්න ඕනේ.මට ඒක යන්තන් තේරුණේ.මම දෙමළ දන්නෑ ඇත්තට ම.මට තේරුණු ටිකක් තියෙනවනේ.අපි කිසිසේත් ම ජාතිවාදී නෑ.ඒකට

ජාතිවාදී ලේබලයක් අලවන්න යන එක මං හිතනවා, අපේ රංජිත් මන්ත්‍රීතුමා උත්සහ කරපු එක අපි හෙලා දකිනවා ඇත්තටම.කිසිසේත්ම ජාතික ජනබලවේගය කියන්නේ (ඝෝෂාව)

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ඔයාලට මේක මුල ඉඳන් ම මේක තේරුම් ගැනිමේ නොහැකියාවක් තියෙනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමා දැන් කතා කරානේ.(ඝෝෂාව) එතුමා කතා කරන කොට අපි අහන් හිටියනේ. (ඝෝෂාව)

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ඔබතුමා මේ රටේ දැවැන්ත ප්‍රශ්නයක වචනය ගැන කතා කරන්නේ.මූලාසනාසන සභාපතිතුමා මම කිවුවේ එහෙම කාරණාවක් නෙමේ.ඒක තමා තේරුම් ගන්න කිවුවේ.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ජාතිවාදයක් ගැන කතාවක් ගන්න ඕන් නෑනේ.මං ඒකයි කිවුවේ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
මෙතන ලොකු ප්‍රශ්නයක් තියෙනවා.ඒ ගොල්ලන්ට ඉන්දියාවේ යන්න කලින්,එතන ලොකු උත්සවයක් එතන තිබ්බා.එතන බල්බ් එකක් නෑ.ඒගොල්ලෝ මෙතන්ට ඇවිල්ලා ප්‍රකාශයක් කළා, එතනට බල්බ් එක දාල දෙන්න කියලා.දාල දුන් නෑ.ඒ මිනිස්සු මොකද කළේ, ඒගොල්ලො වැයර් ඇදගෙන ඒ වැඩේ කරා.එතකොට ඔබතුමා ඒ වෙලාවේ කියලා තියෙනවා, දැන් ගහින් මේක දාන්නම් හරි කියලා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
එහෙම කිවුවේ නෑ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ඔබතුමා ඒ වෙලාවේ ක්‍රියාත්මක වෙලා තියෙනවා.මං කියන්නේ ඔබතුමා ඒ වෙලාවේ ක්‍රියාත්මක වුණා කියලා.මං මාස 5 ක් 6 ක් වෙනවා දැන් මං මනත්‍රි වෙලා.සභාපතිතුමා, ලේකම්තුමා අවශ්‍ය නිලධාරීන්ට කිවුවට ඒ නිලධාරීන් ආවේ නෑ.ඒක ඔබතුමන්ලගේ වැරැද්දක් නෙමේ නේ. මං කියන්නේ මෙතුමා කිවුවනේ රාමසාන් උත්සවය ළඟයි, බල්බ් ටික දාන්න කියලා.එතකොට අර ගොල්ලෝ තේරුම් ගනී, ඒකනේ කියන්නේ නොතේරුම් ගැනිමේ හේතුව තමා මේ ප්‍රශ්නවලට මුල එන්නේ.මං කියන්නේ මේව එන්න පුළුවන්.එන්න ඉඩ තියෙනවා.ඒ නිසා මේ ගැන අවධානය යොමු කරලා මෙවැනි දේවල් නොවෙන ආකාරයට අපි වැඩ කටයුතු කළ යුතුයි කියන ප්‍රකාශය තමයි මම මේ ගරු සභාවේ කිවුවේ.නීතිය ඉදිරියේ මම කියනවා පැහැදිලිව ම වාර්තාවේ දාන්න, මේ ගරු සභාවේ මම ජාතිවාදය ඇති කිරීමේ අරමුණින් කිසිම ප්‍රකාශයක් නොකළ බවත්, මං ප්‍රකාශ කරන්න යෙදුනේ ඒ අයගේ භාෂාවේ දැනුමත් එක්ක සවන්දීමේ දුර්වලතාවයකින් වැරදි ක්‍රියාවකට ගියොත් අර ගොල්ලන්ගේ එකට බල්බ් දැම්මා, අපේ එකට දැම්මා මුන් මේ මෙහෙම ගිහින් කියලත් කළේ නෑ කියලා යම් කිසි දෙයක් ඇති වුණොත්, ඒකනේ උතුරයි දකුණයි ඇවිලෙන්න හේතු වුණේ, භාෂාවේ ප්‍රශ්නයක්නේ.එහෙම වුණොත්, කාලෙකදි යම්කිසි දෙයක් වෙන්න පුළුවන්.දැන් ඔබතුමාල බලයට පත් වුණේ, UNP අපේ පක්ෂයයි, පොහොට්ටු පක්ෂයයි වැරදි කළා කියපු නිසා ජනතාව තේරුම් ගත්තා ඔබතුමාලට බලය දෙන්න.ඔබතුමාලගෙන් එහෙම වැරදි නොවෙන්න තමයි මං කිවුවේ ඒ.ඒ නිසා උපසභාපතිතුමා කරුණා කරලා ඉල්ලා අස් කර ගන්න, මම ජාතිවාදයක් ඇති කිරීම සඳහා ප්‍රකාශ නොකළ බව මම මේ ගරු සභාවේ ප්‍රකාශ කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
හොඳයි මන්ත්‍රීතුමා, ජාතිවාදය හරි ජාතික සමඟිය හරි අපිට උගන්වන්න එන්න ඕන් නෑ, මං කියන්නේ.අපේ පක්ෂයට.ඒක මං කියන්න ඕනේ ඉස්සෙල්ලාම.ඒ නිසා මං කණගාටු වෙනවා එතුමියගේ ඉල්ලීමට ප්‍රතිචාරයක් දැක්වීමට නොහැකි වීම ගැන.අපි බල්බ් ටික , පොඩ්ඩක් ඒ ගැන පැහැදිලි කිරීමක් කළොත් අපිට වසම් 44 ක් තියෙනවා.ඒ වසම් 44 අපි ඉස්සෙල්ලම දැම්මේ වරිපනම් සිමාවේ.වරිපනම් සීමාවේත් ප්‍රධාන පාර දෙපස තමයි මුලින් ම දැම්මේ.ඊටපස්සෙ දැන් ඉතුරු වසම්වල දැන් දාගෙන යනවා.ඒ ටිකත් ඉවර වුණාට පස්සේ අපි හැමෝටම දෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඉවර වුණාට පස්සේ දෙනවා කියන්නේ.ඉවර වුණාට පස්සේ මොනවද දෙන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
අපි කොට්ඨාශ මන්ත්‍රිවරුන්ට දුන්නට පස්සෙ දෙනවා.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
මමත් කොට්ඨාශයේ.ඒත් දුන් නෑනේ. (ඝෝෂාව) දැන් අපේ ගමේ මන්ත්‍රිවරු 6 දෙනෙක් ඉන්නවා.මං කියන්නම් නම් වශයෙන්.මෙල්සිරි මහත්මයා ගෙන්නන්න.කාට ඕන විදිහට ද බල්බ් දාන්නේ කියලා බලන්න.ඔබතුමාල දෙන උපදෙස් පිළිපදින් නෑ එයා.මෙල්සිරි මහත්මයා ගෙන්නන්න.මං ඔබතුමාලට කියලා දෙන්නම්.ඇත්තටම තමන්ගේ දේශපාලන පක්ෂයක් හරි, ඥාතීත්වයක් හරි ප්‍රවර්ධනය කරන්න තමයි බල්බ් එක දාන්නේ.මං ඔප්පු කරනවා.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න.කතා කරන අය නැගිටලා කතා කරමු.නැගිටලා කතා කරන ටික තමා වාර්තාවට යන්නේ.නැත්නම් මේක ඔක්කොම රෙකෝඩ් වුණා කියලා, ඔක්කොම ලියන් නෑ.ඒ නිසා නැගිටලා කතා කරන්න.

**සභික පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං සියලු ම දෙනාට සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.බල්බ් සම්බන්ධව ඉල්ලීම් ගණනාවක් කරලා තිබුණා.අපෙත් ගමෙත් මිනිස්සු අහනවා කෝ ලයිට් එකක්වත් දාල දුන්නේ නැනේ කියලා.අපේ ගරු මන්ත්‍රීතුමිය මගේ ගෙදරට එහා පැත්තෙ ගමටත් ලයිට් දාලා, ඊට එහා පැත්තේ ගමටත් ලයිට් දාලා ගියා.ඔබතුමාල ආණ්ඩුපක්ෂය විපක්ෂය කියලා භේදයක් නැ කිවුවට, ගමේ දානකොට බල්බ් දැම්ම කියලා කියාගෙන යන්න තරම් ගුණයක් තිබුණේ නෑ.

ඒ වගේ ම තව ලොකු වැඩසටහනක් කළා මන්ත්‍රීතුමිය.කවදාවත් කිසිම මන්ත්‍රී කෙනෙක්ට බැරි වෙච්චි ජල ව්‍යාපෘතියක්, මගේ ගෙදරට ගෙවල් තුනකට උඩ.ඒ ගැන හැම කෙනෙක් ම හදවතින් ම සතුටට පත් වෙනවා.හැබැයි ඒකෙදි ප්‍රතිපාදන ලබා දෙන පිළිවෙල අතර, මා වෙනුවෙන් රැස්වීමක් සූදානම් කරපු ගෙයක් තියෙනවා.මම ගිහිල්ලා අත්සන් කරලා, අද වෙනකන් අරගෙන නැ වතුර දෙන්න.ඒ පිළිබඳවත් ඔබතුමා අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.දෙන කොට අදාළ සුදුසු පුද්ගලයාට පමණක් දෙන්න.මොකද කල්ප කාලයක් ඒ මිනිස්සු අවුරුදු 60- 70 වක් කලේ ඉණේ තියාගෙන අපේ ගෙවල්වලට පල්ලෙහා ඉඳන් වතුර ගේන්නේ.

ඒවගේම අපේ ගමේ ලොකු ව්‍යාපෘති රාශියක් සිද්ධ වුණා.පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන් වලදී.අපි හොඳ දේට හොඳයි කියනවා.කවදාවත් සිද්ධ වුණු වැඩ ටිකක් සිද්ධ වුණා.අපේ සහෝදර මන්ත්‍රීතුමියත් එක්ක අපිත් කැමතියි, මං මේ සභාවට ආපු මුල්ම දවසෙත්. ආවෙත් සහොදරයෝ වගේ අපි වැඩ කරගෙන යමු කියලා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමා ගොවි සමිතියෙත් ඉන්නවනේ.

**සභික පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ඔව් මං ගොවි සමිතියේ භාණ්ඩාගාරික.මෙච්චර කාලෙකට වෙච්ච නැති වැඩ ටිකක්,මම දේශපාලනයේ හිටියට ලොකු වැඩ ටිකක් සිද්ධ වුණා.ඒ පිළිබඳවත් අපිත් එක්කත් සහයෝගයෙන්, අපිත් මෙතනට ආවේ හොරකම් කරන්න, යටිමඩි ගහන්න නෙමෙයි.අපිත් ඇවිල්ලා ඉන්නේ ගමේ මිනිසුන්ට මොකක් හරි සේවයක් කරන්න.ඔබතුමා සභාවට ආපු මුල් ම දවසෙම කිවුවා,ආණ්ඩු පක්ෂය විපක්ෂය කියලා භේදයක්නැ කියලා.ඒවගේ දේවල්වලට අපිත් සම්බන්ධ කරගෙන. අපෙත් පොඩි අදහසක් හරි අරගෙන මේ වැඩ කටයුතු කරන්න කියලා මං ඉල්ලා සිටිනවා.බොහොම ස්තුතියි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමා ගොවි සමිතියෙත් ඉන්නවනේ.ගොවි සමිතියේ භාණ්ඩාගාරික.අපි මං හිතන්නේ ලොකු වැඩ ටිකක් කළා.අනිත් වසම්වලට එහෙම ලොකු වැඩ ටිකක් කෙරුන් නෑ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒ කියන්නේ ගොවි සංවිධානයේ අපේ හිටපු සභාපතිතුමා සභාපති වශයෙන් වුණේනේ.ඒකෙ බලය අල්ලන්න උත්සහ කළා.ඒක අසාර්ථක වුණා.

ගරු සභාපතිතුමනි, සුභ නව වසරක් ඔබතුමා ඇතුළු සියලු දෙනාටම.දැනට විවිධ ආයතනවල නම් යටතේ නාම පුවරු දිරාපත් වෙමින් පවතිනවා.මං කරුණු වශයෙන් විතරක් කියන්නම්.කතාව කෙටි කර ගන්න ඕන නිසා.ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන්න.දැන් නාමපුවරු බොහෝ තැන්වල නැ.අනිත් තැනවල දැන් දැඩි අබලන් වෙලා ඒවා ගැලවෙමින් යනවා.සමාජයේ ඒවා භාවිතා කරන අය ඒවා යකඩ බවට භාවිතා කරයි.ඒනිසා ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න.

තලාවිටිය ජල යෝජනා ක්‍රමය මාස 6 ක් ඇතුළත ඉවර කරන්න පුළුවන් වෙයි කියලා අපේක්ෂා කළා.දැන් තියෙන තත්ත්වය මොකද?පැවතිච්ච කාලගුණ තත්ත්වය නිසා ගැටලු සහගත වෙන්න ඇති.දැන් තියෙන තත්ත්වය කොහොමද කියලා පිළිතුරක් අපේක්ෂා කරනවා.

ඒත් එක්ක ම දැනට දෙහිඕවිට මාර්ගයේ ගමන් ගන්න සියලු බස් රථ බස්නැවතුම්පල දක්වා ගමන් කරනවා.ඒක ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දක්වා ගමන් කර නැවත බස්නැවතුම්පලට සම්බන්ධ නවනවනම් ගොඩක් හොඳයි.මොකද රෝහලට යන මඟීන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට යන මඟීන්, රාජ්‍ය නිලධාරීන්,ආබාධිතයින්. ආබාධිතයින්ට උඩහට යෑම ලොකු ගැටලුවක් බවට පත්වෙලා තියෙනවා, බස් බස් නැවතුම්පලටම ගමන් ගන්නා නිසා.ඒ ගමන් මාර්ගය ඔබතුමාලගේ මැදිහත්වීමෙන් ඒ ගමන් මාර්ගය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය දක්වා ගමන් කරවන්න ක්‍රමයක් හදන්න පුළුවන් නම් ඒ සඳහා මැදිහත් වීමක් කරන ලෙස මං ඉල්ලා සිටිනවා.

ඒත් එක්ක ම ඇහැලියගොඩ රෝහලට විකල්ප මාර්ගයක් ලෙස ජානිස් මාවත සංවර්ධනය කරන්න කියලා මම යෝජනා කළා.ඒ ගැන දැන් ප්‍රගතිය කොහොමද? මට දැන ගන්න ලැබෙනවා මාර්ග සංවර්ධන අධිකාරියෙන් පැමිණිලා ඒ පිළිබඳව මූලික සමීක්ෂණයක් කළා කියලා.නමුත් අපි දැනුවත් නෑ.ඒක ගැටලුවක් නෑ.අපිට ඕනේ පාර හැදෙන්න.දැන් ඒකෙ ප්‍රගතිය කොහොමද කියලා දැන ගන්න කැමතියි.

ඊට පස්සේ ධර්මපාල විද්‍යාලයේ කොට්ට ගහක් තිබුණා, කපලා ඉවත් කරන්න.මං හිතන්නේ හිටපු නියෝජ්‍ය විදුහල්පති අපේ ආරියදාස මන්ත්‍රීතුමා දැඩි උත්සහයක යෙදුණා ප්‍රාදේශිය සභාවේ මැදිහත් විමෙන් කොට්ට ගහ කපලා ඉවත් කරන්න.මං හිතන්නේ දවස් 15 කට ආසන්න කාලයක් තිස්සේ උත්සහ කළා.ඒකට ප්‍රතිපාදන සභාවේ නෑ.ඇත්තටම මං කණගාටු වෙනවා.ආරියදාස මන්ත්‍රීතුමා එතනදී ලොකු අපහසුතාවයකට පත් වුණා.එතුමා ගහ බලන්න යන්න ගිහාම. මං ආපසු හරවා එවුවා.මොකද මං මන්ත්‍රීවරයෙක් හැටියට එතුමා අපහසුතාවයකට පත් වෙනවට මං කැමති නෑ.දේශපාලන මතය වෙනම එකක් වෙන්න පුළුවන්.ඒ නිසා ඒ වගේ අවස්ථාවක කටයුතු කරන්න, අවශ්‍ය ප්‍රතිපාදන නැත්නම්, ඒකට අවශ්‍ය වැඩපිළිවෙළක් හරි තියෙන්න

ඕනේ.ඒවගේ අවස්ථාවක ක්ෂණිකව ක්‍රියාත්මක වෙන්න.මං හිතන්නේ ඒක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ආපදා අංශයට දැනුම් දීම හරහා, ඒ ගහ කපා ඉවත් කිරීමට අපට හැකියාව ලැබුණා.ඒ ගහ වැටුණ නම් එහෙම,සූර්ය පැනල් පද්ධතියක් තියෙනවා, ඒ ගොඩනැගිල්ල තුළ.තට්ටු දෙකේ ගොඩනැගිල්ලක්.කෝටි ගාණක අලාභයක් වෙන්න ඉඩ තිබ්බා ඒ ගහ වැටුණ නම්.ඒවැනි අවස්ථාවල ක්‍රියාත්මක වෙන්න පුළුවන් ප්‍රතිපාදන,නැත්නම් ක්‍රමවේදයක් හරි නිර්මාණය කර ගන්න කියලා මං යෝජනා කරනවා.

ඒත් එක්ක ම වත්සලා මන්ත්‍රීතුමිය කිවුවා කෙලින් ම සභාපතිතුමාගේ නම කියල, සභාපතිතුමා නැති වුණත් ඔබතුමාගේ අදහස දැන ගන්න කැමතියි.සභාපතිතුමාගේ නම කියල ම මට මෙන්න මේ වගේ අවස්ථාවකට මුහුණ දෙන්න වුණා කියලා, කිවුවා.ඒකට ඔබතුමා දරණ මතය මොකක් ද කියලවත් කියන්නකෝ.සභාපතිතුමා නැනේ මෙතන.

ඒත් එක්ක ම විදුලි ලාම්පු ගැන කතා කරන්න එපා කියලා අපේ මන්ත්‍රී කණ්ඩායම කිවුවා.ඒත් මේක නොකියම බැනේ.විදුලි ලාම්පු සම්බන්ධව මම මේ සභාවේ ප්‍රකාශයක් කරලා, ඔබතුමා කිවුවා පහුවදා දිනේ ගන්න කියලා.මේ දින දෙනව නම්, දින බැලුවොත් එහෙම දින 180 වයි.200 කට ආසන්න කාලයක් අපේ මේ සභාව ආරම්භ කරලා කාලේ ගත වෙලා තියෙනවා.එක්කෙනෙකුට එක දිනයක් දුන්නත් හතර පස්දෙනෙකුට දින දෙන්න පුළුවන්.ඒක කළමණාකරණය කරලා අපට දෙන්න හැකියාව තියෙනවා, ඔබතුමාට අවශ්‍යතාවය තියෙනව නම්.අවශ්‍යතාවය තියෙනවද කියල එක අපට ගැටලුව.

ඒත් එක්ක ම මේ රංජිත් බණ්ඩාර මන්ත්‍රීතුමා අවශ්‍ය විදුලි ලාම්පු ප්‍රමාණය සපයගෙන හයිකරන්න අවස්ථාව දෙන්න කිවුවා.ඒකටත් තව අවස්ථාව දීලා නෑ.ආවෙ නැද්ද කියලා මෙතනදී අහනවා.ඔබතුමාල බලය පවරා දීල, ඒ කට්ටිය ක්‍රියාත්මක නෑ.තාම ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙලා නෑ.හරිම කණගාටුයි.

සරෝජනී මන්ත්‍රීතුමිය දිගින් දිගටම තමන්ගේ ප්‍රදේශය පිළිබඳ ප්‍රශ්න මතු කළා.ඒ එක ප්‍රශ්නයකටවත් ක්‍රමාණුකූලව මැදිහත් වීමක් වෙලා නෑ.මුන්සීර් මන්ත්‍රීතුමා ඇත්තට ම හොඳයි.මුන්සීර් මන්ත්‍රීතුමා හරහා තමා මැදිහත් වීම කරලා තියෙන්නේ.සරෝජනී මන්ත්‍රීතුමිය ඉන්න ගෙට අල්ලපු වත්තෙ කටයුතු කරන්න, ඒක හොඳයි.කවුරු හරි කරන එක වටිනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
කොට්ඨාශ මන්ත්‍රීවරයෙක් ඉන්නවනේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
කොට්ඨාශ මන්ත්‍රීත් මන්ත්‍රීවරයෙක්නේ.(ඝෝෂාව) වත්තෙ කොට්ඨාශය ජයග්‍රහනය කළෙත්,ඒ මන්ත්‍රීතුමියගේ මැදිහත් වීම හරහා.ඒවගේ අවස්ථාවක් දෙන්න ඕනේ එතුමියට.ඒකනේ මං හැමදාම කියන්නේ.කතාව එකයි පොතේ එකයි  කරන විදිහ එකයි කියලා.එහෙම නැතුව අපි එකට කරනව නම් කරමු.කතාව තියෙනවා එක විදිහකට.පොතේ තියෙනවා එක විදිහක්.කරන විදිහ වෙනස්.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමාලා ආදර්ශය දෙන්නකෝ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ආදර්ශය දෙන්නේ අපිද? ඔබතුමාලා ආදර්ශය දෙන්න එපැයි අපි ක්‍රියාත්මක වෙන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒකනේ අදත් කරන්න ගත්තේ.අද උදෙත් පටන් ගද්දිත් ඒ  ආදර්ශය ද දුන්නේ.(ඝෝෂාව)

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒක නෙමෙයිනේ මම දැන් කතා කරන්න ගත්තේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒක වුණත්.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒක වුණත් නෙමෙයි.මං දැන් අහන්නේ.මං හැමදාම කියන්නේ පොතේ තියෙන ක්‍රමය හොඳයි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
අපිට පොතේ තියෙන ක්‍රමය කරන්න තිබුණා.සුජීව මන්ත්‍රීතුමා මෙතනට ඇවිල්ලා ඉද ගත්තනම්.ඒක තමා පොතේ විදිහ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒ සම්බන්ධව දැන් ප්‍රශ්නය නිරාකරණය වෙලානේ තියෙන්නේ.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔයාල යන්නේ සම්ප්‍රධායට නම්, අපිත් සම්ප්‍රධායට යන්.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔය ඔක්කොම ටික අහන්නකො ඉස්සෙල්ලා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒක තමා අහන්නේ.ඒක තමා කියන්නේ පොතේ තියෙන එකයි, ප්‍රැක්ටිකල් කරන එකයි අතර වෙනස පැහැදිලිව පේනවා.ඒක එහෙම නැතුව කරන තාක්කල් විතරයි, අපි දෙගොල්ලන්ට එකතු වෙලා වැඩක්

කරන්න පුළුවන්.ඒනිසා එතන්ට ගේන්න උත්සහ කරන්න.මින් ඉදිරියටවත් ගේන යෝජනාවලට වටිනාකමක් දෙන්න.කටයුතු කිරීමේදී අවශ්‍ය විදිහට කටයුත් කරන්න.මට මෙතුමා කිවුව පහුවදාට දිනේ ගන්න කිවුවා, විදුලි බල්බ දාන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
පහුවදාට දෙන්න කියලා කිවුවේ නෑ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
පහුවදාට දිනේ ඉල්ලගන්න කියලා ඔබතුමා කිවුවේ මට.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මෙහෙමනේ.අපි වසම්වල දාල තියෙන සෙඩුල් එකක් තියෙනවා.ඒ සෙඩුල් එක ඉවර වුණාට පස්සේ දෙනවා කියලා කිවුවේ.පහුවදා දෙනවා කියලා කිවුවේ නෑ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
උපසභාපතිතුමා අහපු ප්‍රශ්න ටිකට උත්තර දෙන්න.නැත්නම් අමතක වෙයි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
හරි මම දෙන්නම්.මං ලියාගෙන තියෙන්නේ.බය වෙන්න එපා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
බය නෑ ඔයා ගැන.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං අහන්න කැමතියි,විදි ලාම්පු ටික මගේ අතින් වියදම් කරලා ගෙනැත් තියෙන්නේ.මාස 6 ක් වෙනවා දැනට.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ ටික දැම්මේ නැද්ද තාම.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
තාම දැම්මෙ නෑ.ඒකට දිනයක් දෙන්න පුළුවන්ද? (ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
හරි හරි ඔබතුමාල පොඩ්ඩක් ඉන්නකො මේක මට කතා කරන්න දීලා.(ඝෝෂාව)

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
මම මේ ළඟදි හිඳුරංගල ඉස්කෝලෙට වතුර නෑ කියලා,කියලා තියෙනවා.මං අතින් ලක්ෂ දෙක හමාරක් වියදම් කරලා වතුර ටික අරන් දුන්නා.අපි අතින් වියදම් වියදම් කරලා ගත්ත බල්බ් ටික දාන්න ඔබතුමාලට සහයෝගය දෙන්න බැරි නම්,

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සතුටුයි.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
සතුටුයි කියන්නේ, අපට සතුටු වෙන්න නෙමෙයි.ඔබතුමාලට සතුටු වෙන්න.මම ලක්ෂ ගානක් දීලා මේ බල්බ් ටික ගෙනැල්ලා, ජයසේකර මන්ත්‍රිතුමාගේ ගේ ඉස්සරහට දැම්මා හතළිස් දාහක බල්බ් එකක්.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සතුටුයි.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
එතුමාට බෑ රුපියල් 100.00 ක බල්බ් එකක් ගෙනැත් දාන්න.මොකක්ද ඒ දේශපාලනය.ඉලෙක්ට්‍රීසියන් මට හෙට දෙන්න.මම කොට්ඨාශ දෙකේ ම ලයිට් ටික දාල දෙනවා එක දවසින්.ඔයාල දන්න කෙනාට කරන්න දෙන්නෙත් නෑ.අපිට කරන්න දෙන්නෙත් නෑ.අපි කියන්නේ අපිට දෙන්න ඉලෙක්ට්‍රීසියන්.එයාගේ කුලියත් දෙන්නම් ඕන්නම්.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
අපි දෙන්නම්.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
අපි දෙන්නම් කියන්නේ.දෙන දිනේ කියන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
දැන් කියන්න මගෙ අතේ සෙඩුල් එක නෑ.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
අපි ගෝමරගල වත්තට සිමෙන්ති කොට්ට 100 ක් ඉල්ලුවා.ඒක දුන්නෑ.මීටිපොල මන්ත්‍රිතුමීට නම් 100 ක් දුන්නා.15 වෙනිදා ඔබතුමාලට ආරාධනා කරන්නම් ඕන්නම්.අපි 15 වෙනිදා කොන්ක්‍රීට් කරනවා පාර.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සතුටුයි ඇත්තටම ප්‍රතිපාදන හොයාගත්ත එක ගැන.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
වසන්ත මන්ත්‍රීතුමා මට කියනවා, වැඩේ නම් ආරංචි වුණා.මං ඊළඟ පාර මොකක් හරි කරලා දෙන්න නම් කියලා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
කවුද?

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
වසන්ත මන්ත්‍රීතුමා.මං කිවුවා ඔයත් එන්න 15 වෙනිදා කොන්ක්‍රීට් කරන තැනට ඇවිත් යන්න කියලා.ඊගාව එකේදි එතුමා උදව්වක් කරන්නම් කිවුවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමාලගෙත් ඉන්නවනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු නේද?ප්‍රතිපාදන ගන්න.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ප්‍රතිපාදන අපිට දෙනව නම් හරි.ඔබතුමාලා අපිට දෙන බල්බ් එකවත් දා ගන්න දෙන්නෙ නැතුව කොහොමද ඉලෙක්ට්‍රීසියන්.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමාල ගන්නකෝ. ගන්නකෝ.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
පොඩ්ඩක් ඉන්නකෝ.ඉස්සරහට පොඩි කාලයක් ඉන්න.මන්ත්‍රීල ඇමතිල අපිත් වෙයි.ඒක හින්දා මම ඉල්ලීමක් කරනවා කවද්ද මට ඉලෙක්ට්‍රීසියන් දෙන්න පුළුවන් කියලා, කියන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මට දැන් කියන්න බෑ.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ඒක තමයි වෙන්නේ ඉතින්.ඒක කියන්න බැරිනම්

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
දැනට දාගත්ත සෙඩ්‍යුල් එකක් තියෙනව නේ.ඒ සෙඩ්‍යුල් එක ඉවරවෙලා කියන්නම්.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
දැන් මාස 6 ක් වෙනවනේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මාස 6 ක් නෙමේ.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ඉලෙක්ට්‍රීසියන් කියනවා අපි කතා කළා ම, සභාපතිතුමා එන්න එපා කියලා තියෙනවා කියලා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
එක වසමක ඒවා අපිට එක දවසින් දාන්න බැනේ.වියලගොඩ ගත්තොත් එහෙම 58 ක් තියෙනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
දැන් මාස 6 ක් වෙනවනේ.අපි ඉල්ලලා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒක තමයි මම කියන්නේ.එක දවසට දාන්න පුළුවන් 15 උපරිම වැඩ කළත්.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
15 ක් නෙමේ, මට 5 ක් දාන්න එවන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සමහර දවසවලට වහිනවා.තව වෙන වෙන වැඩ යෙදෙනවා.උසාවි යන්න වෙනවා.ඉලෙක්ට්‍රීසියන්නේ ත්‍රිරෝද රථ රියදුරා වෙන්නෙත්.ඒ නිසා කොට්ඨාශවල මන්ත්‍රීවරු ඉන්නවනේ.දිලින් මන්ත්‍රීතුමත් ඉන්නවනේ.මෙතුමටත් දෙන්න තියෙනවා.කොට්ඨාශ මන්ත්‍රීවරුන්ට දීලා ඔබතුමාලට දෙන්නම්.එපාද?

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මට එපා.මං වෙනුවෙන් වැඩ කරන්න ඕනතරම් මන්ත්‍රීවරු ඉන්නවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
හරි හරි.එහෙනම් තව එකක් අඩු වෙනවා.ඒහෙනම් ඉක්මනටම හම්බෙයි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

මට හම්බෙන එක දෙන්නකො එතුමට.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
හරි හරි.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා:-**
ඇරැපොල හන්දිය කරුවලයි.හිදුරංගල හන්දිය කරුවලයි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමා, මට ලිපියක් ඇවිත් තියෙනවා නාකන්දල ප්‍රදේශයේ ගම්වාසීන්ගෙන්, ඔබතුමාටත් පිටපත් දාල තියෙනවා.නාකන්දල ගමේ ගමට ඇතුල් වන පාරේ.පාරම අබලන් තත්ත්වයේ පවතිනවා කියලා.නාකන්දල ගමට ඇතුල් වන පාරේ පාලම අබලන් තත්ත්වයේ පවතින බැවින් එල්ලාවල මාර්ගය භාවිතා කරන ලදී.මෑත කාලයේ අධික බර පැටවූ බැකෝ යන්ත්‍ර පාලම උඩින් රැගෙන යන බැවින් පාලම පුපුරලලු තියෙන්නේ.ඒ පිළිබඳ සභාවේ විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඔබතුමාලගේ පළමු අවුරුද්දේ, පළවෙනිදා වැඩ පටන් ගැනීමේ උත්සවය තිබ්බා.ඒකට ඔබතුමා අපිට මැසේජ් එකක් දාල තිබුණා රුපියල් 500.00 ක් දෙන්න කියලා.අපි ඒකට අපේ මන්ත්‍රීවරු 7 දෙනෙක් හෝ 8 දෙනෙක්, මට ගාන හරියටම මතක නෑ.අපි ඒ ඉල්ලීමට සහයෝගය දක්වමින් අපි ඒ මුදල ලබා දුන්නා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමා ආවේ නැනේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
කියන්න දෙන්නකෝ.පනින්න එපා හැම දේටම.ඔතනට තාම ගියෙ නෑ.මෙතන ඉන්නවා වගේ ඉන්නකෝ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සභාපතිතුමාට ඕන දෙයක් කතා කරන්න පුළුවන්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
රුපියල් 500.00 ක් ඉල්ලුවා.අපි ඒකට මුදල දුන්නා.ඔබතුමාලට ඒ වැඩේ කර ගන්න බැරි වෙලා හරි, ඔබතුමාල ඒක ඉල්ලනකොට අපි ඒ අවශ්‍ය මුදල දුන්නා.අවශ්‍ය සහයෝගය දැක්වුවා.එතකොට ඒ බෙදූ ආකාරයටම සභාවේ අරමුදලුත් මේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට බෙදන්න.සභාවෙන් අපි පළවෙනි දවසෙම අපි ඉල්ලනවා.බල්බ් එකක් දානව නම්, වීදි ලාම්පු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට එකක් හරි දෙන්න කියලා.හැබැයි ඔබතුමාලා ඒකට එකඟ වෙලා නෑ තාම.ඉතින් ඔබතුමාල ඉල්ලපුවහම උපසභාපතිතුමා ඒක අපි කළා.උත්සවයට ආපු නැති එක අපේ පෞද්ගලික තීරණයක්.උත්සවයට ආපු නැති එක අපේ වැඩක්.ඔබතුමාල අපෙන් ඉල්ලුවේ සල්ලි දාන්න කියලා.අපි සල්ලි දුන්නා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
අපි එහෙම ඉල්ලුවේ නැනේ.කාර්යාලයෙන් දාල තියෙන්නේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
එහෙනම් ඉතින් කාර්යාලයේ ඉන්න නිලධාරීන් අයින් කරන්න කියන්න.ඔයාලට ඕන් නැති ඒවා සභාවේ GROUP එකට දානව නම්.මොකක්ද කරන්නේ ඔයාලා.ඔෆිසියල් වට්ස්ඇප් GROUP එකට ඕන ඕන මැසේජ් දානව නම් මොකක්ද මේ වැඩේ තේරුම.මෙහෙම මිනිස්සුන්ව අපහසුතාවට පත් කරන්න එපා.නිලධාරීන්ව අපහසුතාවට පත් කරන්න එපා මන්ත්‍රීතුමා.අමිල් මන්ත්‍රීතුමා ඒවගේ වැඩ කරන්න එපා හරිද? ඔයාල හැමදාම නිලධාරීන් පිටම තියලා තියෙන්නේ.දැන් අර 6 වසර පන්තියට දාල තියෙන මොඩියුල (ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
අදාළ දේ කතා කරන්න. (ඝෝෂාව)

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අද ඔයාල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අකුළගෙන තියෙනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
අකුළගෙන කොහෙද තියෙන්නේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අකුළගෙන තියෙන්නේ.(ඝෝෂාව) කෝටි ගාණක් වියදම් කරලා පොත් අච්චු ගහලා. (ඝෝෂාව) අපි මෙච්චර දවස් බොහොම සහයෝගයෙන් වැඩ කළා.කොච්චර අපිට අසාධාරණ කම් කළත් අපි සද්ද වැඩි කරලා කතා කරලා නෑ උපසභාපතිතුමා.ඔයාල නිලධාරීන්ව පාවලා දෙනවනේ.මොකක් ද මේ කැත වැඩේ.නිලධාරීන් කොහොමද වැඩ කරන්නේ මෙහෙම.උපසභාපතිතුමාට මම මේ අවස්ථාවේ යෝජනා කරනවා, මැසේජ් එකක් දාපු කෙනා ගැන පරීක්ෂණයක් පවත්වන්න කියලා, වැරදි නම්.අමිල් මන්ත්‍රීතුමා නිකන් මිනිස්සුන්ගේ ඇගේ දාන්න එපා හරිද?අපි සද්භාවයෙන් කිවුවේ.අමිල් නිමේෂ මන්ත්‍රීතුමා කිවුවා.අපි මොකක්ද මන්ත්‍රීතුමා කිවුවේ.සල්ලි ඉල්ලුවා අපි දුන්නා.වැරදියි කිවුවේ නෑ.අපි කිවුවේ ඒ වගේ සභාවේ අරමුදල් අපිටත් දෙන්න කියලා.මිනිස්සුන්ට වැඩක් කරන්න.ලයිට් එකක් දෙන්න කියලා කිවුවේ.වෙන දෙයක් නෙමේ ඉල්ලුවේ.ඒකට මේ නිකන් ඉන්න අහිංසක මිනිස්සු පාවලා දෙන්න එපා.නිලධාරීන්ව පාවලා දෙන්න එපා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
නිලධාරීන් පවලා දුන්නෙ නෑ.ඔබතුමා කතාව කරගෙන යන්නකෝ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අනේ උපසභාපතිතුමා මේ දැන් කිවුව එක නෑ කියන්න එපා.පිළිගන්නකෝ.අමිල් නිමේෂ මන්ත්‍රීතුමා කියන්නේ.වර්තාවේ ලියන්න.වාර්තාවේ ලියන්න.එතුමා පිළිගත්තා, එතුමා කිවුවේ වැරදි කතාවක් කියලා.පිළි ගන්න වැරදි නම්.මොකද එහෙම මිනිස්සු පාවලා දෙන්න එපා.නිලධාරීන් අපිව විශ්වාස කරලා ඉන්නවා.ඒ නිලධාරීන් පාවලා දුන්නහම කොහොමද වැඩ කරන්නේ.විහිලුවට නෙමේ.

ඒ වගේම මං මේක සභාවේ කතා කරන් නෑ කියලා හිටියේ.මම ඉස්සෙල්ලා ලේකම්තුමාටත් ප්‍රකාශ කළා කියන් නෑ කියලා.නමුත් උපසභාපතිතුමා කිවුවා ඔතන ඉන්නකොට ඕන දෙයක් කරන්න පුළුවන් කියලා.ඒ නිසා මට කතා කරන්න වෙනවා.මම ඊයේ වට්ස්ඇප් group එකට මැසේජ් එකක් දැම්මා.පනතයි රීති පොතයි හොඳට කියවගෙන එන්න කියලා.ඒකෙ අදහස මං කියන් නෑ කියලා හිටියේ.හැබැයි මම ඒක අද කියනවා.මේ දැන් නැගිට්ටටත් පස්සේ තමා ඒක කියනවා කියලා හිතුවේ.පනතේ තියෙනවා සභාපතිවරයාට උපසභාපතිවරයාට හා ලේකම්වරයාට බලය, යම්කිසි කාර්යන් කිරීමට බලය ලබා දෙන ආකාරය පිළිබඳ යම්කිසි ක්‍රම වේදයක් තියෙනවා.පනතේ 8 වෙනි වගන්තිය කියනවා,යම්කිසි කාර්යක් සඳහා උපසභාපතිවරයාට හෝ ලේකම්වරයාට බලය පවරනවනම් ලිඛිතව ලියවිල්ලකින් බලය පවරන්න ඕන.කියවල බලන්න.දන්නවනේ ඒක.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
දන්නවා ඒක.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
එතකොට ඊයේ ආසන පැනවිම සිදු කළේ සභාපතිවරයා හෝ ලේකම්වරයා නෙමේ.ගරු උපසභාපතිතුමා වට්ස්ඇප් මැසේජ් එකේ දාල තියෙනවා, අපි කතා වෙලා මේක කළා.ඒක දැම්මා.ඒක පටන් ගැනීමෙදිම වැරදියි.හරිද උපසභාපතිතුමා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මොකක්ද පටන් ගැනිමෙදිම වැරදි?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔබතුමාට ඒක කරන්න බලයක් නෑ කියන එක.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මට බලයක් නැති එක හරි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
එහෙනම් එච්චරයි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
වට්ස්ඇප් එකට මැසේජ් එක දාපු එක විතරයි මං කළේ.සභා කටයුතු මිස් හැදුවේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
වටපිටාවේ කරන දේ මට පේන් නෑ.අපිට පේන්නේ වට්ස්ඇප් එකට දාපු එක විතරයි.අපිට පේන්නේ උපසභාපතිතුමා වට්ස්ඇප් එකට දාන එක.ඔබතුමා තමා ඒක සන්නිවේදනය කළේ.ඒවා මෙතනට ආවට පස්සේ කියන්න ඕනේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මොකක්ද ඒකෙ අවුල?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
වැරදියි කියලා කියන්නේ.ඒකට ඔබතුමාට බලයක් නෑ කියලා කියන්නේ.ඒකත් අමිල් නිමේෂ මන්ත්‍රීතුමා කියනවා වගේ,ඔයාලට කියන් නැතුව දාලද කියලා අපි දන්නෙ නෑ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
කියන් නැතුව නෙමේ.ඔබතුමන්ලා මෙතන්ට ඇවිත් සභා වෙලාවේදී, උදේ පාන්දර ප්‍රශ්න දාගන්න නිසා තමා, ඒකට මැදිහත් වුණේ.අදත් වුණානේ.දවල් 11 විතර වෙනකන් කාලේ කැවනේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
කාලේ කැවෙ නෑ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
කාලේ කෑවා.ඇයි නැත්නම් ආපස්සට ගියේ.ආපස්සට ගත්තේ මොකක්ද?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔයාලනේ මේ තිබ්ච්ච විදිහට තියාගෙන ඉන්නේ.ආපස්සට ගිහිල්ලා නෑ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ආපස්සට ගිහිල්ලා නෑ.හරි එහෙනම් ඊ ළඟ පාර පනත අනුව ක්‍රියාත්මක වෙමු.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
පළවෙනි දවසෙම පනත අනුව කර ගන්න බැරි වුණාට අපිට කරන්න දෙයක් නෑ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
පළවෙනි දවස නෙමෙ, හරි ඊළඟ පාර තියමු පනත අනුව.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
(ඝෝෂාව) ඔබතුමාට ඕන විදියට පුටු හැදුවට අපි කතා කරනවා මිනිස්සු වෙනුවෙන්.අපේ කට පුටු පස්සට දාල වහන්න බෑ.අපි කතා කරන්නේ මිනිස්සු වෙනුවෙන්.අපි කතා කරන්නෙ මිනිස්සුන්ට වැඩ කරන්න කියක් හරි දෙන්න කියලා.මිනිස්සුන්ට දෙන්න ලයිට් එකක් දෙන්න කියලා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
කිසිම ප්‍රශ්නයක් නෑ.ඉස්සෙල්ලා ප්‍රශ්න අහලා ප්‍රශ්න දිග් ගස්සලා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
මොකක්ද කරපු ප්‍රශ්නේ

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමන්ලා කරපු ප්‍රශ්නයක් තමා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔබතුමන්ලනේ මේ දෙන්නව ඡන්දවලට අරගෙන, සාධරයෙන් පිළිගන්නවා කියලා බදා ගත්තෙ අපිද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ සාදරයෙන් පිළිගත්තා කියලා ඒ අයගේ පුටු වෙනස් කරන්න බෑ. පුටු වෙනස් කරන්න ඔය ගොල්ලන්ට අයිතියක් නෑ.ඔයාලට මොකක්ද තියෙන අයිතිය.එහෙම මොකක්ද තියෙන අයිතිය?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
මොකක්ද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
කොතන හරි ඉන්න මන්ත්‍රීවරයෙක්ගේ පුටුවක් වෙනස් කරන්න ඔබතුමන්ලට තියෙන අයිතිය මොකක්ද?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
සභාවේ විපක්ෂයේ අපි කට්ටිය එකතුවෙලා තීන්දුවක් ගත්තා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
එහෙම තීරණ ගන්න බෑ.සභාව වැඩ කරන්න ඕන ඒ විදිහට.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔයාගේ ඔය කේන්තියෙන් වැඩ කරන්න බෑ හරිද?සභාපතිතුමා උදේ මෙච්චර ලොකු ප්‍රශ්නයකුත් විසදගත්තා.ඒ හින්දා ඔය කේන්තිය නිවාගෙන ඉන්න ඉස්සෙල්ලා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
කේන්තියක් නෑ.ඔබතුමන්ලා හරි අසාධාරණ කතා කියන්නේ.තමන්ගේ අතේ වැරදි තියාගෙන.අඩුපාඩු තියාගෙන.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
මොකක්ද අසාධාරණය? මොකක්ද අඩුපාඩුව?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔබතුමන්ලා ඇති කරපු ප්‍රශ්නයක්නේ.අනවශ්‍ය ප්‍රශ්නයක්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔයාලනේ ඒ දෙන්නා ගත්තේ, අපි යැයි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ දෙන්නා ගත්තා කියලා, ඒගොල්ලො පුටුවලින් මාරු කළේ නෑනේ.කවුද පුටුවලින් මාරු කළේ? (ඝෝෂාව) මොකක්ද අවුල?(ඝෝෂාව) ඇයි එහෙම කරන්නේ?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
(ඝෝෂාව) බුලත් විටේට අරගෙන මේ දෙන්නා හපලා හපලා විසි කරලා දානවා.එහෙම කරන්න එපා හරිද?ගත්ත නම් පිළිගන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ ගොල්ලන්ට තියෙන්න ඕන ඒ ගොල්ලන්ට තිබ්ච්ච තැන.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
තිබ්ච්ච තැන් කොහෙද?එයාල ගියානේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඔයගොල්ලෝ කොහොමද වෙනස් කරන්නේ?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

අනේ මේ උපසභාපතිතුමා, වෙනස් කරලා පෙන්නුවනේ ගිය සතියේ.අපි මේ සභාව කරගෙන යන්න ඕන හින්දා අවුරුද්දෙ පළවෙනි දවසේ, වැඩක් නැති හින්දයි එකඟ වුණේ.ඔයාල ඕන දෙයක් කර ගන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
එහෙනම් ලබන පාරත් වෙනස් කරලා බලමු.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔයා මේකෙ පුටු තිය තියා ඉන්න.වෙන වැඩක් කරන්නෙත් නැනේ.පාරවල් හදලා මොනව කරන්නද හිතන් ඉන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
නෑ නෑ මොනවත් කරන් නෑ.(ඝෝෂාව) අපි පීඩනනේ පිට කරන්න දෙමු.විපක්ෂයටත් තියෙනවනේ පොඩි ආතතියක්.ඒකයි මං බැලුවේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔයාට තමා ආතතිය තිබුණේ.දැන් ඔය ළමයින්ගේ පිටින් පිට කරන්නේ.දැන් 6 වසර ළමයින්ගේ පිටිනුත් යවන්නේ.දැන් ඔය රිවස් කරන්නනේ.ඒවනේ ආතතිය පිට කරන්නේ.

ගරු උපසභාපතිතුමා අපිට මේ අවුරුද්දේ නැවතත් ඒ ඉල්ලීම කරනවා, ඔය දෙන අරමුදල් අර අපෙන් සල්ලි ගත්ත වගේ අපිටත් ලබා දෙන්න.නැත්තන් ඔය ආතතිය පිට වෙන්නේ බලංගොඩ නගරාධිපතිතුමාගෙන් ආතතිය පිට වුණානේ.ඒවගේ බියගම නගරාධිපතිතුමාගෙන් එහෙම ආතතිය පිට වෙලා තියෙන්නේ.පෞද්ගලික හේතුන් මත ඉල්ලා අස්වෙලා තියෙන්නේ.කාට ඕවා වෙයිද දන්නෙ නෑ.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සමහරු හිතාගෙන ඇති එහෙම නේද?අදාළ දේවල් කතා කරන්න.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔබතුමා කලබල වෙලා ඉන්නෙ අද.ඔබතුමාට ගමනක් යන්න පුළුවන්.ඒ ගමන යන්න.අපි සුභ පතනවා.හැබැයි කලබලෙන් යන්න එපා.හරිද?

අනික ජාතිවාදී කතාව.ජාතිවාදී කතාවක් අපේ මන්ත්‍රීතුමාගෙන් ප්‍රකාශ වුණේ නෑ.එතුමා කිවුවේ එහෙම දෙයක් වෙන්න ඉඩ තියෙනවා, ඒ කට්ටිය එහෙම හිතයි කියලා.ඒවා නිවරදි කර ගන්න පන්සලකට කෝවිලකට හරි ලයිට් එකක් හරි දාල දෙන්න.නැත්නම් අර මයියංගනයේ හාමුදුරුවන්ට බයිනවා වගේ මේ ඉන්න කෝවිලේ ඔයාලගේ පූසාරීතුමාටත් බැන බැන යයි.බොහොම ස්තූතියි.ඔබතුමාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම මේ වර්ෂය තුළ ඔය ආණ්ඩුව කොහොම හරි රැකගෙන ඉන්න බලන්න.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
උපසභාපතිතුමනි,වැරදිවැටහීමක ඉන්න බවක් පේන්නේ.මොකද ප්‍රතිපාදන ලබා දීමේ විෂමතාවක් ගැන නේ කියවෙන්නේ.ඇත්තට ම මේ අපේ මන්ත්‍රීවරු කවුරුවත් ඡන්දෙ ගත්තේ පාලම් හදලා නෙමේ.බෝක්කු හදලා නෙමේ.ලයිට් දාල නෙමේ.අපිට ඒ ඡන්දෙ දුන්නේ වෙන අරමුණක් තියෙන මිනිස්සු ටිකකට.ඒ නිසා අපි ලයිට් පස්සේ යන්න ඕනේ නෑ.අනික මේ සියලු දෙනා එකතු වෙලා පාරවල් ටික හැදුවහම, ලයිට් ටික දාපුවහම ඒකේ නම්බුව යන්නේ ප්‍රාදේශිය සභාවට.ඒ කියන්නේ මාලිමාවට එන්නේ.ඒ නිසා අපි කලබල නෑ.අපි ඉස්කෝලෙක ගුරුවරු වැඩ කරන කොට, ළමයි වැඩ කරන කොට ප්‍රින්සිපල්ට තමා ඒකේ ලකුණු එන්නේ මොනව වුණත්.ඒ නිසා මේ කවුරු මොනව කළත් අපි එතන ඉන්නේ.අපි මේ සියලු දෙනා වසම තුළ වැඩ කරන කොට කොහොම වුණත් ඒ ක්‍රෙඩිට් එක එන්නේ එතන්ට තමා.ඒ නිසා අපි එහෙම නෑ.සභාපතිතුමනි, මේ අය විවිධ විදිහට හිතුවට.මේ රට දියුණු වුණොත් ඒ ප්‍රශ්නය එන්නේ කොහාටද පවතින රජයට.කවුරු කළත් එහෙම තමා.ඒ නිසා අපි එහෙම නෑ.අපි එහෙම බෙදන්නෙ නෑ.ලයිට් දාන්න.අපි කවුරු දම්මත් අපි කැමතියි.පාර හැදුවත් අපි කැමතියි.ඒක වැරදියට තේරුම් ගන්න එපා.අපි එහෙම කරන් නෑ.අපි ප්‍රතිපත්තියක් විදිහට අපි ඉන්නේ එතන.ඒ නිසා වැරදි කාරණා ඔස්සේ ගිහිල්ලා මේක වැරදි පැත්තට ගෙනියනව නම් ඒක හොඳ නෑ මං කියන්නේ.එහෙම වෙන්න හොඳ නෑ.අපි ඉන්න තැන තමයි එතන.ඒක අපි කරන්නේ නෑ.කණ්ඩායමත් එක්ක අපි කරන්නෑ.එතන තේරුම් ගැනීමේ වැරැද්දක් තියෙනවා කියලා මට හිතෙන්නේ.අපි කණ්ඩායමක් විදිහට එහෙම තමා තීන්දු ගන්නේ.ඒක දකින කෙනා වැරදි විදිහට තේරුම් ගන්නවද කියලා අපි දන්නේ නෑ.අපි හැම වෙලාවෙම තනි තනි පුද්ගලයෝ හැටියට වැඩ කරන්නේ නෑ.අපි සියලු දෙනා ම සාමූහිකත්වය තුළ ඉඳන් වැඩ කරන්නේ.අපේ සාමූහික අරමුණ තමා කාටවත් භේදයක් ඇති කරන්නෑ.හිතේ තියෙනව නම් මොකක් හරි විෂබීජයක් ඒක පෙනෙයිද මං දන්නේ නෑ.මං හිතන්නේ එහෙම නෑ.එහෙම තියෙනව නම් ඒක අයින් කර ගන්න.එහෙම වැරදි දේට එන්න එපා.අපි සියලු දෙනාම කරන්නේ සද්භාවයෙන්.අපිට ඕනෙ මේ රට හදා ගන්න.අපිට මේ පොඩි පොඩි ප්‍රශ්නත් එක්ක ගැටෙන්න ඕන කමක් නෑ.ඒ නිසා ඔබ සියලු දෙනා ම හිතාගෙන ඉන්නව නම් එහෙම අයින් කර ගන්න.අපි එහෙම නෑ.අපි මේ සභාවේ වැඩ කටයුතු කරගෙන යමු.අපි හිත් අමනාප කර ගන්න විදිහේ අශෝභන විදිහේ දේවල්වලට යන එක එච්චර හොඳ නෑ කියලා මම හිතන්නේ.ඒ නිසා අපි ප්‍රතිපත්තියක් විදිහට මේ රටේ සියලු දෙනාටම සලකන්නේ එක විදිහට.අපිට ඕනේ මේ රට දියුණු කරන්න.මේ රටේ හැම කෙනෙක් ම දියුණු වෙන්න.ඒකට අපිට පක්ෂ භේදයක් නෑ.ආගම් භේදයක් නෑ.ඒ නිසා ඒ වැරදි තුළ ඉන්න එපා කියන ඉල්ලීම කරමින් කතාව අවසන් කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
උපසභාපතිතුමාට කිවුවෙ ඒක.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

උපසභාපතිතුමාට නෙමේ, අපි කණ්ඩායමක් විදිහට ඉන්න තැන මම කිවුවේ.අපි කරන දේ වටහා ගැනීමේ නොහැකියාවක් තියෙනවද කියන එකයි මට ප්‍රශ්නය තියෙන්නේ.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාරමැතිතුමා:-**
සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා සියලු දෙනාටම.මම පළමුවෙන් ම කතා කිරීමට බලා පොරොත්තු වෙන්නේ, මමයි ජිනේන්ද්‍රනි මන්ත්‍රිතුමියගෙයි, දැන් එක කතාව ඇදී ඇදී ගියා.ඒ වුණත් පොඩි මතක් කිරීමක් කරනවා.අපි දෙන්නා, ජිනේන්ද්‍රනි මන්ත්‍රිතුමියගේ මහත්තයයි මමයි ඔබතුමාට ලිපිය භාර දුන්නේ විදුලි ලාම්පුව සවි කර ගන්න.ඒක ගැන නැවත මතක් කරනවා.

ඒ වගේම අපේ මන්ත්‍රිවරුන්ගේ සාමවිනිසුරු හැඳුණුම්පත් ලබා දීම සම්බන්ධව තාම සභාවෙන් ඒ ගැන, ලේකම්තුමා දැනුවත් වෙලා ඒ කටයුතු ඉක්මන් කරලා දෙන හැටියට ඉල්ලා සිටිනවා.ඒ වගේ ම නාගොඩ ඇළ ව්‍යාපෘතියට ලක්ෂ 20 ක් පාස් වෙලා තියෙනවා.ඒක ක්‍රමානුකූලව වැඩේ සිද්ධ වෙලා නෑ.ඒ පිළිබඳවත් ගරු සභාවේ සභාපතිතුමාගේ අවධානය යොමු කරන්න කියලා මේ අවස්ථාවේදී මං ප්‍රකාශ කරනවා.

ඒ වගේ ම නැවතත් මතක් කරන්නේ සාමවිනිසුරු හැඳුණුම්පත් සම්බන්ධව සභාවේ මැදිහත් වීම කරලා දෙන්න.මේකෙ සාමවිනිසුරුවරුන් කීපදෙනෙක් ඉන්නවා.ඒ වුණාට අලුත් මන්ත්‍රිවරු ගොඩක් දෙනෙකුට සාමවිනිසුරු පත්වීම් නෑ.තමුන්නාන්සේලා සියලු දෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මගේ කතාව අවසන් කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
සමාවෙන්න සාමවිනිසුරු හැඳුනුම්පත නෙමෙයි, සාමවිනිසුරු දිවුරුම්දීම.එහෙම නැත්නම් සීල් එකට දාන්න බෑ.සාමවිනිසුරු, ප්‍රාදේශිය සභා මන්ත්‍රි කියලා දාන්න විදිහක් නෑ දිවුරුම් දුන් නැත්නම්.අන්න ඒ දිවුරුම් දීම සඳහා යොමු කරන්න කියලා තමා කියන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු අපේ මුලාසනයේ වැඩ බලන උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමනි, සියලු දෙනාටම සුභ අලුත් අවුරුද්දක් වෙන්න ඕනේ.මං මුලින්ම අවධානය යොමු කරන්න කැමතියි, අපේ ප්‍රදේශයේ ජනතාවගේ ගැටලු ගැන මම මේ කතා කරන්නේ.දැන් මෙතුමා කිවුවා පාසලක දෙයක් කෙරුණාහම විදුහල්පතිට තමයි ක්‍රෙඩිට් එක යන්නේ කියලා.මං අහගෙන හිටියා හරිද දන්නේ නෑ.නැත්නම් කියයි අර සාවද්‍ය පරාවර්ත වචන භ◌ාවිතා කළේ.මං කියන්නේ ඒ වචනය තේරෙන්න ඕන නිසා මං කියන්නේ,විදුහල්පතිට ක්‍රෙඩිට් එක යන්නේ කියලා කිවුවා එතුමා.ඒ අනුව ක්‍රෙඩිට් එක යනවා වගේ ම තමා, යම්කිසි වැරැද්දක් කළොත් ඒකෙ වගකීම භාර ගන්න ඕනෙත් විදුහල්පතිතුමා.ඒ තර්කය අනුව.ඒ අනුව අපිට දැන් මැසේජ් එකක් ආවා ෆෝන් එකට.ඔයාලගෙ ෆෝන්වලටත් මැසේජ් එකක් ඇවිත් ඇති, උපසභාපතිතුමා මහ ලොකුවට කිවුව◌ා, නෑ අපි කරගෙන යනවා.6 වසරේ මොඩියුලර් එක කරනවා.අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙනස් කරන් නෑ කියලා.හැබැයි ඔබතුමාට දැන් මැසේජ් එක ඇවිල්ලා ඇති ගරු කැබිනට් ප්‍රකාශකතුමා දැන් කියනවා, අන්න අත්හිටවලා.2027 ට යන කන් මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 6 ශ්‍රේණියට අදාළ මොඩියුල් අත්හිටවලා තියෙනවා.හරිද? සංතෝෂයි.සංතෝෂ කතාව නෙවේ.අපි හැම වෙලාවෙම විපක්ෂයක් විදිහට මේ සියලු කණ්ඩායම්වල මතය තමයි,අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය අපි එදා ඉඳන් ම දැක්කා.අපි ආණ්ඩුවල ඉන්නකොට තමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හදන්න පටන් ගත්තේ.හරිද? මේ අනවශ්‍ය මැදිහත් වීම් කරලා මෙතුමා කිවුව වගේ විදුහල්පතිතුමාගේ මැදිහත් වීම ගරු ඇමතිතුමිය, අග්‍රාමාත්‍යතුමිය අධ්‍යාපන ඇමති විදිහට මැදිහත් වෙනවා වගේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට, මං කියන්නේ පෞද්ගලික දේවල් ඇති.එක එක්කෙනාගේ පෞද්ගලික දේවල් ඇති.මෙතන ප්‍රජාතන්ත්‍රවාදය කියන තැනදී, බහුතරයේ කැමැත්ත තමයි ප්‍රජාතන්ත්‍රවාදය වෙන්නේ.ඒ ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක්.එතකොට බහුතරය ශ්‍රී ලංකාව තුළ මේ එක එක ජනවර්ග, විවිධ ආගම් නියෝජනය කරන පුරවැසියෝ මේ LGBTQ.ඒ සමලිංගික කියන කාරණාව ප්‍රවර්ධනය කරනවා.එතකොට මේ 6 වසර මොඩියුල් තුළ අපි පැහැදිලිව දැක්කා යම්කිසි link එකක්, සබැඳියක් දාල තිබ්බා ඒ ඒ වෙබ් සයිඩ්වලට, ඒ ඒ වෙබ් අඩවිවලට සම්බන්ධ.මම ඒක පෞද්ගලිකව ගිහිල්ලා ඒක පරිශීලනය කළා.එතන කාරණා දෙකක් තියෙනවා.එකක් තමා සෝෂල් මීඩියා ඇප් එකක් තියෙනවා.ඒ යටින් ගහපු වෙබ් සයිඩ් එකකුත් තියෙනවා.ඒ අදාළ කාරණාවන් ප්‍රවර්ධනය කරන.අන්න ඒ වෙනුවෙන් තමා අපි විපක්ෂය හඬ නැගුවේ හැමවෙලාවෙම.මෙන්න මේ කාරණාව වැරදියි.මෙන්න මේවා ඉවත් කරන්න කියලා.ඒ අනුව 6 වසර මොඩියුල් එක ආපහු ගෙනැල්ලා අධ්‍යාපන අමාත්‍යාංශයට, තවත් බර පැනක් දරලා ඒ පිටුව ඉරා දාලා.(සෝෂාව) නැනේ මන්ත්‍රිතුමා.කොට්ඨාශයට අදාළ ජනතාව ඉන්නවනේ.ජනතාවට අදාළ ප්‍රශ්න තමා මං මෙතන ඇවිත් කතා කරන්නේ.පොඩ්ඩක් ඉඩ දෙන්නකෝ.පොඩ්ඩක් ඉන්නකෝ.මිනිස්සුන්ගේ ප්‍රශ්න ටික කතා කරන්න.(සෝෂාව) සභාපතිතුමා වාඩි කරවන්නකෝ.ඔබතුමාලට අවස්ථාව හම්බුණාම ඒ ගැන කතා කරන්න.කේන්ති යනවනේ.(සෝෂාව)අන්න නදුන් මන්ත්‍රිතුමා තේරුම් ගත්තා.අපිට සම්බන්ධීකරණයට ගිහිල්ලා කතා කරන්න අවස්ථාව නැති කරලා තියෙනවා.අපේ ආණ්ඩු කාලේ සම්බන්ධිකරණ රැස්වීම්වලට පක්ෂ විපක්ෂ ඕන කෙනෙකුට එතනට ඇවිල්ල වාඩි වෙලා තමන්ගේ අදහස් ජනතාවගේ අදහස් දක්වන්න අවස්ථාව දීලා තිබුණා.දැන් මේ ආණ්ඩුව ආවට පස්සේ සම්බන්ධිකරණය මාස තුනකට සැරයක්, අපේ විපක්ෂය කණ්ඩායම නියෝජනය කරන දෙන්නේකුට විතරක් තමයි අවස්ථාව හම්බෙලා තියෙන්නේ.මොනවද? ඒකද ප්‍රජාතන්ත්‍රවාදය ඔයාලගේ.ඔයාලගේ සිස්ටම් චේන්ජ් එක ඒකද? මිනිස්සු බලාපොරොත්තු වුණේ මේ ආණ්ඩුව ආවහම තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් වැඩි වෙලා තව තවත් මිනිසුන්ගේ ප්‍රශ්න කතා කරන්න ඒ අවස්ථාවක් දෙයි කියලා.දුන්නද? නැනේ.ඔබතුමන්ලා අපේ කටවල් වහන්න එපා ප්‍රශ්නයක් ගැන කතා කරනකොට.මේවා මිනිසුන්ට තියෙන ප්‍රශ්න.මේවා පාර්ලිමේන්තුවට ලඟු කර ගන්න එපා.ඔබතුමත් මන්ත්‍රි කෙනෙක්නේ.මං ඒකයි ඉස්සෙල්ලත් කිවුවේ.ඔබතුමත් මන්ත්‍රි කෙනෙක්නේ.(සෝෂාව)සමහර වෙල◌ාවට මං කියන්නේ මෙතුමත් මන්ත්‍රි කෙනෙක්.මෙතුමට සමහර වෙලාවට.තාම අත්දැකීම් නැතුව ඇති.මන්ත්‍රි වෙලා තව මාස 6 නේ.තවම අත් දැකීම් නැතුව ඇති.එතකොට අත්දැකීම් එනකොට ප්‍රශන දිගින් දිගට එනකොට සමහර වෙලාවට ඔබතුමාට තේරෙයි, මේ ප්‍රශ්න ප්‍රාදේශිය සභාව තුළ කතා කරන්න වෙනවා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න.හරිද?දැන් අපි එකඟතාවයකට ආව ඒව

දාන්න.අපේ යෝජනා ටික දාන්න එකඟතාවයකට ආවා.ඒ අනුව මට කතා වෙනවා ඇහුණා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
රීති අනුව තමයි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ආ.රීති අනුව තියෙනවද?එතකොට ඔබතුමා රීති හරියට පරිශීලනය කරලා නෑ මෙච්චර කාලෙකට.නැත්නම් අර ජිනේන්ද්‍රනි මන්ත්‍රීතුමීගේ යෝජනාව ප්‍රතික්ෂේප වෙලා තියෙනවනේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මොකක්ද යෝජනාව

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
යෝජනාව සභාවට අදාළ නෑ කියලා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒක ගියපාර දාල තිබුණා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
රංජිත් මන්ත්‍රීතුමාගේ යෝජනාව.අපි ඒක ගැන දිගින් දිගටම කතා කළොත් ඔබතුමා පරාදයි.ආයෙත් ඒ ගැන කතා කරන්න ඕන් නැනේ.ඒක පොඩ්ඩක් පිළි ගන්න ඕනේ.මං කියන්නේ නිහතමානී වෙන්න ඕනේ.(ඝෝෂාව) අපි දැන් දිගින් දිගටම කිවුවා හිදුරංගල මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවත් අපි පරාද කරන්න හේතු වුණේ ඒකනේ.නැත්නම් ඒ යෝජනාවට අකමැතිකම නෙමේනේ.ඒක හින්දා සභාවට අදාළ කර ගන්න පුළුවන් ඕන එකක්.මිනිස්සුන්ට කතා කරන්න අවස්ථාව දෙන්න.මං කියන්නේ කවුරු ආණ්ඩුවට ආවත් ඒ ප්‍රජාතන්ත්‍රවාදී අවස්ථා අහිමි කරන්න එපා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ප්‍රජාතන්ත්‍රවාදී අවස්ථා අහිමි කරලා නැනේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
නැත්තෙ මොකද?අපි දාන යෝජනාවක් න්‍යාය පත්‍රයට ඇතුළත් කරන් නෑ කියන එකම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකමක් අහිමි කිරීමක් තමයි.රීති ගැන විවාදයක් කරමු.අපි කැමතියි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
පුහුණු සැලැස්මෙත් ඇතුළත් කරලා තියෙනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒ අනුව එතකොට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2027 වෙනකන් කල් දාල තියෙනවා.අපි දැන් සභාව පැත්තට ගත්තොත් එහෙම සභාවක් විදිහට 2026 වර්ෂය යම්කිසි තීරණාත්මක අවස්ථාවක් එනවා ආදායම් එකතු කිරීම සම්බන්ධව.දැන් අපි ආරම්භ කරලා තියෙනවා.අවංකවම අපිට උවමනාව තියෙන්නේ මේ සභාව නැගිට්ටවන්න.අපිට දැන් තාම පේන්නෙ නෑ තාම මේ ආදායම් වර්ධනය කෙරෙහි අවධානය කොච්චර දුරට යොමු වෙලා තියෙනවද කියලා.අපි දකුණේ ආණ්ඩුව ඉන්නකොට ආදායම් උත්පාදන මාර්ග අපි යෝජනා විදිහට ගෙනාවා.මං දකින්නෑ මේ පැත්තෙ මන්ත්‍රීවරු ආදායම් උත්පාදන මාර්ග වෙනුවෙන් ගෙනා යෝජනා මොනවද කියලා.පාරවල් හදන එක හරි.හැබැයි මේ සභාවට ආදායම් එකතු කර ගන්න යෝජනා ගෙන ඒමේ වැඩිපුර වගකීම තියෙන්නේ මේ පාර්ශවවලට.කමක්නෑ ඒවත් යෝජනා විසි කරනවද දන්නෙ නෑ, සභාවට අදාළ නෑ කියලා.මං කියන්නේ අපි ගියවර ප්‍රකාශ කළා යම්කිසි ප්‍රාග්ධන ව්‍යාපෘතියක්. ණයක් හරි අරගෙන ගලි ප්ලාන්ට් එකක් හදන එක.අපි මැදිහත් වෙලා අපේ ගම්වලට කරන්න තියෙන ප්‍රතිපාදන ඔක්කොම දාලා තමා ආදාහනාගාරය හැදුවේ.ඒකෙන් යම්කිසි ආදායමක් හම්බෙනවා.සේවයක් වගේ ම ප්‍රතිලාභය කියන එක මෙතනදී, ආදායමක් විදිහටත් ජනතාවට සේවයක් විදිහටත් අපිට ගණනය කරන්න පුළුවන්.කෙසේ වෙතත් මේ වර්ෂයේදීකෙසේ වෙතත් මේ වර්ෂයේ දී සේවක වැටුප් සම්පූර්ණ ප්‍රතිපූර්ණය කරන්නෙ නෑ.යම්කිසි කොටසක් ප්‍රතිපූර්ණය කරන් නෑ.එතකොට ඒ වෙනුවෙන් ආදායම් උත්පාදනය කරන්න.ඒ වෙනුවෙන් ප්‍රගතිය මොකක්ද කියලා අපිට ලබන සභා වාරයේදීවත් කියන්න, මෙන්න මේ අනුව තමයි අපේ සැලැස්ම හදලා තියෙන්නේ කියලා.අපිට අර සැලැස්ම තුළ පැහැදිලිතාවයක් නෑ.වැඩිපුර කතා කරන්න යන්නේ.ආණ්ඩු පක්ෂයේ ගොඩක් දෙනෙක් ඉවත්ව ගිහිල්ලා තියෙනවා.ඊට පස්සේ සමූකාර මැතිවරණය වෙනවා.පළාත් සභා මැතිවරණය වගේ ඒවත් කල් දායිද දන්නේ නෑ.මාර්තු ජූනි වගේ වෙනකොට පළාත් සභා මැතිවරණය තියෙනවා කියලා කිවුවා.හැබැයි ඒවත් නෑ.හැබැයි මේ ආණ්ඩුව ආවේ ඡන්ද කල් දාන්නේ නෑ කියලා.හැබැයි දැන් දිගින් දිගට කල් දාන ස්වභාවයක් තමා තියෙන්නේ.මේක අඩු ගාණේ අපේ යෝජනාවක් විදිහටවත් දාන්න.ජනතාවගේ යෝජනාවක් විදිහටවත් දාන්න.මැතිවරණය සඳහා සිතියමක් හදන්න, මේ අවුරුද්දෙවත්.පළාත් සභා මැතිවරණය මෙන්න මෙදාට තමා තියෙන්නේ.ආයෙ ඊළඟ මහ මැතිවරණය මෙන්න මෙදාට තමා තියෙන්නේ, කියලා මැතිවරණය සඳහා සිතියමක්.ඡන්ද තියන්න බයේ හරි යන්නේ නෑ.ජනතාවගේ ජන මතය, සමූපකාර ඡන්දයෙන් නියෝජනය වෙයිනේ.එක්කෝ පළාත් සභා ඡන්දය තිබ්බොත් ඒකෙන් නියෝජනය වෙයි.ඒ අනුව මට නම් පේන්නේ මේ ආණ්ඩුව ජන මතය පිළිබඳව දැඩි අසීරුතාවයකට පත් වෙයි.ඒ බව මතක් කරමින් සියලු දෙනාටම සුභ ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේ ම මේ අමිල් මන්ත්‍රීතුමා කියනවා සල්ලි නැතිලු.නෑ නෑ බිලියන් 11 ක් අය වැයෙන් වෙන් කරලා තියෙන්නේ.පළාත් සභා මැතිවරණයට.හැබැයි කැබරථ ටික ගේන්න දෙයියනේ කියලා සල්ලි වෙන් කරලා තියෙනවා.හැබැයි අර ඇමතියයි මේ ඇමතියයි පස්ස තියපු ඒවට තියන්න බැරි ආණ්ඩුවක් තමයි දැන් ආයෙත්

ලැබිලා තියෙන්නේ අපිට.මන්ත්‍රී වැටුප ගැන ප්‍රශ්නයක් ඇහුවා පාර්ලිමේන්තුවේ, ඒ පිළිබඳ උත්තරයකුත් නෑ.ඔය කියපු ඒවා නෙමේ නේ කෙරෙන්නේ.ජනතාව ගොඩක් කලකිරීමෙන් ඉන්නේ කියන එක ම මේ වෙලාවේදී මතක් කරන්න කැමතියි.(ඝෝෂාව)

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු උපසභාපතිතුමනි, මගෙ මේ සාමවිනිසුරු දිවුරුම් දෙන එකට, ලේකම් මහත්මයා කියපු එකට දිසා අධිකරණයට සභාපතිතුමාගේ අත්සන ඇතුව ලියුමක් යවලා, සභාවේ මන්ත්‍රීවරුන්ට දිවුරුම් දීමට අවස්ථාව දෙන්න කියලා.එතකොට අවශ්‍ය දිනේ වෙන් කරලා දෙනවා.

සභාව (ඝෝෂාව)

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි, විශේෂ කාරණා කීපයක් කතා කරන්න තියෙනවා.පසුගිය 11 වෙනි මාසේ ගංවතුර ආපදා තත්ත්වයේදී වසම් දෙකකට හානි වුණා.නාය යෑමක් හා ගංවතුරවලින්.ගෙවල් 136 ක් ගවතුරෙන් යට වුණා.ගෙවල් 11 නාය යෑම් අවධානම් තත්ත්වයට පත් වුණා.සුමිත් මන්ත්‍රී,අජන්ත මන්ත්‍රීතුමා, නෙල්සන් මන්ත්‍රීතුමා, ලසිත මන්ත්‍රීතුමා, මාලින්ද මන්ත්‍රීතුමා උදව් කරන්න ආවා.ඒවගේ ම මහන සෞඛ්‍ය පරීක්ෂකවරු සහ ග්‍රාමනිලධාරීවරු සියලු දෙනාම, ඇතුළු රාජ්‍ය නිලධාරීන් විශාල කැපවීමක් කළා. ඒ අයගේ ජීවන තත්ත්වය නගා සිටුවන්න හා යථා තත්ත්වයට පත් කරන්න.ඒ වගේ ම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් විශේෂ වෛද්‍ය සායනයක් විශේෂඥ වෛද්‍යවරු එකතු කරගෙන පැවැත් වුවා.ඒ අයට ස්තුතිවන්ත වෙන්න ඕන මේ අවස්ථාවේදී.ඒ වසම් දෙකේ ජන ජීවිතය නගා සිටුවන්න කැපවුණාට.ඒ වගේ ම ජනවාරි පළවෙනිදා අපි පොඩි තේ පැන් සග්‍රහයක් පැවැත්වූවා.ඒකට අපි මන්ත්‍රීවරු කීපදෙනෙක් ම සහභාගී වුණා. විශේෂයෙන් ම ඒ ගැන කතා කරන්න ඕනේ පොඩ්ඩක්.

**සභික ජී.ඩී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු උපසභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තියෙනවා.මේ වෙලාවේ සභාව කර ගෙන යන්න ගණ පූර්ණය නෑ.

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
එහෙනම් කියන්න තියෙන ඒවා ඊළඟ පාර කියනවා.නැගිටිනකොට මොකක් හරි කේස් එකක් දානවා.

**සභික ජී.ඩී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
රීති ප්‍රශ්නයක් තියෙන්නේ.ලේකම්තුමා ඒක නිවරදි කරන්න.

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ඇත්ත ඇත්ත මාත් අකමැතියි කතා කරන්න.කට්ටිය නෑනේ අහන් ඉන්න.

**සභික ජී.ඩී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
නෑ.ගණ පූර්ණය නෑ.රීති ප්‍රශ්නයක්.සභාපතිතුමා, ගණ පූර්ණය නැති වුණා ම සභාව කල් දාන්න වෙනවා.මං මේ විහිළුවට නෙමේ කියන්නේ.විහිළුවට ගන්න එපා.

**සභික ඩබ්ලිව්.ඒ.අමිල් නිමේෂ මැතිතුමා:-**
සභා රීති අනුව ගණ පූර්ණය නැත්නම්, සීනුව නාද කරන්න ඕනේ.

**සභික ජී.ඩී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ඔව්.උපසභාපතිතුමා ඒක කරන්න.රීති ප්‍රශ්නයක් අපි යොමු කළා ම, සීනුව නාද කරලා ඒකට පෙනී ඉන්න ඕනෙ.ඒක තමා පනතේ තියෙන්නේ.ඔබතුමා සීනුව නාද කරන්න.අන්න හරි.

**උපසභාපතිතුමා මහේෂ් රත්නායක මැතිතුමා.**
2026 වර්ෂය සඳහා පළමු සභාවාරය අද දින පවත්වන්ට යෙදුණේ.ඒ අනුව අද දිනට සභාවේ වැඩ කටයුතු මෙතනින් නිමාවට පත් කරනවා.ඔබ සියලු දෙනාට සුබ සැන්දෑවක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා.දැන් වේලාව ප.ව 3.25 යි.

බන්ධුලසේන දූණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ක් වූ..................................මස...........දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.